ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 නොවැම්බර් 09 වන බදාදා
දෙවන කාණ්ඩය හතලිස් නවවන කලාපය
මිල රු. 80 යි




විශේෂ ස්වයං රැකියා අතිරේකයක් නොමිලේ



## හොඳ නෝනා කෙනෙක්ට හොඳ නෑනා කෙනෙක් වෙන්නත් පුළුවන්

## නාකි ගෑනුන්ට විසේ හැදුනම නරකද

## මහත්තයට ඉර හඳ ගෙනත් දෙන්න පුළුවන් වුණත් ඔයා රස්සාවක් කරන්න

## එයා දවසක ලෝකයේ හොඳම පන්දු රකින්නා වෙනවා දකින්න මම ආසයි

අශේන් බණ්ඩාරගේ මව අරුණි රේණුකා

ඡායාරූප
ප්‍රදීප් දඹරගේ

සාරි නිර්මාණය
ලියාරා සාරි

හැඩගැන්වීම
සැලෝන් ශාමි, මාතලේ

# ඔසරියට හැඩ මනාලියක්



අද දින 'ධරණී මනාලිය' හැඩගැන්වූයේ ජාඇල බෝපිටියේ විජිතා බියුටි සෙන්ටර්හි රූපලාවණ්‍ය ශිල්පිනී විජිතා ජයමාන්න විසිනි.

"තාරා කළුආරච්චි නිරූපිකාව අද දින මා හැඩගැන්වූයේ උඩරට මනාලියක් ලෙසින්.

සම්ප්‍රදායික ආභරණ කට්ටලයකින් අඩක් පමණ තෝරාගත්තේ ඇගේ ඔසරියේ මනා ලෙස stones තිබෙන නිසාවෙන්. හිසට සරලව පිච්ච මල් යොදාගෙන තියෙනවා. මල් කළඹ පෝසි (රවුම් හැඩති) ආකාරයට රතු රෝසමල් යොදා සකස් කරලා තියෙනවා.

ඒ වගේම ඇගේ උසත් ඔසරියට මනාව ගැලපිලා තියෙනවා."

හැඩගැන්වීම
**විජිතා ජයමාන්න**
(විජිතා බියුටි සෙන්ටර්, බෝපිටිය - ජාඇල)
ඡායාරූප
**ශ්‍රීලාල් අධිකාරි**
ඔසරිය නිර්මාණය
**අතුරුගිරියේ නිරෝ ෆැෂන්**
සම්බන්ධීකරණය
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**



# මං ගොඩක් ආසයි මාමේ ඉස්කෝලේ යන්න

# පුළුවන්නම් මාව ආයේ ඉස්කෝලේ යවන්න

## විසිනව වතාවක් සොරකමේ ගිය දස හැවිරිදි යෙනුක





පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රත්නායක



පොලිස් පරීක්ෂක රංජිත් ප්‍රේමසිරි



උපපොලිස් පරීක්ෂිකා උත්පලා රූපසිංහ

"මං ගොඩක් ආසයි මාමේ ඉස්කෝලේ යන්න. පුළුවන්නම් මාව ආයේ ඉස්කෝලේ යවන්න."

ඒ දස හැවිරිදි යෙනුක ජාඇල පොලිසියේදී කළ ඉල්ලීමය. මේ පුංචි කොලු පැටියා පසුගියදා පොලිස් භාරයට පත්වූයේ මාළු මුදලාලි කෙනෙකුගේ මුදල් පසුම්බියක් සොරකම්කොට හසුවීය.

යෙනුකගේ පදිංචිය ජාඇල ඒකලයි. අම්මාත් තාත්තාත් අතර විරසකකම් මතුවෙන්නට පෙර මේ පුංචි පුතා ගැන සොයා බලන්නට ඔවුනට කාලය තිබුණි. පුංචි එකා පාසල නිමවී ගෙට දිව එන්නේ කුසගින්නෙනි. අගහිඟකම් තිබුණත් ඔහුට අම්මා ගෙදර සිටියදී බත්පත වැරදුණේ නැත. එහෙත් මීට ටික කලකට ඉහතදී ඒ අම්මා ගෙදරින් ගොස් තිබුණේ, අලුත් පෙමක් සොයාගෙනය.

මේ පලහිලව් මැද තාත්තාටද පුංචි යෙනුක මගහැරෙන්නට වුවේය. ඔහු දිනපතා ගෙදරට මුදලක් රැගෙන ආවේ එදාට හමුවන කුමන හෝ කුලියක් කරය. උදේට බතක් එළවලුවක් හෝ සම්බෝලයක් හදා යෙනුකට කෑමට දුන්නද ඉන් එහාට දරුවාගේ ඇඳුමක් පැළඳුමක් හෝ පොතපතක් ගැන බලන්නට මේ තාත්තාට කාලයක් තිබුණේ නැත.

පුංචි යෙනුක ඉගෙනීමට තිබූ දස්කම් අඩුවී ගියේ බලාසිටියදී වාගේය. ඔහු පාසලේ හතරේ පන්තියට සමත් වුවද ඉන්පසු පාසල් ගියේ ඉඳහිටයි. පසුව එය මුළුමනින්ම වාගේ ඇන හිටියේය. මේ නිසා යෙනුකව තාත්තා පිරිවෙනකටද බාර දුන්නේය.

එහෙත් පුංචි එකාට ඒ ජීවිතයට හුරුවෙන්නට හැකිවූයේ නැත. ඔහුට ඕනෑ ලෙස දඟ කරන්නටද එහි අවසර නොවූයෙන් ආයේ ගෙදර ආවේය. ඉන් තත්ත්වය තවත් නරක අතට හැරුණේය. තාත්තා ඇතැම් දිනවලට පොඩි එකා අත මුදලක් තැබුවේ කඩෙන් කන ලෙස කියායි.

අවසානයේ ඔහුව ජාඇල පොලිසියට රැගෙන ආවේ අර මුලින් කී මාළු මුදලාලිගේ නැතිවූ මුදල් සොරකමේ පැමිණිල්ල නිසාය. ඒ ජාඇල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රත්නායක මහතාගේ උපදෙස් පරිදි පොලිස් පරීක්ෂක රංජිත් ප්‍රේමසිරි මහතාගේ මෙහෙයවීමෙනි.

**මේ දරුවා ඉගෙනීමට දක්ෂයි. දෙමාපියන්ගේ සොයාබැලීම් නැති නිසයි දරුවා මේ තත්ත්වයට පත්වුණේ**

**"මාළු වෙළඳම් කරන පුද්ගලයෙක් ඔහුගේ රුපියල් නවදහස් හත්සියයක මුදලක් නැතිවුණ බවත්, එය සොරකම් කළේ අදළ දරුවා බවත් අපට පැමිණිල්ලක් ලැබුණා. ඒ වෙලාවේ අපි මේ දරුවව අපේ භාරයට ගත්තා. එයා වයස දහයට අඩු දරුවෙක් නිසා අත්අඩංගුවට පත්වීමක් නෙවෙයි වුණේ. භාරයට ගැනීමකුයි. එහිදී අපි දරුවාගෙන් බොහොම කාරුණිකව කරුණු විමසුවා. දරුවා සොරකම් කළා කිව්ව රුපියල් නවදහස් හත්සියයක මුදලත් ඔහු සන්තකයේ තිබුණා. අපි එය අයිතිකරුට බාරදෙන්න පියවර ගත්තා වගේම, දරුවා කළ තවත් එවැනි සොරකම් විසිනවයක් ගැන තොරතුරු දැනගන්න ලැබුණා."**

ඒ ජාඇල පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි උපපොලිස් පරීක්ෂිකා උත්පලා රූපසිංහ මහත්මියයි.

පොලිසියේ කාරුණික ප්‍රශ්න කිරීම් හමුවේ යෙනුක කී කතාවට, පොලිසියේ ඇත්තන්ගේද හදවත් උණුවන්නට වැඩි වේලාවක් ගියේ නැත. රුපියල් දෙතුන් සීයේ සිට, රුපියල් පන්සියය, දහස දක්වා වූ සොරකම් තමා විසින් කළ හැටිත්, එසේ කළ මුදල්වලින් වැඩිපුරම කළ දේවලුත් යෙනුක පොලිසියේදී කීවේය. මුදල්වලට අමතරව ප්‍රදේශයේ ඇතැම් නිවාසවලට ඇතුළු වී ජංගම දුරකතන, ත්‍රිරෝද රථවල අමතර කොටස් වැනි දෑ සොරාගෙන, ඒවා ප්‍රදේශයේම ඇතැම් වැඩිහිටි පුද්ගලයන්ට විකුණා තිබුණේ නොවටිනා ගණන්වලටය. ඒවායේ වටිනාකම් කියන්නටද පුංචි එකාට අවබෝධයක් නොවිනි. ඒවා කොහෙන් ලැබුණේදැයි අසන්නට කෙනෙක් නොවූයෙන් ඔහු කරගෙන ආ සොරකම් යළි යළිත් කළේය. මාළු මුදලාලිගේ මුදල් නැති වූ බවට පැමිණිල්ලක් නොලැබුණේනම් ඔහුගේ අනාගත ඉරණම බෙහෝ සෙයින් වෙනස් වන්නට ඉඩ තිබුණි.

## විසිනව වතාවක් සොරකම් කළත්, ඒ හිතකින් නොවෙයි

**"සල්ලි හම්බුණාහම මායි මගේ යාළුවොයි හොඳට කෑම කෑවා. බීම බිව්වා. තව ගමේ ආච්චිලා, නැන්දලා පස්සේ දෙන්නම් කියලා මගෙන් ණයට සල්ලි ඉල්ලගෙන තියෙනවා."**

පුංචි යෙනුක ගිරා පැටියෙකු සේ තමා කළ සොරකම් ගැනත්, ඒ මුදල්වලට කළ කී දෑ ගැනත් කීවේ එහෙමය. ඇතැම් සොරකම් කරන්නට ගොස් ඇතැමුන්ගෙන් තරවටු විඳින්නට සිදුවූ බවද යෙනුක කීවේය. ඇතැම්විට සොරකම් කළ මුදල් ආපසු දෙන්නට සිදුවූ අතර, ඒ කිසිවකු පුතුගේ ක්‍රියාකලාපය ගැන පියාට පැමිණිලි කර තිබූ බවක් දැනගන්නට නොතිබුණි. ඒ වාගේම මාළු මුදලාලිගේ පැමිණිල්ල ලැබෙනතුරු යෙනුක ගැන පොලිසියට ද පැමිණිල්ලක් ලැබුණේ නැත.

**"එතකොට දැන් ඔයා ඉස්කෝලේ යන්න කැමතිද පුතේ?"**

**"ඔව්... මං ගොඩක්ම කැමතියි. මම** පාඩම් **වැඩ කරන්නත් කැමතියි... මට ආයේ ඉස්කෝලේ යන්න විදියක් හදලා දෙන්න."**

ඒ යෙනුක පොලිසියේ නැන්දලා මාමලාගේ ආදරය හමුවේ කළ ඉල්ලීමය. යෙනුකගේ තාත්තාවද පොලිසියට කැඳවා පුතුගේ ඉගෙනුම් ආසාව ගැනත් අනෙකුත් ක්‍රියා කලාපය ගැනත් පැහැදිලි කළද ඔහුට දරුවාගේ වගකීම බාරගන්නට බැරි බව කීවේය.

**"මං දවල් දවසට ගෙදර නෑ. කුලී වැඩක් කළොත් තමයි මට කීයක්හරි හොයාගන්න පුළුවන්. මෙයාව පිරිවෙනක නතර කළෙත් උගන්නන්න හිතාගෙන. එතනත් හිටියේ නෑ. දවල් දවසට මෙයා යාළුවෝ එක්ක මොනවා කරනවද කියලා මං දන්නේ නෑ."**

අගහිඟකම් හෝ දෙමාපියන්ගේ කවර ප්‍රශ්නයක් හමුවේ වුව යෙනුක වැනි සුරතල් වයසේ දරුවෙකු ජීවිතයේ අතරමං කර දැමීම කිසි ලෙසකින් හෝ නොවිය යුත්තක් නොවේද? යෙනුකටත්, අම්මාගේ තාත්තගේ රැකවරණය ආදරය නිසි ලෙස ලැබුණානම් විසිනව වතාවක් කරන්නට සිතුණ දේට ඒ පුංචි සිත කිසිසේත් නොයෙදෙන්නට ඉඩ තිබුණි.

**"ඇත්තටම ඒ දරුවා හරි බුද්ධිමත් දක්ෂ දරුවෙක් කියලා බැලූ බැල්මට පේනවා. එයා ඉගෙනගන්න උනන්දු නිසාම ඒ අවශ්‍ය උසාවි කටයුතු මේ වෙනකොට අපි සිදු කෙරෙමින් පවතිනවා."**

ඒ උපපොලිස් පරීක්ෂක උත්පලා රූපසිංහයි.

මේ වනවිට යෙනුක ළමා නිවාසයක නතරකොට ඇති අතර, පරිවාස වාර්තාවක් ලබාගෙන ඔහු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඔහුගේ අනාගතය වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනෙනු ඇත.

මල් වයසේ මලක් වන් සිතකට මෙවන් කටුක අත්දැකීමක් නොලබන්නට නම් දෙමාපිය ඔබේ ආදරය, රැකවරණය නිසි ලෙස දරුවාට ලබාදීම යුතුකමක් මෙන්ම වගකීමක් බවද සිහිකළ යුතුය.

(දරුවාගේ නම මනඃකල්පිතයි)

**දීපා වසන්ති එදිරිසිංහ**

# එයා දවසක ලෝකයේ හොඳම පන්දු රකින්නා වෙනවා දකින්න මම ආසයි



**අශේන් බණ්ඩාරගේ මව**
**අරුණී රේණුකා**



**පසුගිය ආසියා කුසලානයේදී කිසිඳු තරඟයක් ක්‍රීඩා නොකළද අවසන් මහා තරඟයේදී අතිරේක ක්‍රීඩකයෙකු ලෙස පිටියට පැමිණ ඔහු රැකගත් අතිවිශිෂ්ට උඩපන්දුව අදටත් අපිට අමතක නැත. එදා ඒ උඩපන්දුව රැකගනිමින් ඔහු නැවතුණේ අවසන් තරඟයේ හොඳම පන්දු රකින්නා ලෙසද සම්මාන ලබාගනිමිනි. ඒ දක්ෂතාවය නිසාම මේ වනවිට ඔස්ට්‍රේලියාවේ පැවැත්වෙමින් තිබෙන විස්සයි විස්ස ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියේ ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කිරීමට මේ ක්‍රීඩකයා සමත්ව තිබේ. පසුගිය ඔස්ට්‍රේලියා - ශ්‍රී ලංකා තරඟයේදී ප්‍රහාරාත්මක පිතිකරු ග්ලේන් මැක්ස්වෙල්ගේ පිත්තෙන් හයේ සීමාව කරා යන ඇදී ගිය පන්දුවක් ඔහු රැකගත්තේ තමන් ලෝකයේ විශිෂ්ටතම පන්දු රකින්නෙකු බව යළි යළිත් ඔප්පු කරමිනි. ඔහු වෙන කවුරුත් නොව අශේන් බණ්ඩාර ය. මෙවර ලෝක කුසලාන තරඟබිමේ පිතිකරුවන්ට තර්ජනයක් වෙන මෙකී සුපිරි ක්‍රීඩකයා ගැන මේ කතාබහ ඔහුගේ ආදරණීය මව වන අරුණී රේණුකා සමඟිනි.**

**මේ අශේන් බණ්ඩාර ගැන රටම කතා කරන වෙලාවක්. පුතා ගැන අම්මට මොකද හිතෙන්නේ?**

පුතා ගැන සතුටුයි කියලා තමයි කියන්න තියෙන්නේ. ඇත්තටම එයා මෙතැනට එන්න ගොඩාක් කැපකිරීම් කළා. ඒ කැපකිරීම්වල ප්‍රතිඵල තමයි මුළු රටම මේ දකින්නේ. අශේන්ගේ පුහුණුකරු නිතරම කිව්වා පුතා ක්‍රිකට්වලින් ඉහළටම එනවා කියලා. අපිත් එහෙම හිතුවා. පුතා නිතරම කියන්නේ එයාට ලෝකේ හොඳම පන්දු රකින්නා වෙන්න ඕන කියලා. මං හිතනවා එයා එතැනට එයි කියලා.

**පුංචි කාලේ ඉඳන්ම අශේන්ට තිබුණේ එසේ මෙසේ ක්‍රිකට් උණක් එහෙම නෙවෙයි කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) අම්මේහ් ඒක නම් ඇත්ත. මට මතක විදියට එයා වයස අවුරුදු තුනක් වෙනකොට බැට් බෝල ඉල්ලුවා. ඒ දවස්වලනම් නිදාගන්න ඇඳට යන්නෙත් බැට් එකයි බෝලෙයි අරන්. අනික ගෙදරට කවුරු ආවත් ඒ එන කෙනාට ක්‍රිකට් ගහන්න කතා කරනවා. ඒ වෙලාවට ඉතින් කවුරු වුණත් බෝල් දන්න ඕන පුතාට ගහන්න. සමහර දවස්වලට නෑදෑයන්ට එහෙමත් කෝල් කරලා ක්‍රිකට් ගහන්න එන්න කියනවා.

**එච්චර ක්‍රිකට් ගැන උනන්දුවක් තිබුණු පුතා ක්‍රිකට්වලට ආවේ කොතැනින්ද?**

අපි ගාල්ලේ ඇල්පිටියේ. පුතා මුලින්ම ඉස්කෝලේ ගියේ සුමංගලෝදයට. එතැනින් පස්සේ ගාල්ල ඇලෝසියස් විද්‍යාලයට ගියා. ඔය අතරේ පුතා ක්‍රිකට්වලට තිබුණු උනන්දුව එක්ක ගාල්ලේ ක්‍රිකට් ඇකඩමියකට සම්බන්ධ වුණා. ඒ හරහා තමයි ක්‍රිකට්වලට ආවේ. ඊටපස්සේ පාසලේදිත් ක්‍රිකට් ක්‍රීඩා කළා. ඔය විදියට ඇවිත් තමයි ජාතික කණ්ඩායමට එකතුවෙන්න ලැබුණේ.

**පුතා ජාතික කණ්ඩායමට තේරෙද්දි අම්මට මොකද හිතුණේ?**

පුතාව මුලින්ම ජාතික කණ්ඩායමට තේරුණා කියන ආරංචිය එද්දි හිතාගන්න බැරිවුණා. එයාගේ උනන්දුවයි, කැපවීමයි පුහුණුකරුවන්ගේ හරි මඟපෙන්වීමයි නිසා තමයි මෙච්චර පොඩි වයසකදි අශේන්ට ශ්‍රී ලංකා කණ්ඩායමට එන්න ලැබුණේ.

**පසුගිය ආසියානු කුසලානයේ අවසාන තරඟයේදී අශේන් හොඳම පන්දු රකින්නා වුණා නේද?**

ඔව් ඔව්. එදා අශේන් අතිරේක ක්‍රීඩකයෙක් විදියට හිටපු නිසා ක්‍රීඩා කරයි කියලා නම් හිතුවේ නෑ. ඒත් එයාට එදා පන්දු රකින්නෙක් විදියට හරි ක්‍රීඩා කරන්න ලැබුණු අවස්ථාව ගැන අපි ගොඩාක් සතුටුවුණා. ඉතින් පුතා ඒ තරඟයේදී විශිෂ්ට උඩපන්දුවක් රැකගත්තා. ඒ නිසා තමයි එයාට එදා තරඟයේ හොඳම පන්දු රකින්නා වෙන්න හැකියාව ලැබුණේ.

**නංගිලා තුන්දෙනාට පුතා හරිම ආදරෙයි. කොච්චර ආදරේද කිව්වොත් එයාලා ඉල්ලන්නේ මොනවද ඒ ඉල්ලන පමාවෙන් අරගෙන දෙනවා**



**මට මතකයි පොඩි කාලේ අශේන් පුතා සමහර වෙලාවට ජොන්ටි රෝඩ්ස් පන්දු රකින විදියට අපිට රඟපාලත් පෙන්නනවා**

**අපි දැක්කා මෙවර විස්සයි විස්ස ලෝක කුසලානයේදිත් අශේන් විශිෂ්ට උඩපන්දු කීපයක් රැකගන්නවා. අශේන් මෙතරම් විශිෂ්ට පන්දු රකින්නෙක් වීම පිටුපස මොකක් හරි කතාවක් ඇති?**

අශේන් හරි ආස ක්‍රීඩකයෙක් තමයි දකුණු අප්‍රිකාවේ හිටපු ජොන්ටි රෝඩ්ස්. එයා ක්‍රිකට් පිටියේ අදටත් කතාකරන අතිවිශිෂ්ට පන්දු රකින්නෙක්. අශේන්ටත් ඕන ජොන්ටි රෝඩ්ස් වගේ වෙන්න. ඒක තමයි එදා ඉඳන්ම එයාගේ හීනය වුණේ.

**ජොන්ටි රෝඩ්ස් කියන්නේ හිටපු දකුණු අප්‍රිකානු ක්‍රීඩකයෙක්. අශේන්ගේ වයසත් එක්ක කොහොමද ජොන්ටි රෝඩ්ස්ව දන්නේ?**

පුතා පුංචි කාලේ ඉඳන්ම එයාගේ තාත්තා එක්ක ක්‍රිකට් මැච් බලනවා. ඒ බලපු නිසා තමයි එයා ජොන්ටි රෝඩ්ස්ව දන්නේ. ඉතින් ඒ කාලේ ඉඳන්ම එයා කියනවා එයාටත් ජොන්ටි වගේ වෙන්න ඕන කියලා. මට මතකයි පොඩි කාලේ අශේන් පුතා සමහර වෙලාවට ජොන්ටි රෝඩ්ස් පන්දු රකින විදියට අපිට රඟපාලත් පෙන්නනවා.

**අශේන් කියන්නේ ගෙදරදි මොන වගේ දරුවෙක්ද?**

අශේන් පුතා ගෙදරදි හරිම කීකරු දරුවෙක්. ඒ වගේම අහිංසකයි. ඕන කෙනෙක්ට දෙපාරක් හිතන්නේ නැතුව උදව් කරනවා. එයාට ඉන්නේ නංගිලාම තුන්දෙනෙක්. එයාලටත් පුතා හරිම ආදරෙයි. කොච්චර ආදරේද කිව්වොත් එයාලා ඉල්ලන්නේ මොනවද ඒ ඉල්ලන පමාවෙන් අරගෙන දෙනවා.

**හැබැයි පුතා වැඩිපුරම කිට්ටු අම්මට කියලයි අපිට ආරංචි. ඇත්තද?**

(සිනාසෙමින්) ඒක නම් ඇත්ත. පුංචි කාලේ ඉඳන්ම අශේන් කිට්ටු එයාගේ තාත්තටත් වඩා මට. මොකද මං තාත්තා වගේ සැර කරන්නේ නෑනේ. පුංචි කාලේ ඉඳන්ම එයාට මොනවා හරි ඕන නම් දුවගෙන ඇවිත් කියන්නේ මට. හැබැයි ඉතින් කවදාවත් අනවශ්‍ය දේවල් ඉල්ලලා කරදර කරලා නෑ. අදටත් ඉතින් එයාට මාව නැතුව බෑ.

**ක්‍රිකට් ක්‍රීඩකයෙක් විදියට අශේන්ගෙන් දකින්න කැමතිම හීනයක් අම්මට ඇති. අවසාන වශයෙන් ඒ ගැනත් කියමුද?**

අශේන්ගේ අම්මා විදියට මමත් ආසයි පුතාගේ හීනයම දකින්න. ඒ තමයි එයා දවසක ලෝකේ හොඳම පන්දු රකින්නා වෙනවා දකින එක. මං හිතනවා මගේ පුතා බොහෝම ඉක්මණට ඒ තැනට එයි කියලා.

රුවන් එස්.සෙනවිරත්න

## කෙටි කතාව

# කසාද නොබැඳ එකට ඉන්නේ විලිසංගේ නැති උන්ද?

මිහිරාවී සිය මිතුරිය වූ මේධා සමඟ තිබුණු වසර ගණනාවක හිතවත්කම ඉවත දැම්මේ මේධාගේ ක්‍රියාකලාපය නිසාය. මේධා පෙම්වතෙකු සොයාගෙන සිටි අතර ඔහු සමඟ නිවසක් කුලියට ගෙන ජීවත් වන්නට තීරණය කර තිබුණාය. මේ බව මේධා මිහිරාවී සමඟ කීවේ සතුටු සහ සැහැල්ලු සිතින් වුවද ඉන් මිහිරාවීගේ සිතම අවුල් වී ගියේය.

**"උඹට පිස්සුද කියපන් මේධා? හත් දෙවියනේ මේක ලංකාව."** මිහිරාවී කියද්දී මේධාගේ මුහුණ අඳුරු විය.

**"මිහිරාවී?"**

**"ඇයි?"** මිහිරාවී ඇසුවේ නොරිස්සුමෙනි.


**"මිහිරාවී මම මේ ගැන කිව්වේ උඹ මගේ යාළුවා නිසා. අනික උඹේ සිතුවිලිත් නව පරම්පරාවේ කියලා මම විශ්වාස කරපු නිසා."** මේධා කිව්වේ පසුතැවිල්ලෙනි. මිහිරාවී මුහුණේ ඇඳගත්තේ සමච්චල්සහගත හිනාවකි.

**"නව පරම්පරාව? මොකද්ද නව පරම්පරාව කියන්නේ? නැහැදිච්චකමට කියන තව වචනයක්ද? නිකන් ජීවිතේ දුන්නු දෙමව්පියන්ට ද්‍රෝහීකම් නොකර හැදියාව තියාගෙන හිටපන්."** මිහිරාවී කිව්වේ රවමිනි.

**"මම දැන් වැඩිහිටියෙක් මිහිරාවී. මම හිතන්නේ නැහැ මගේ තීරණය මගේ දෙමව්පියන්ට කරන ද්‍රෝහිකමක් කියලා. ලිවින්ග් ටුගෙදර් ඉන්න එකෙන් අපිට අපි දෙන්නව අඳුනගන්න අවස්ථාව ලැබෙනවා. අපේ අඩුපාඩුකම් අඳුනගෙන විවාහයකට යන්න අපිට අපි ගැලපෙනවද කියලා තීරණය කරන්න අවස්ථාව ලැබෙනවා."** මේධා කියද්දී මිහිරාවී දෑස් උඩ ඉන්දවා ගත්තාය.

"මොකක්? ඒ කියන්නේ උඹලා ඔය එක ගෙදර ඉන්න හදන්නේ කසාද බඳිනවාද කියන එකවත් ෂුවර් නැතුවද? උඹ මගේ යාළුවෙක් කියන්නත් මට ලැජ්ජයි." මිහිරාවී කීවේ උරහිස් අකුළමිනි.

"ඇයි බන් මම කියන දේ උඹට තේරෙන්නේ නැත්තේ? කසාද බැන්දට පස්සේ අඩුපාඩුකම් අඳුනගෙන දික්කසාද වෙන මිනිස්සු කොච්චර ඉන්නවද මේ රටේ? ඉතින් ඊට වඩා හොඳ නැද්ද..."



**"ඇති ඇති නවත්තගනින් ඔය කතාව. අප්පිරියයි මට අහන් ඉන්නත්. උඹේ නැහැදිච්චකම් ගැන මා එක්ක සාධාරණීයකරණය කරන්න එන්න එපා."** කී මිහිරාවී එතැනින් පිට වූයේ මේධාගේ යහළුකම සදහටම හදවතින් අතු ගා දමමිනි.

මිහිරාවී එතැනින් නැවතුණේ නැත. ඇය සිය පෙම්වතා වූ චතුරංග සමඟ මේධාව විවේචනය කිරීමද ඇරඹුවාය.

**"කොල්ලා ළමයෙක් බඩට දීලා පැන්නම තේරෙයි."**

"අනේ දෙයියනේ මට දුක මේකිට උගන්වන්න වියදම් කරපු දෙමව්පියෝ ගැන."

**"ඇති මිහිරාවී ඔය කතාව. එයාලගේ තීරණ එයාලට ඕනේ විදියට ගත්තුදෙන්. අපි ඒ ගැන වධ නොවී ඉමු. ප්ලීස්."** චතුරංග කීවේ මේධාගේ කතාව මිහිරාවීගේ මුවින් අසා ඇති වූ තැනය.

වසර කීපයක් ගතවිනි. මේධා සහ මිහිරාවී අතර යළි කිසිඳු හිතවත්කමක් ඇති වූයේ නැත. මේධා වෙනත් ආයතනයක රැකියාවට බැඳුණු අතර මිහිරාවීට ඇයව අමතක වී ගියේය.

**"මිහිරාවී මතකද අපේ ඔෆිස් එකේ හිටිය මේධාව? එයා කසාද බැඳලානේ."** ආයතනයේ මිතුරියක් පවසද්දී මිහිරාවී වහා ෆේස්බුක් ගිණුමට පිවිසි මේධාගේ ඡායාරූප පිරික්සන්නට වූවාය.

"දන්නවද චතුරංග වැඩක්? මේධා කසාද බැඳලා. හැබැයි අර ලිවින්ග් ටුගෙදර් හිටිය කොල්ලව නෙවේ. ඊයා නේද? අලුත් කොල්ලා ඕවා දන්නවද දන්නේ නැහැ."

**"අනේ අපිට මොකෝ මිහිරාවී?"** චතුරංග පැවසුවේ අලසවය.

මාස තුනකට පසුව මිහිරාවීද විවාහ දිවියට එළඹුණාය.

මධුසමය ද රාත්‍රියේ මිහිරාවී ස්නානය කර නාන කාමරයෙන් පිටතට පැමිණි අතර සැහැල්ලු පිජාමා ඇඳුමකට මාරු වී සිටි චතුරංගව දැක ඇය පුදුමයට පත්වුවාය.

**"ඔයා... ඔයා වොෂ් එකක් දාන්නේ නැද්ද?"**

"අපෝ දැන් බැහැ. හෙට උදේටම වොෂ් එකක් දන්න බැරියැ." චතුරංග කීවේ වතුර වීදුරුවක් පානය කරන අතරේය.

"පිස්සුද චතුරංග උදේ ඉඳන් දාඩිය දාලා දාලා?"

**"අනේ මේ මට පීනසේ තියෙනවා. මම රෑ වෙලා වොෂ් දාන්නේ නැහැ. විකාර නැතුව කාලා ඉමු."** කී චතුරංග දෙස මිහිරාවී බලා සිටියේ භීතියෙනි.

"ඔයා කියන්නේ ඔයා කවදාවත් රෑට වොෂ් දන්නේ නැහැ කියලද?" ඇය ඇසුවේ වදන් පටලමිනි.

**"ඔව්. හවසට දාඩිය දැම්මට ඔය පොඩ්ඩක් ෆෑන් එක ඉස්සරහ හිටියම දාඩිය නැති වෙනවා. උදේට වැඩට යන්න කලින් වොෂ් එකක් දාගෙන ගියාම හොඳටම ඇතිනේ. ඇයි ඔයා දවසට දෙපාරක් වොෂ් දානවද?"** චතුරංග පුදුමයෙන් මෙන් ඇසුවේය.

"ලිවින්ග් ටුගෙදර් ඉන්න එකෙන් අපිට අපි දෙන්නව අඳුනගන්න අවස්ථාව ලැබෙනවා. අපේ අඩුපාඩුකම් අඳුනගෙන විවාහයකට යන්න අපිට අපි ගැලපෙනවද කියලා තීරණය කරන්න අවස්ථාව ලැබෙනවා." එදා මේධා කී වචන ආයේ ආයෙමත් ඇසෙන්නක් මෙන් දැනෙද්දී මිහිරාවී හිස බදාගෙන පසෙකින් වාඩිවූවාය.

**සමාධි ඩයස්**

දැන්වීමයි

# දණහිස් ආබාධ වලින් දුක්විඳින්නේ ඇයි?

## වයසට ගියාම බස්තම් පාවිච්චි කරන්නත් ලක්ෂ ගණන් වියදම් කර ශල්‍යකර්ම කරන්නත් අවශ්‍ය වෙන්නේ නැහැ

කායික ආබාධ තත්වයක් යනු අපට මානසික වශයෙන් ද අවතැන් කරන්නකි. මේ නිසා අපගේ දෛනික රිද්මය වෙනස් වීම අපට ජීවතය සම්බන්ධයෙන් අතිකරනු ලබන්නේ පරාජිත මානසිකත්වයකි. මේ තත්වයෙන් මිදීම සඳහා ඔබ නිවැරදි ප්‍රතිකාර නිවැරදි කාලය තුළ ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ වගේම නිවැරදි ප්‍රතිකාර සඳහා නිවැරදිම ස්ථානයක් වෙතම යාම ඔබ සතු මූලිකම වගකීමකි. මේ ඒ සඳහා ඔබට ලබාදෙන මගපෙන්වීමකි.

### දණහිස් ආබාධ



මෙවැනි ආබාධ ඇති ඔබ තරබාරු කෙනෙක් හෝ නිතර ඇවිදින කෙනෙකු විය හැකි ය. විශේෂයෙන් මෙවන් අය දණහිස් වේදනාව නිසා අපහසුතාවයට ලක්වේ. මේ නිසාම බොහෝවිට මෙවැනි අය තාවකාලික සුවය ගෙනදෙන වේදනා නාශක වලට යොමු වේ. මෙහදී අප විසින් දීර්ගකාලීන සුවය ගෙන දෙන, අතුරු ආබාධ නැති දේශීය, භෞතික හා නිල චිකිත්සා ඔස්සේ ප්‍රතිකාර කරනු ඇත.

මම තරබාරු කෙනෙක්. මට තිබුණේ ඉතා වේදනාකාරී දණහිස් ආබාධයක්. ඇවිදින්න, පඩි නඟින්න බහින්න, එදිනෙදා වැඩකටයුතු කරගන්න අපහසුතාවෙන් දුක් වින්දා. නොයෙක් තැන් වලින් බෙහෙත් කලා. පත්තරේ සහ ටීවීඑකේ දැක්ක ලංකාවේ සහ පිටරටවල් වල අධික මිල ගණන් වල බොන බෙහෙත් සහ තේල් වර්ග හරියට පාවිච්චි කලා. සනීප වුනේ නෑ.

මේ සායනයට ඇවිත් ප්‍රතිකාර වාර කීපයකින් මට සුවය ලැබූ බව පවසන්නේ ඉතාමත් සතුටින්. නිවැරදි විදිහට තෙල් ගෑම, දෙන උපදෙස් නිවැරදිව පිළිපැදීම අනිවාර්ය වෙනවා. විශේෂයෙන් දණහිසට කරන ව්‍යායාම කරන්න ම ඕනෑ. ඒවගේම දණහිසට හොඳ Guard එකක් දාන්නත් ඕන.

මේ ප්‍රතිකාර වලින් මම තේරුම්ගත්ත දේ තමයි. තරුණ හෝ මැදිවයේ අවධියේ දී දණහිස් වේදනාවන් තිබුණාම අපි පුරුදුවෙලා ඉන්නේ වේදනා නාශක, තෙල් හෝ බාම් වර්ග පාවිච්චි කරලා තාවකාලික සුවයක් ලබන්න. එහෙම කලාට අපි වයසට යනකොට නොදැනුවත්වම කාටිලේජ ගෙවෙන්න පටන් ගන්නවා. විශේෂයෙන් අපි තරබාරු නම් කාටිලේජ හොඳටම ගෙවිලා දණහිස් අස්ථි එකට වදින්න බලනවා. හුඟක් වෙලාවට මේ වගේ අය කෘතිම දණහිස් දාන්න ගොඩක් මුදල් වියදම් කරන්න වෙනවා. ඉතින් එහෙම නොවී සනීප වූ කෙනෙක් හැටියට මම කියන්නේ, වේදනා විඳින්නේ නැතිව පසුකාලීනව අධික වියදම් නොකර, ඉක්මනින් සුව කර ගැනීමටා හැදුන මුල් අවධියේදී ම මේ ප්‍රතිකාර වලට යොමුවීමෙන් මා වගේ සුවය ලබාගන්න.

**පි. ආර්. මල්ලිකා මිය. රාජගිරිය. 0702480241**

**තුනටියේ වේදනාව හා පාදය දිගේ වේගනාව, හිරිවැටීම නිසා ඇතිවන තත්වය දරුණු වුවහොත් ශල්‍යකර්ම පවා කිරීමට සිදුවේ**

මම මගේම ලොරි රථයක් පදවන කෙනෙක්. මට තිබුනා කාලයක ඉදන් තුනටියේ වේදනාවන් සමඟ කකුල දිගට එන වේදනාවක් හා හිරියක්. පුදුම අපහසුතාවෙන් තමයි හිටියේ. වැඩ කරගන්නත් අපහසුයි. බොන බෙහෙත් ගත්තට එවේලෙට අඩුවෙනවා විතරයි. මගේ නිවස ළඟම තමයි මේ සායනය තියෙන්නේ. මම මුලින්ම මේ සායනයට ගියාට පස්සෙ මට මගේ රෝගය ගැන ඉතා හොඳ පැහැදිලි කිරීමක් කලා.

ප්‍රතිකාර වලින් දැනුනේ පුදුම සුවයක්.

අනිවාර්යයෙන්ම කොන්දට බෙල්ට් එකක් දාන්න ඕනෑ. ඒ වගේම පරිස්සම් වෙන්නත් ඕන. මට දැනුන දේ තමයි මේ රෝග තත්වය හරිහැටි හඳුනාගැනීම සහ ඒ සඳහා නිවැරදි ප්‍රතිකාර ලබා ගැනීම වගේම පරෙස්සම් වීම තමයි වැදගත්ම දේ කියන එක. නැත්නම් පසුවට ශල්‍යකර්ම කරන්නත් වෙනවා. මෙතුමට පිංසිද්ධවෙන්න දැන් මට දැන් හොඳයි.

**එස්. සරත් මහතා, හිඹුටාන**

**දියවැඩියාව නිසා ඇතිවන හිරිවැටීම්, වේදනාව,දැවිල්ල, දුර්වලතා ඇති රෝගීන් සුවපත් කරන්න පුලුවන්.**



ආබාධ වලින් වලක්වන්නත් පුලුවන්.

මම දියවැඩියා රෝගයට කාලයක් සිට බෙහෙත් බොනවා. කකුල් වල හිරිය, දැවිල්ල, ඉදිකටු වලින් අනිනවා වාගේ වේදනා නිසා ඇතිවූ ගටලු අපමණයි. හුගක් දිනවල රාත්‍රි නිදි නැති තරම්. විවිධ අන්දමේ ප්‍රතිකාර කළත් සුවයක් නම් ලැබුනේ නෑ.

මෙම සායනයේ දී සීනි පාලනය කරන්න නිවැරදි උපදෙස්ද ද ලැබුනා.

පළමු දිනයේ දී කළ පාද සත්කාරය කකුල් වල යටිපතුල් හිරිය නිසා දැනුනේම නෑ. නමුත් දෙවන, තෙවන දින වන විට යටිපතුල් ප්‍රතිකාරය හොඳින්ම දැනෙන්න පටන්ගත්තා.

ප්‍රතිකාර හේතුවෙන් යටිපතුලේ සිනිඳු ගතිය ක්‍රමක්‍රමයෙන් නැතිවෙමින් තිබෙන අතර, සෙරෙප්පු නැතිව ටයිල් පොළොවේවත් යන්නට පවා නොහැකි වුන මට දැන් සෙරෙප්පු නැතිව ඇවිද යාමට හැකි බව ඉතා ඔබට කියන්නේ ඉතාමත් සතුටින්.

වාර කිහිපයක් පමණයි ප්‍රතිකාර ගත්තේ, කියාගන්නට බැරි අපමණ සතුටක් දැනුනේ. දැන් මට නම් හොඳටම සුවයි. තොරතුරු අවශ්‍ය නම් කතාකරන්න. වෛද්‍යතුමාට බොහොම පිං!

**ඒ.එම්.ජී. මැණිකේ මහත්මිය, හොරම්පැල්ල, මිණුවන්ගොඩ. 0706167953/ 0707167953**

**අවුරුදු ගණනාවක් තිස්සේ නිතර නිතර හැදෙන බෙල්ලේ සහ උරහිසේ වේදනාවක් මට තිබුණා**

මට දියවැඩියාවත් මාස 6ක් විතර ඉදන් තිබුණා. වසර ගණනාවක්ම නිතර නිතර සෑදෙන බෙල්ලේ හා උරහිස මෙන්ම උරපතු ප්‍රදේශයේ වේදනාවක් සෑදුනා. මේ සැරේ ඒ වේදනාව ඉතාම දරුනු විදිහට දැනුනා. ඒ විතරක් නොවේ, අතේ ඇඟිලි දක්වා ඒ වේදනාව දැනුනා. රෝහල් වලින් විවිධ සායන වලින් ප්‍රතිකාර ගත්තත් අඩුවුනේ නෑ. මම මේ සායනය ගැන දැනගත්තේ ඊට පසුවයි. මම ගිය බොහෝ තැන්වල දී ඒ අයට මගේ ලෙඩේ හරියට හඳුනාගන්න බැරිවුනා. ඒ වගේම මෙතුමන් වගේ සැලකිල්ලෙන් පරීක්ෂා කරලා බැලුවෙත් නෑ. ලැබුණු උපදෙස් පිළිපදිමින්, නියමිත ආකාරයට ප්‍රතිකාර ලැබුණු නිසා හොඳ සුවයක් ලබා ගැනීමට හැකිවුනා. MRI වගේ අධික වියදම් යන පරීක්ෂන වලට යොමුවී ශල්‍යකර්ම කරන්න එපා කියල තමයි මට කියන්න තියෙන්නෙ.

අද වෙනකොට මගේ සුවවීම නිසා මම වගේම ගෙදර හැමදෙනාමත් සතුටින් ඉන්නේ. දැන් මට ඉතාමත් සැහැලුවක් වගේම මානසික නිදහසකුත් දැනෙනවා. මගෙන් ඔබට තොරතුරක් අවශ්‍යනම් මේ අංකයට ඇමතුමක් ලබා දෙන්න. ස්තුතියි.


**කඩුවෙල පදිංචි සුජීවා මහත්මිය, 0773152862**

සායනික තොරතුරු

**ඔබත් මෙවැනි සංකූලතා වලින් පෙළෙන්නේ නම් ඔබට සාර්ථක ප්‍රතිකාර සඳහා 468/10A, සල්මල් උයන, හිඹුටාන යන ලිපිනය දරණ ස්ථානයේ පිහිටි ETON HEALTH CARE සුව වෙද මැඳුර ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් සාර්ථක උපදෙස් සහ ප්‍රතිකාර ලබා ගැනීමේ අවස්ථාව ඇත. දශක ගණනාවක් පුරා දහස් ගණන් රෝගීන් සුවපත්කළ ප්‍රතිකාර කර්යයේ නිරත දේශමාන්‍ය, වෛද්‍යශූරි කේ.එම්. රංජිත් මහතාගෙන් මේ සම්බන්ධයෙන් සාර්ථක උපදෙස් හා ප්‍රතිකාර ලබාග හැකිය.**

**Google map ys ETON HEALTH CARE, Salmal Uyana, Hubutana. සෙවීම ඔස්සේ ඉහත ලිපිනය දරණ ප්‍රතිකාර මධ්‍යස්ථානය මධ්‍යස්ථානය වෙත පහසුවෙන් ලඟාවිය හැකිය. එමෙන්ම 0771893001/ 0764802302 යන දුකරථක අංක ඔස්සේ වැඩිදුර තොරතුරු ලබාගත හැක. පැමිණීමට පෙර දිනයක් වෙන්කරවා ගන්න.**

# කේන්දරේ බලලා කඩේ වැඩට ගෝලයෙක් අරන්!




ඔහු ගම්පහට නොදුරු උපනගරයක ලෝහ භාණ්ඩ ව්‍යාපාරිකයෙකි. කුඩා කාලයේ සිටම දෙමාපියන් අහිමිවීම නිසා මිත්තණිය සමීපයේ හැදී වැඩුණු ඔහුට හරිහැටි පාසල් අධ්‍යාපනයක්වත් ලැබීමට අවකාශ ලැබී නැත. නමුදු ළමාවියේදී ලෝහ භාණ්ඩ සම්බන්ධ ව්‍යාපාරයක සහායකයකු ලෙස කටයුතු කළ ඔහු පසුව ස්වෝත්සාහයෙන් තමන්ද එවැනි ව්‍යාපාරයක් පටන්ගෙන තිබේ. මේ වනවිට මේ පුද්ගලයා හතළිස් තුන් වියැති දෙදරු පියෙකි.

කුඩාකල සිටම ජ්‍යොතිෂ්‍ය තදින්ම විශ්වාස කළ මේ ව්‍යාපාරිකයා තම ව්‍යාපාරය පටන්ගෙන ඇත්තේද ජ්‍යොතිර්වේදි නියමයන්ට අනුවය. එසේම තමන් දැනට අතිශය සාර්ථක යුග දිවියක් ගත කරන බවත් ඊට හේතුව සහකාරිය තෝරාගැනීමේදී පොරොන්දම් ගැලපීමට විශේෂ අවධානයක් යොමුකිරීම බවත් ඔහු මිතුරන් හා කියා තිබේ.

ඉකුත් කොවිඩ් වසංගත සමය තුළ අප රටේ සෙසු බොහෝ ව්‍යාපාර මෙන් ඔහුගේ ලෝහ භාණ්ඩ ව්‍යාපාරයද සැලකිය යුතු පසුබෑමකට ලක්විය. නමුත් ප්‍රායෝගික සහ යථාර්ථවාදී හේතූන් පසෙක තබා තම ජන්ම පත්‍රය ජ්‍යොතිර්වේදියෙකුට ලබාදුන් පසු ඔහු පවසා තිබුණේ ව්‍යාපාරිකයාගේ ජන්ම පත්‍රයට අනුව මේ කාලයේ ආදායම් පක්ෂයට වඩා වියදම් පක්ෂය ඉහළ යාමේ අවදානමක් පවතින බවයි. ඒ අනුව එම ව්‍යාපාරය සඳහා ඉතා යහපත් ග්‍රහචාරයක් සහිත සේවකයෙකුගේ සහාය ලබාගැනීමෙන් ව්‍යාපාරය කෙරෙහි එල්ලවී ඇති අහිතකර බලපෑම් වළකාගත හැකි බවද ජ්‍යොතිර්වේදියා කියා තිබේ.

නමුදු ඊළඟ ප්‍රශ්නය වී තිබුණේ එබඳු ප්‍රබල ග්‍රහ පිහිටීමක් සහිත සේවකයෙකු සොයාගන්නේ කෙසේද යන්නය. මේ අතර එක්තරා දිනයක එම ජ්‍යොතිර්වේදියාගෙන් ඉහත ව්‍යාපාරිකයාට දුරකතන ඇමතුමක් ලැබිණි. ඉන් පැවසුණේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධ රැකියාවක් සඳහා වන විශිෂ්ටතම ග්‍රහ පිහිටීමක් සහිත තරුණයෙකු සිය ජන්ම පත්‍රය පරීක්ෂා කරගැනීම පිණිස මේ වනවිට තමන් හමුවට පැමිණ සිටින බවයි. එවැන්නකු එම ව්‍යාපාරයට සම්බන්ධ කරගෙන ඔහුට එහි යම් වගකීමක් පවරන ලදහොත් ඒ ව්‍යාපාරය දිනෙන් දින දියුණුවෙන් දියුණුවට පත්වන බවද ජ්‍යොතිර්වේදියාගේ මතය විය. ඔහුගේ ඒ කතාවෙන් වසඟයට පත් ව්‍යාපාරිකයා ඒ මොහොතේම එම තරුණයා තමන් හමුවට කැඳවා ඊට පසුදිනම සේවයට පැමිණෙන මෙන් ඉල්ලා සිටියේය.

ජ්‍යෙතීර්වේදියා කී අන්දමට එම තරුණයාගේ පැමිණීමත් සමඟ තම ව්‍යාපාරයට නව කලඑළියක් ලැබුණු බවක් එම ව්‍යාපාරිකයාට හැඟුණි. එනිසාම තම ව්‍යාපාරික ආයතනයේ කටයුතුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් එම තරුණයාට භාරදීමට ව්‍යාපාරිකයා ක්‍රියා කළේය. ඒ මතින් ලත් මානසික අස්වැසුම හමුවේ එම ව්‍යාපාරිකයා වෙනයම් කටයුතු සඳහා යොදන කාලයද කෙමෙන් වැඩිකළේ එම තරුණයා කෙරෙහි තිබූ අපමණ විශ්වාසය නිසාය.

එහෙත් ඔහු සේවයට පැමිණ දෙවන මාසයේ ආදායම නොසිතූ වේගයකින් පහල බැස ඇති බවක් හැඟුණු මුත් එම තරුණයා කෙරෙහි ඇති විශ්වාසය නිසා ඒ පිළිබඳව විමසීමටවත් ඔහුට නොසිතුණි. එහෙත් ඊළඟ මාසය වනවිට තම ව්‍යාපාරයේ ආදායම මුළුමනින්ම බිඳවැටෙන තත්ත්වයක් නිරීක්ෂණය වූ බැවින් ඔහු ඒ සම්බන්ධයෙන් තරුණයාගෙන් කරුණු විමසා සිටියේය. එහෙත් අසන ලද ප්‍රශ්නවලට වටින්ගොඩින් පිළිතුරු දුන් තරුණයා පසුව හඬා වැළපෙන්නට වූ අතර එදින වේලාසනින් නික්ම ගිය ඔහු ඊට පසුදින සිට සේවයට පැමිණියේද නැත. ඉන් අන්දමන්ද වූ ව්‍යාපාරිකයා නැවත තම ව්‍යාපාරය සම්බන්ධ ගණන් හිලව් පරීක්ෂා කිරීමේදී ඔහුට වැටිහී ගියේ ප්‍රබල ග්‍රහචාරයක් තිබූ බව පැවසුණු ඒ තරුණයා තම 'මුදල් ලාච්චුවම' හිස්කොට ගොස් ඇති ආකාරයයි. ව්‍යාපාරිකයා ගණන් බැලූ අකාරයට එම මුදල රුපියල් මිලියනයකට ආසන්න විය.

මෙම මහාපරිමාණ හොරකම, මංකොල්ලය සම්බන්ධයෙන් තවදුරටත් නිහඬව සිටිය යුතු නැතැයි බිරිඳ ද තරයේම පවසා සිටි බැවින් ව්‍යාපාරිකයා තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයට ගියේ පැමිණිල්ලක් කිරීමටය. එහෙත් ඔහු පොලිසියේ නිලධාරීන්ගේද දැඩි දෝෂ දර්ශනයට ලක්වුණේ තම ව්‍යාපාරික ආයතනයේ සේවයට බඳවාගත් එම තරුණයා පිළිබඳව කිසිඳු තොරතුරක් අනාවරණය කිරීමට ව්‍යාපාරිකයා අසමත් වූ බැවිනි.

**"තමන් රටේම ඉන්න හොරුන්ට සල්ලි ලාච්චු භාරදීලා උන් ඒවා හොරකම් කළාම දුවගෙන එනවා අපි ලවා හොරු අල්ලවා ගන්න. ඒකෙන් වෙන්නේ මේ පළාත්වල හොරකම් වැඩියි කියන එක වාර්තාගත වෙන එක විතරයි. ඒත් තමන්ගේ ගොංකම් හින්දා හොරකම් වැඩිවුණාය කියලා අපිට මේවයේ ලියන්න බැහැනේ."**

එම සම්පූර්ණ කතාව අසා දැනගත් පොලිස් ස්ථානාධිපතිවරයා ව්‍යාපාරිකයා හමුවේ එසේ ගෝරනාඩු කළේය. එහෙත් තමන් එම තරුණයා රැකියාවට ගැනීමේදී ඔහුගේ ග්‍රහ පිහිටීම මිස අඩුම තරමින් ඔහුගේ හැඳුනුම්පතවත් නොබැලූ බව පොලිසිය හමුවේ කීමට ව්‍යාපාරිකයා බිය විය. ඒ එමගින් පොලිසිය වෙතින් තමන් වෙත නැගෙන දෝස්මුරය දෙගුණ තෙගුණ විය හැකි බැවිනි.

කෙසේ හෝ තමන් මේ උගුලෙහි හසුවූයේ තම ජන්ම පත්‍රය පරීක්ෂා කළ ජ්‍යොතීර්වේදියා නිසා බව වටහාගත් එම ව්‍යාපාරිකයා කෙළින්ම ඒ ජ්‍යොතීර්වේදියා සොයාගොස් තමන් සතු රුපියල් මිලියනයකට ආසන්න මුදලක් අහිමිවීම සහ පොලිසියේ ගෝරනාඩු අසා සිටීමට සිදුවීම පිළිබඳ සිත තුළ කැකෑරුණු සියලු දුක්වේදනා ඔහු මතින් පිටකර ගැනීමට සැරසුණි.

**"මම ඔය කියන හාදයාගේ කේන්දරේ බලලා කිව්වේ මිනිහට ව්‍යාපාරවලට සමින්ධ රැකියාවලින් වැඩි ලාභ ලැබීමේ හැකියාවක් තියෙනවා කියලනේ. ඉතින් මහත්තයා කියන විදියට ඔය හාදයා ඔය කියපු පුංචි කාලෙකට රුපියල් ලක්ෂ දහයකට කිට්ටු මුදලක් අරගෙන පැන්නා නම් මම කියපු දේ ඇත්තනේ මහත්තයෝ."** ජ්‍යොතීර්වේදියා කීය.

**"අනික මම මහත්තයට කිව්වද කේන්දරේ මොනවා තිබුණත් ඔය මිනිහා ගැන කිසිම දෙයක් හොයන්නේ බලන්නේ නැතුව මිනිහට සල්ලි ලාච්චුව භාරදෙන්න කියලා? එහෙමත් නෑනෙ. ඉතින් මහත්තයා කරපු ඔය මෝඩකම්වලට මම මොනවද කරන්නේ කියන්න."** ජ්‍යොතිර්වේදියාගේ එම ප්‍රකාශයෙත් සමඟ එම ව්‍යාපාරිකයා හිස් අතින් ආපසු හැරුණි.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**




...2 පිටුව බලන්න

# ගෝලයා ලවා අලි අල්ලන්න ගුරා බොරුවට වෙරි වෙලා





තොරතුරු
මහාචාර්ය අශෝක දංගොල්ල
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

අලි කතා

ගෝලයින් දක්ෂයින් කිරීම සඳහා ගුරුවරු විවිධ උපක්‍රම භාවිත කරති. අලුත් අලුත් සංකල්ප ප්‍රායෝගිකව යොදාගැනීමට වෙහෙසෙන එවැනි ගුරුවරුන් ඕනෑතරම්ය. එහෙත් ගෝලයා ඔප දැමීමට ගුරුවරයාට මත්වතුර උදව් වන්නේද යන්න ගැටලුකාරීය. නමුත්, එවැන්නෝද වෙති.

වරක් මහාචාර්ය අශෝක දංගොල්ලට හබරණ සිට දුරකතන ඇමතුමක් ලැබිණ. එවිට සවස පහට ආසන්නය. හේතුව අලි කුලප්පුවකි. එවැනි ඇමතුම් මහාචාර්ය දංගොල්ලට අරුමයක් නොවේ. අලියා ඇත්ගොව්වාගෙන් මිදී හබරණ වැව් බැම්මේ එහා මෙහා දුවන බව අලි හිමිකරු දැනුම් දුන්නේය. එනිසා වහාම ක්‍රියාත්මක විය යුතුය. අනෙක අලියාගේ පෙර හැසිරීමද යහපත් නැත. එබැවින් සිහි නැති නොකළහොත් වැඩ වැරදීමට ඉඩ තිබේ.

මේ අලි ජරමර අස්සේ එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙකු දඩයම් කිරීමට මහාචාර්ය දංගොල්ලට අවැසි විය. නවක පශු වෛද්‍ය කථිකාචාර්යවරිය පුහුණු කිරීමට මෙය කදිම අවස්ථාවකි. ඒ අනුව අලියා සිහි නැති කිරීමටත් ඈ පුහුණු කිරීමටත් මහාචාර්යවරයා තීරණය කළේය. ඒ අනුව අවශ්‍ය ඖෂධ සහ තුවක්කු සූදානම් කරගන්නා ලෙස හෙතෙම නවක කථිකාචාර්යවරියට දැනුම් දුන්නේය. අලියා සිහි නැති කිරීමට ඈ බියවනු ඇතැයි ඔහුට සැකයක් විය. එනිසාම මහාචාර්ය දංගොල්ල ඇයට හැඟෙව්වේ තමා විශ්වවිද්‍යාලයේ සමාජශාලාවෙන් සවස 3ට පමණ මධ්‍යසාර පානය කළ බවයි. එහෙත් ඒ වෙලාවට සමාජශාලාව විවෘත නොවන බව කථිකාචාර්යවරිය දැන නොසිටියාය.

අවශ්‍ය කළමනා සකස් කරගැනීමෙන් පසු වාහනයට නැගුණු පශු වෛද්‍ය කථිකාචාර්යවරිය පීඨ සමාජශාලාව වෙත පැමිණියාය. ඒ සිය ගුරුවරයා ගමනට සම්බන්ධ කරගැනීමටයි. ගුරුවරයාට උතුර දකුණ මාරු වී ඇති සෙයකි. කල්පනාව වෙනස් වී ඇති බවක් පෙනේ. එහෙත් ඈ නොදැන සිටි කරුණ වූයේ එය රංගනයක් බවයි. මහාචාර්යවරයාගේ වෙරිමත රැඟුම සමඟ අදාළ ස්ථානයට යන විට රෑ බෝ වෙමින් පැවතිණ. කළුවර වැටීමට පෙර අලියා සිහි නැති කළ යුතුය. එබැවින් යුහුසුළුව ක්‍රියාත්මක විය යුතු වේ. නවක කථිකාචාර්යවරිය ඔසු යොදා තුවක්කුව පිළියෙල කළාය. අනතුරුව එය ගුරුතුමාට ලබාදුන්නේ නිසි ඉලක්කය ගැනීමටයි. එහෙත් බමන මතින් සිටින්නකු නිසි එල්ලය ගන්නේ කෙසේද?

**"මට බෑ. මට හිසේ රදේකුත් තියෙනවා."**

කාලය වේගයෙන් ගතවේ. ගුරුවරයාගේ දෙඩවිලි අතරේ සියතින් අලියා සිහි නැති කරනවා හැර විකල්පයක් නොමැති බව නවක කථිකාචාර්යවරියට පෙනී ගියාය. එය ඈ ඉතා සාර්ථකව සිදුකළාය. ඇත්ගොව්වන් ලවා අලියා බැඳ දැමීමටද ඇයට හැකි විය. අනතුරුව ගුරු-ගෝල දෙපළ පේරාදෙණිය බලා පිටත් වූහ. පසු අවස්ථාවකදී එම ස්ථානයේදීම එම අලියා නැවත කුලප්පු විය. එහිදීද ගුරුවරයාගේ උපදෙස් මත අලියා සිහි නැති කර අල්ලා දීමට ඈ සමත් වූවාය. අලි ඇල්ලීම නවකයින්ට ඉගැන්වීමට මහාචාර්ය අශෝක දංගොල්ල යොදාගත් මත් උපක්‍රමය සාර්ථක වූයේ එලෙසිනි.

**රෂ්නිකා ලියනගේ**

දැන්වීමයි

බැංකුවට වඩා අඩුම පොලිය,
වැඩිම අත්තිකාරම
අපෙන් !
රන් ණය නම්
ඒෂියා ඇසට් ෆිනෑන්ස් තමයි

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| කොටහේන | 0702 539 382 | ගම්පහ | 0779 230 549 |
| වැල්ලවත්ත | 0710 870 686 | කළුතර | 0776 167 149 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | හලාවත | 0779 256 191 |
| මොරටුව | 0766 227 059 | මාතර | 0705 979 237 |
| පානදුර | 0767 952 286 | ගම්පොල | 0710 870 735 |
| වෙන්නප්පුව | 0710 869 378 | නාවලපිටිය | 0710 870 706 |
| ගාල්ල | 0705 979 274 | හැටන් | 0778 790 372 |
| කුරුණෑගල | 0766 227 061 | කෑගල්ල | 0703 583 363 |
| දිගන | 0778 156 738 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බේරුවල | 0740 920 356 | පුත්තලම | 0771 201 861 |
| මතුගම | 0771 201 860 | මහියංගනය | 0771 201 862 |
| මොණරාගල | 0771 201 852 | වත්තේගම | 0742 551 103 |
| බදුල්ල | 0771 201 863 | හපුතලේ | 0760 677 018 |
| කල්පිටිය | 0761 605 803 | මාතලේ | 0702 539 389 |
| කටුගස්තොට | 0779 476 206 | තලවකැලේ | 0710 871 009 |
| නාඋල | 0763 226 230 | රාගල | 0710 870 703 |
| කන්තලේ | 0742 572 585 | පුඩළුඔය | 0740 929 541 |
| පොතුවිල් | 0771 201 855 | මස්කෙලිය | 0760 909 822 |
| වැලිමඩ | 0778 764 751 | පුස්සැල්ලාව | 0742 531 360 |
| බගවන්තලාව | 0742 588 267 | අච්චුවේලි | 0743 865 368 |
| ආගරපතන | 0765 930 715 | | |

ASIA ASSET FINANCE PLC
A Finance Company with a Golden Heritage
Muthoot Group Company
For more information call/ text us on 0767 888 222
www.asiaassetfinance.com

# නාකි ගෑනුන්ට විසේ හැදුනම නරකද ?

ඇස් දෙක වහගෙන අවුරුදු අසූවක විතර ආච්චි අම්මා කෙනෙක්ව හිතින් මවාගන්න.

මොනවද පේන්නේ? කොන්ද නමාගෙන හැරමිටි ගහගෙන ඉබිගමනින් එන, දත් නැති කට පෙන්නලා හිනාවෙන, හම රැළිවැටිච්චි ආත්තම්මා කෙනෙක් නේද? හැබැයි මේ කියන ආච්චි අම්මා එහෙම නැහැ.

අර්නස්ටින් ශෙපර්ඩ්. ලෝකේ වයස්ගතම කාය වර්ධන ශිල්පිණිය. වයස 86යි. 86ක් වුණාට මොකද අවුරුදු 45කට වඩා වයස පේන්නේ නැති නිසා අර්නස්ටින්ට කටක් ඇරලා ආච්චි අම්මා කියන්න බැහැ. කළ බඩ ආරලා හම රැළිවැටිලා නෑ. ළඟදි රාත්තල් 150ක් උස්සලා වාර්තාවකුත් තිබ්බා.

"බොඩිබිල්ඩින් කරන කෙනෙක්ට ඉතින් කොහොම ඉන්න බැරිද?" කෙනෙක්ට හිතෙන්න පුළුවන්. අර්නස්ටින් කියන්නේ කෘත්‍රිම රූපලාවණ්‍ය සැත්කම්වලට ලක්වුණු කෙනෙක් නෙමෙයි. හිතුවොත් අවුරුදු 86ක කෙනෙක්ට වුණත් ළාබාල පෙනුමක් පවත්වගන්න පුළුවන් කියන එකට ඇය හොඳ උදාහරණයක්. එයාට පුළුවන්නම් අපිට බැරි මොකද කියන එක ගැනයි දැන් ටිකක් හිතලා බලන්න ඕනේ.



අපොයි දැන් ඉතින් ජීවිතේ ඉවරයි! යන තැනකට වැඩක් කරගන්න ඕන කියලයි හතළිහ පැන්න ගමන් අපේ රටේ ගොඩක් උදවිය හිතන්නේ. විශේෂයෙන් බවලතුන්. ඊට පස්සේ ඉතින් ලස්සන, විලාසිතා, සෞඛ්‍ය, පිරිසුදුකම තුට්ටුවට දලා යන තැන්වලට දේවල් රැස් කරගන්න මහන්සි වෙනවා. යන තැන්වලටත් දේවල් රැස් කරගන්න. හැබැයි ඊට කලින් ඉන්න තැන හොඳට ඉන්න එක ගැනත් ටිකක් හිතන්න කියන එකයි අපි කියන්නේ.

> "Life begins after Forty (ජීවිතේ පටන්ගන්නේ 40න් පස්සේ)" සුද්දා කියන්නේ එහෙමයි. 40-50 මනුස්සයෙක්ගේ ජීවිතේ ස්වර්ණමය කාලය විදියටයි ඔවුන් හඳුන්වන්නේ

යුරෝපීය රටවල මේ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස්. ඒ අය ජීවිතේ පටන්ගන්නේම ඔය කාලෙදි. "Life begins after forty (ජීවිතේ පටන්ගන්නේ 40න් පස්සේ)" සුද්ද කියන්නේ එහෙමයි. 40-50 මනුස්සයෙක්ගේ ජීවිතේ ස්වර්ණමය කාලය විදියටයි ඔවුන් හඳුන්වන්නේ.

හතළිහෙන් පස්සේ ජීවිතේ ඉවරයි කියලා හිතන නිසාමදෝ ලංකාව ඇතුළු ආසියානු රටවල මිනිස්සු වයසට කලින් වයස්ගත වෙනවා කියලා මෑතකදි කරපු සමීක්ෂණයකින් හෙළිවෙලා තියෙනවා. හතළිහෙන් පස්සේ ලස්සනට ඉන්නේ කොහොමද කියලා කතා කරන්න හිතුවෙ ඒකයි.

අපේ සම හැදිලා තියෙන්නේ කොලජන්වලින්. සම ඉලාස්ටික් වගේ ඇදෙන්නේ, ලස්සනට තදට තියෙන්නේ ඔව්වා නිසා. අවුරුදු 30 පැන්නම කොලජන් ප්‍රෝටීනය ස්වභාවිකවම ටිකෙන් ටික විනාශ වෙලා යනවා. ඒතකොට තමයි අපේ සම රැළි වැටෙන්නේ.

අවුරුදු විසි ගණන්වල ඒ කියන්නේ සමට සත්කාර අත්‍යවශ්‍යම නොවෙන කාලෙදි රටේම නැති දේවල් උලාපු උදවිය 30-40 ගණන් පන්නපු හැටියේ සමට සත්කාර කරන එක නතර කරනවා. හැබැයි ඕක තමයි සමට සත්කාර කරන්නම ඕන කාලේ.

ටිකක් වයස්ගත කෙනෙක් මූණට කහ, කෝමාරිකා ටිකක් ගෑවොත් "නාකි ගෑනුන්ට පුදුම විසයක්, වයසට යද්දි එක පිස්සු එනවා, තාමත් කෙල්ල වෙන්න යනවා" රටේ නැති කතා කෝටියයි. අපේ රටේ වැඩිහිටි උදවිය ලස්සන ගැන නොහිතන්න ඕකත් හේතුවක්. හැබැයි ඔය කතාවලට ඇහුම්කන් දෙනවා නම් ඉක්මනට වයසට යන එක කොහොමත් වළක්වන්න බැහැ.

ඒ නිසා සතියට වතාවක්වත් සමට රූපලාවණ්‍ය සත්කාරයක් කරන්න. ස්වභාවික සත්කාර තමයි වයස්ගත සමට වැඩිය හොඳ.

ලස්සනට ඉන්න වයස අදාළ නැහැ වගේ තමයි විලාසිතා කරන්නත් වයස අදාළ නැහැ. ඒ ඒ වයසට ගැලපෙන විදියට ලස්සනට විලාසිතා කරන්න පුළුවන්. හැබැයි වයස්ගත වෙනකොට සිරුර ටිකක් උෂ්ණ වෙනවා. ඒ නිසා කෘත්‍රිම රෙදි වෙනුවට කපු රෙදි භාවිතා කරන්න. දෙපයට සුවපහසු පාවහන් පළඳින්න. වයස්ගත වෙනකොට අස්ථි දුර්වල වෙන නිසා පෙරළෙන සුළු, උස් අඩි පළදින එක ටිකක් අවදානම්.

වයසට යන්නත් කලින් අපිව වයස්ගත කරන්න හිරුඑළියට පුළුවන්. ඒ නිසා තද හිරුඑළියට යන්නම එපා. යනවා නම් SPF 30ට වැඩි හිරු ආලේපනයක් පාවිච්චි කරන්න.

40න් පස්සේ ඕනවට වඩා සම ස්ක්‍රබ් කරන්න හොඳ නැහැ. සති තුනකට වතාවක් ස්ක්‍රබ් කළාම ඇති. ඒ වගේම සැර සබන් ගාලා මූණ සෝදන්න එපා. ඒවා ඉක්මනින්ම සමේ සෛලවලට හානි කරනවා. අනික ප්‍රමිතිගත සේදුම්කාරකයක් වුණත් දවසට දෙපාරකට වඩා පාවිච්චි කරන්න එපා.

සම වියලුණාම ඉක්මනින්ම සම වියපත් වෙනවා. ඒ නිසා දිනපතාම සමට මොයිස්චරයිසින් ක්‍රීම් එකක් ගාන්න. ප්‍රමාණවත් තරමට වතුර බොන්න. නින්දෙදි ස්‍රාවය වෙන මෙලටොනින් හෝර්මෝනය වයස්ගතවීම පාලනය කරන්න අපිට උදව් වෙනවා. ඒ නිසා දවසට පැය අටක සුව නින්දක් ලබාගන්න.

වැදගත්ම දේ මානසික සුවතාවය පවත්වගන්න එක. ඒකට මුලින්ම හතළිහෙන් පස්සේ සේරම ඉවරයි කියන මානසිකත්වයෙන් මිදෙන්න. වැඩිහිටි උදවිය නටන්න හොඳ නැහැ, සිංදු කියන්න හොඳ නැහැ වගේ එකකුත් අපේ සමාජේ තියෙනවනේ. වැඩිමල් උදවිය කරාපු ටික්ටොක්වලට එහෙම සෑහෙන පිරිසක් හිනාවෙනවා මම දැකලා තියෙනවා. කවුරු මොනවා කිව්වත් වයසට ගියාම තමන්ගේ විනෝදාංශ අතාරින්න ඕනේ නැහැ. විනෝද චාරිකා යන්න. නිතරම සතුටින් ඉන්න. එතකොට මානසික සුවය සමබරව පවත්වගන්න ලේසියි.

ඊළඟ දේ ව්‍යායාම. 40න් පස්සේ ව්‍යායාම කරනවා නම් ඇඟත් හැඩයි, ලෙඩත් අඩුයි. හැබැයි අවාරෙට පොල් වැටෙනවා වගේ නෙමේ. නිසි උපදේශකයෙක් යටතේ අවම සතියකට තුන්පාරක්වත් ව්‍යායාම කරන්න. එහෙම නැත්තම් ගෙදරදි දිනපතාම සරල ව්‍යායාම කරන්න, ඇවිදින්න, බයිසිකල් පැදීම, පිහිනීම වගේ දේ කරන්න.

සීනි කන තරමට නාකිවෙන වේගේ වැඩිවෙනවා. ඉතින් 40න් පස්සේ සීනි වගේම තෙල් සහ අධික ලුණු සහිත ආහාරත් 60%කින් පාලනය කරන්න ඕනේ. පිෂ්ඨය වැඩි ආහාර වෙනුවට ප්‍රෝටීන වැඩි කෑම කන්න. රතු පාට බත්, දේශිය සහල්වලට මාරුවෙන්න.

දිනපතාම සලාදයක් නැත්තම් මැල්ලුමක් කන්නම ඕනේ. කෙසෙල්, ඇපල්, වැලි අනෝදා, පොඩි මාළු, බිත්තර සුදුමද, මුංඇට, කව්පි, සුදුලූනු, නිවිති, බතල, කැරට්, ඕට්ස් වගේ කෑම වැඩියෙන් කන්න.

වයස්ගත වෙද්දි ආහාරවල පෝෂ්‍ය සංඝටක ශරීරයට උරාගන්නවා ටිකක් හොරයි. ඒ නිසා වෛද්‍ය නිර්දේශ මත විටමින් B12, විටමින් D, ඔමෙගා 3, ෆෝලික්, මැග්නීසියම් වගේ ශරීරයට අත්‍යවශ්‍ය සංඝටක වර්ග ලබාගන්න. මාසිකව ඇස් සහ දත් පරීක්ෂා කරගන්න.

ඔය ටික කරනවා නම් වයස කියන්නේ අංකයක් විතරයි කියලා මැරෙනකල් ෆිට් එකේ ඉන්න පුළුවන්.

ඉතින් කවුරු වෙන්නද කැමති?

දත් නැති කට පෙන්නලා හිනාවෙන, හම රැළිවැටුණු ආච්චිද? නැත්තම් වයස හිතාගන්න බැරි ලස්සන ෆිට් අර්නස්ටින් ආච්චිද?

සෙව්වන්දි
හෙට්ටිආරච්චි




> 40න් පස්සෙ සේරම ඉවරයි කියන මානසිකත්වයෙන් මුලින්ම මිදෙන්න

# ධරණී

**ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්**

අංක 91, විජේරාම මාවත,
කොළඹ 07.

දුරකථන
0115 200 900

බෙදාහැරීමේ අංශය
0112 127204

දැන්වීම් අංශය
0112672801 - 0112672603

ෆැක්ස්
0112 673 451

දැන්වීමයි

# ආතරයිටිස් රෝගයෙන් දුක් වින්දා දැන් ඇති ?

## ජා ඇල ජී.ටී.සි. වෙත එන්න (විශේෂ ප්‍රතිකාර)

**අවුරුදු 54ක පළපුරුදු වෛද්‍යවරයෙක් හමුවී ඔබගේ රෝගය සුව කර ගන්න**

දේශිය පරම්පරාගත ප්‍රතිකාර, ආයුර්වේද හෝමියෝපති ප්‍රතිකාර ගැනිමේදි එම වෛද්‍යවරයාගේ පලපුරුද්ද විශේෂයෙන් අවශ්‍යවේ. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ඖෂධ 3000කට අධිකව ඇත. පලපුරුදු වෛද්‍යවරු මෙම ඖෂධ සම්බන්ධව පලපුරුද්දක් හා දැනමක් ඇත. එම නිසා සෑම විටම පලපුරුදු වෛද්‍යවරයෙක් හමුවන්න. ඔබගේ රෝගයට ස්ථිර සුවයක් ලබාගන්න ජා ඇල පී.ටී.සි වෙත පැමිණෙන්න.

පොතු කබර, සුදු කබර, දද, කුෂ්ඨ, සමේ ඇතිවන පරණ තුවාල, ලප කැලැල් ඇතුලු සමේ ඇති වන සියලුම චර්ම රෝග සඳහා විශේෂ ප්‍රතිකාර අප සතුව ඇත.

ගැස්ට්‍රයිටිස්, අක්මාවේ තෙල් බැඳීම, වකුගඩුවල හා මුත්‍රාශයේ ගල් ඇතිවීමට (මුත්‍රාශයේ ඇති වන ගල් දියකර හැරීමට විශේෂ ප්‍රතිකාර ඇත.

**කාන්තාවන්ගේ දරුඵල නැතිවීම සම්බන්ධව ද ප්‍රතිකාර කරනු ලැබේ.**

**දියවැඩියා රෝගය නිසා ඇති වූ ස්නායු දුර්වලතාවයන් සම්බන්ධව ද විශේෂ ප්‍රතිකාර කරනු ලැබේ.**

**ඇදුම, පීනස, තරුණ අයගේ අකලට හිසකෙස් යාම, අකලට හිසකෙස් පැසීම**

**ස්ත්‍රී පුරුෂ සියලුම ලිංගික දුර්වලතා හා සමාජ රෝග සඳහා ප්‍රතිකාර**

දේශීය ආයුර්වේද, රස වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති (ජර්මන් ප්‍රතිකාර) බයෝකෙමික්ස්, පෙර අපරදිග ප්‍රතිකාර

**දුර බැහැර රෝගීන් දුරකථනයෙන් දිනයක් සහ වේලාවක් ලබා ගෙන පැමිණෙන්න.**
**රෝග පරීක්ෂණය : පෙ.ව. 9.45 සිට ප.ව. 4.30 දක්වා විවෘතව පවතී**

G.T.C DRUGS (LANKA)

ඉරිදා දින හා පෝය දිනවල, රජයේ නිවාඩු දිනවල වසා ඇත.
හමුවීම : G.T.C අංක 14, දුම්රියපළ ඉදිරිපිට, ජා ඇල
0112 236250/ 0112 242804/ 0112 241312/
0773 995134/ 0722 265099

ප්‍රතිකාර සඳහා ජා ඇල දුම්රියපළට ඇතුළුවන දොරටුවට ඉදිරියෙන් දකුණු පසින් ජී.ටී.සී වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටා ඇත.

HNB FINANCE

**දිරියට සවියක්**
සැබෑ වීර්යවන්තයින් සොයා..

# සකපෝරුව මත විස්කම් නිමැවුම් මවන

## - රෝහිණීලාගේ කතාව

**“නිශ්චිත හැඩයක් නොගන්නා පස් ගොඩකට හැඩයක් ලබා දිය හැකි විශ්මිත දෑතක් ඈ සතුය. හොඳින් පදම් කර ගත් මැටි පිඩ සකපෝරුවෙහි තබා කරකවන වේගයට යුහුසුලු වන රෝහිණීගේ දෑත් තවත් තත්පර කිහිපයකින් මැටි පහනක්, කිරි හට්ටියක් හෝ ගුරුලේත්තුවක හැඩය සකපෝරුව මත මවන්නේ අප දෑස් විශ්මයට පත් කරමිනි.**
**කඩුවෙල ලෝ ලෙවල් පාරේ නවගමුව, රණාල පසුකරන කවරෙකුට වුව පාර දෙපස අලෙවිය පිණිස තබා ඇති විසිතුරු මැටි බඳුන් යායෙන් නෙත් ඉවතට ඇද ගැනීම ලෙහෙසි පහසු කරුණක් නොවේ.එම විසිතුරු මැටි බදුන් යාය අතරින් රණාල සූඩවිල පාර දිගේ මදක් දුර යන අපට රෝහිණී අනුරාලතාගේ මැටි වැඩ පොළ හමුවේ. ”**

දින කිහිපයකට පෙර තනා අවසන් කළ මැටි පහන් තොගයක් පෝරනුවේ දමා පුළුස්සන්නට ලකලෑස්ති වෙන අතරතුර ඇගේ ව්‍යාපාරය පිළිබඳ තොරතුරු විමසන්නට අපි ඇගේ කාලයෙන් මොහොතක් උදුරා ගත්තෙමු.
අපි මැටි කර්මාන්තය පරම්පරාවෙන් ම කරගෙන එන උදවිය. අවුරුදු 32 ක පමණ කාලයක් පුරා මම කරන්නේ මේ ව්‍යාපාරය. වළං, කිරි මුට්ටි, පාත්තර, මැටි පහන්, ආරක්ෂක මුට්ටි මේ වගේ මැටි ආශ්‍රිත නිෂ්පාදන ගණනාවක් අපි නිෂ්පාදනය කරනවා. මාත් එක්ක මේ වැඩේට මගේ දුවලා දෙන්නත් හවුල් වෙලා වැඩ කරනවා. ඒ වගේම තව හතර දෙනෙක් මගේ ලග වැඩ කරනවා.
අපි මැටි ගේන්නේ හේන්පිට ඇඹුල්ගල කියන ප්‍රදේශ වලින්. මෙහෙ ඉඳන් ටිකක් දුරයි. මේ නිසා අමුද්‍රව්‍ය වලට වගේම ප්‍රවහනය සදහාත් විශාල වියදමක් දරන්න අපිට සිද්ධ වෙනවා.

රෝහිණී HNB FINANCE දිරිය ණය ක්‍රමය සමඟ සම්බන්ධ වන්නේ 2014 වසරේ දීය. ඒ ව්‍යාපාරය සඳහා අවශ්‍යවන මැටි සහ අනෙකුත් අත්‍යවශ්‍ය දෑ මිලදී ගැනීම සඳහාය. HNB FINANCE සමාගමෙන් ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර වලට ණය දීම සඳහා ම හඳුන්වා දෙනු ලැබූ “දිරිය ණය” ක්‍රමය රෝහිණීට පිහිට වූ අයුරු ඇය අප සමඟ පැවසුවේ මෙසේයි,



ව්‍යාපාරයට අවශ්‍ය මැටි මිලදී ගැනීම සඳහා තමයි මං මුලින්ම HNB FINANCE සමාගමෙන් රුපියල් විසිපන්දාහේ ණය මුදල ලබා ගත්තේ. එම ණය මුදල ගෙවලා ඉවරවෙලා ඊට පස්සේ රුපියල් පනස් දාහේ ණය මුදලත් රුපියල් ලක්ෂ දෙකහමාරෙ ණය මුදලත් ලබාගත්තා මම අන්තිමට ගත්තු ලක්ෂ තුනේ ණය මුදල ගත්තේ මැටි අඹරන මැෂින් එකක් ගන්න ඒ 2021 අවුරුද්ද අන්තිමේදී.
අපි හදන නිෂ්පාදන රණාල, නවගමුව, බෙල්ලන්විල වගේ ප්‍රදේශවල අලෙවි කරනවා .
ඉතා පුංචි ව්‍යාපාරයක් විදිහට පටන් ගත්තු මගේ මේ ව්‍යාපාරය අද වෙනකොට සෑහෙන මට්ටමකට ඉදිරියට ගේන්න මට පුළුවන් වුණේ HNB FINANCE සමාගමෙන් ලැබිච්ච සහයෝගය නිසා මොකද මේ ව්‍යාපාරයේදි අපිට සමහර වෙලාවට මුලින් මුදල් ලැබෙන්නෙ නෑ. විකුණලා මුදල් ගෙවන පොරොන්දුවට බඩු දෙන වෙලාවලුත් තියෙනවා. ඒත් අපි අමුද්‍රව්‍ය මිළදී ගන්න ඕනේ අත්පිට මුදලට.අද වෙද්දි වැඩි වුණු ඉන්ධන මිල නිසා අපිට ඒ සදහා ලොකු මුදලක් දරන්න වෙනවා. ඒ වියදම් භාන්ඩවල මිලට එකතු වුණාම අපේ නිශ්පාදන වලට තියෙන ඉල්ලුම අඩුවෙනවා. මේ තත්වය මත අපි මේ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ බොහෝ දුෂ්කරතා මැදයි. ඒ වගේ වෙලාවක මේ විදිහට ණය මුදලක් ලබාදීලා ව්‍යාපාරය නොවැටී පවත්වාගෙන යන්න HNB FINANCE වෙතින් ලැබෙන සහයට මම විතරක් නෙවී සූඩවිල අවට මේ රස්සාවෙන් ජීවත්වෙන HNB FINANCE සමාගමෙන් ණය අරන් මැටි කර්මාන්තය පවත්වාගෙන යන පහළොවක් විස්සක් විතර වුණු පවුල්වල හැමෝම ස්තූතිවන්ත වෙනවා. ණය ලබාගැනීමට විතරක් නෙවී HNB FINANCE සමාගම නොමිලයේ විවිධ පුහුණු වැඩසටහන් පවත්වමින් මූල්‍ය සාක්ෂරතාව පිළිබදව දැනුවත්කිරීම් කරනවා වගේම ඉතුරු කිරීම් වලටත් අපිව යොමුකරවනවා අපේ ජීවිත එක්ක සම්බන්ධ හැම කාරණයකදීම HNB FINANCE වෙතින් ලැබෙන මේ සහාය අපිට මහමෙරක් තරම්.

**ඔබගේ ව්‍යාපාරික අවශ්‍යතාවන් සඳහා අමතන්න 0112024848 අංකයට. නැතහොත් HNB FINANCE අපගේ මූල්‍ය සේවාවන් පිළිබඳව ඔබ කැමති භාෂාවකින් වැඩිදුර විස්තර දැනගැනීමට www.hnbfinance.lk අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.**

**සටහන - මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි**
**ඡායාරූප - විනෝද් නයනප්‍රිය**



**රන් පවුමකට රු.170,000/- ක**
**වැඩිම මුදල අපෙන්**



**අවම පොලිය**
**සේවා/ලියකියවිලි හෝ සැඟවුණු ගාස්තු නොමැත**

හරහා ණය වාරික ගෙවීමේ පහසුකම

- වෙළෙඳපොලේ **අඩුම පොලිය**
- විශ්වාසනීය **කඩිනම් සේවය**
- ඕනෑම වේලාවක **බේරා ගැනීමේ අවස්ථාව**
- සහනදායී ලෙස **ටික ටික ගෙවීමේ හැකියාව**

ඇතුළුව සුහදශීලී හා කඩිනම් සේවාවක් සමගින් **අපෙන් ඔබට වටිනා රන් ණයක්...**

එමෙන්ම අපගේ තවත් සුවිශේෂි සේවාවක්,
**වෙනත් ආයතනවල හෝ බැංකුවල උකසට තබා ඇති රන් භාණ්ඩ** අප ආයතනය මගින් **බේරා**, ඉහළම මුදලක් ඔබේ අතට ලබාගන්න. ලබාගත් රන් ණය **ටික ටික ගෙවා බේරාගන්න.**

HNB FINANCE
රන් ණය

011 202 48 48
hnbfinance.lk



# පාර්ලිමේන්තුවේ කොච්චර මඩ ගැහුවත් අපිනම් තාමත් ජීවත්වෙන්නේ මහගෙදර

**දියවන්නාවේ වෙසෙන ඇත්තන්ගේ අධ්‍යාපන සුදුසුකම් පිරික්සන්නට ගියොත් බාගෙට බාගයකගේ පැටිකිරිය ඒ හැටි හොඳ නැත. දේශපාලන කරලියේ විවේචන සහ මඩගැසීම් කෙසේවෙතත් මේ කියන පුද්ගලයාටනම් එහෙව් ප්‍රශනයක් නැත. මහාචාර්යවරයෙක් ලෙස රජරටින් පාර්ලිමේන්තුවට පැමිණි ඔහු වෙන කවුරුත් නොව හිටපු සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන ය. නමුත් මේ කතාබහ නම් ඔහු සමඟ නොව ඔහුගේ ආදරණීය බිරිඳ රුවී ජයසුමන සමඟිනි.**

**රුවීට චන්නව මුලින්ම මුණගැහුනේ කොහොමද?**

චන්නගෙයි මගෙයි පවුල් දෙකේම ගොඩක් ළඟ හිතවත්කමක් තිබුණා. ඒත් චන්නයි මමයි වැඩියෙන්ම හිතවත් වුණේ අපි දෙගොල්ලන්ගෙම පවුල්වල හිතවතෙකුගේ සාදයකදි. අන්තිමට ඒ තිබුණ හිතවත්කම් නිසා ගෙවල්වල යන්න එන්න ගත්තට පස්සේ යාළුකම ආදරයකට පෙරලුණා. පස්සේ අපි දෙන්නා ගෙවල් දෙකේම අයගේ ආශිර්වාදයත් එක්ක 2014දි විවාහ වුණා.

**විවාහයෙන් පස්සේ කොහෙද පදිංචියට ගියේ?**

මගේ ගම දෙහිවල. ඒ නිසා අපි දෙන්නා බැඳලා දෙහිවල මගේ මහගෙදර තමයි පදිංචි වුණේ. දැන්නම් ඉතින් නිලනිවාසෙත් තියෙනවා. ඒත් අපි වැඩිපුරම ඉන්නේ දෙහිවල ගෙදර.

**ඒ වෙනකොට චන්න මොනවද කළේ?**

මට චන්නව මුලින්ම මුණගැහෙනකොටත් එයා රජරට විශ්වවිද්‍යාලයේ කථිකාචාර්වරයෙක්. ඒ වගේම වෛද්‍යවරයෙක්.

**ඔබත් රැකියාවක් කරපු කෙනෙක්ද?**

ඔව්. මම ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිධාරිනියක්. පෞද්ගලික ආයතනයක සහකාර වෙළඳ කළමනාකරිනියක් විදියට තමයි රැකියාව කළේ. ඒත් විවාහවෙලා බබාලා ලැබුණාට පස්සේ පවුල සහ දරුවෝ වෙනුවෙන් කැපකිරීමක් කරලා රැකියාවෙන් ඉවත් වුණා. ඒ වුණාට දැන් මම මගේම කියලා ව්‍යාපාරයක් කරගෙන යනවා.

**ඔබ වැඩිපුරම කැමති චන්න ජයසුමන කියන මහාචාර්යවරයාටද? ඇමතිවරයාටද?**

මට ඔය දෙකේම විශේෂත්වයක් පේන්නේ නෑ. මොකද කාලයත් එක්ක තනතුරු වෙනස් වෙලා ඉහළ පහල ගියාට එයා මගේ මහත්තයා.

**ඒත් ලංකාවේ දේශපාලනය ගැන බහුතරයක් මිනිස්සුන්ගේ හිත්වල වැඩි පැහැදීමක් නෑ. ඒ නිසා චන්නට දේශපාලනයට එන්න නොදී මහාචාර්යවරයෙක් විදියටම රස්සාව කරන් ඉන්න කියන්න හිතුණේ නැද්ද?**

කොහෙත්ම නෑ. මොකද චන්න කියන්නේ පැහැදිලි අරමුණක් ඇතුව රටට සේවයක් කරන්න හිතාගෙන දේශපාලනයට ආපු කෙනෙක්. නමුත් මිනිස්සු හැමෝගෙම මතය එක වගේ නැති නිසා චන්නටත් කැමති වගේම අකමැති මිනිස්සු ඇති. ඒ සේරටම වඩා අපේ රටේ යහපත් දෙයක් කරන්න ගියාට පස්සේ දේශපාලන ප්‍රතිවාදීන්ගේ මඩගැහීම් වැඩියි. ඉතින් ඒ වගේ දේවල් නිසා මං මොකටද මගේ මහත්තයා යහපත් චේතනාවකින් යන ගමනක් කකුලෙන් ඇදලා වළක්වන්නේ? බිරිඳ විදියට එයාගේ ගමනට තවත් හයියක් වෙනවා මිසක් කවදාවත් මම එපා කියන්නෙ නෑ.

**ඒත් ඔබ ඔය විදියට ඔහුට සුදුහුණු ගාන්නේ ස්වාමිපුරුෂයා නිසා කියලා කෙනෙකුට කියන්න පුළුවන්නේ?**

කාටහරි එහෙම කියන්න පුළුවන්. මොකද ලංකාවේ දේශපාලනය කරනවා කියන්නේ පරම්පරා හතකට හම්බ කරගන්න අවුරුදු පහකට හම්බෙන ලයිසන් එකක් වගෙයි දැන් ජනතාව දකින්නේ. ඒත් ඉතින් එහෙමයි කියලා හැමෝම එකම බෝට්ටුවට දාන එක වැරදිනේ.

**දේශපාලන තීන්දු තීරණ ගනිද්දි ඔහු ඔබත් එක්කත් කතාබහ කරනවද?**

අනේ නෑ. දේශපාලනය ගැන මට ලොකු දැනුමකුත් නෑ. ඒ වගේම ඒ දේවල් මට අදාළත් නෑ.

**පහුගිය කොරෝනා කාලේ මිනිස්සුන්ට බෙහෙත් ගන්න තිබුණු සල්ලිවලින් චන්න ඔබට රේන්ජ් රෝවර් එකක් අරන් දුන්නා කියන්නේ ඇත්තද?**

ඔය කතාව පාර්ලිමේන්තුවේ කතා කරනකොට මම හිටියේ දරුවාගේ ඉස්කෝලෙට ගිහිල්ලා. එතකොටම මගේ යාළුවෙක් මට කෝල් කරලා කිව්වා රුවී අන්න බෙහෙත් සල්ලි යටිමඩි ගහලා ඔයාට රේන්ජ් රෝවර් එකක් අරන් දුන්නා කියලා චන්නට පාර්ලිමේන්තුවේ හොඳටම බනිනවා කියලා. ඒ විතරක් නෙවෙයි චන්න මට කෝටි ගාණක ගෙයක් අරන් දුන්නා කියලාත් අපිට මඩ ගැහුවා. හැබැයි ඉතින් චන්න ඔය කියන විදියේ ගෙවල්, රේන්ජ් රෝවර් මට අරන් දීලා නෑ. මං අර කලින් කිව්වා වගේ අදටත් අපි දෙන්නා ඉන්නේ දෙහිවල අපේ මහගෙදර. පදින්නේ එකම වාහනේ.

**ඉතින් ඔහොම මහත්තයාට බොරු චෝදනා කරලා බනිනකොට දුක හිතිලා නැද්ද?**

මොකද නැත්තේ? මේවා ඇහෙනකොට මට දුක හිතිලා විතරක් නතර වෙන්නේ නෑ තරහත් යනවා. අනික ඔය රේන්ජ් රෝවර් කතාවට නම් චන්නයි මමයි දෙන්නා ගෙදරදි හිනහත් වුණා. මිනිස්සු දන්නේ නෑ වැඩ කරනකොට ඒවාට අදාළ තීන්දු තීරණ ගන්නේ එවෙලෙට ඉන්න ඇමතිවරයා නෙවෙයි අදාළ කමිටුවලින් කියලා. එහෙමයි කියලා අපිටත් ඔය දේවල් ඉවසගෙන ඉන්නවා ඇරෙන්න තනි තනි පුද්ගලයා ළඟට ගිහිල්ලා තේරුම් බේරුම් කරලා දෙන්න බෑනේ.

**හරි අපි දැන් ටිකකට පාර්ලිමේන්තුවෙන් ගෙදර පැත්තට හැරෙමුකෝ. පවුලේ තව කවුද ඉන්නේ?**

මායි, චන්නයි ඇරුණහම දුවලා දෙන්නයි, පුතයි.

**චන්න දේශපාලන තීරණ ගැන ඔබත් එක්ක කතාබහ කරන්නේ නෑ කිව්වනේ. එතකොට පවුලට සම්බන්ධ තීන්දු තීරණ ගනිද්දි කතාබහ කරනවද?**

අනිවාර්යයෙන්ම ඔව්. ඒවා ඉතින් එයා මාත් එක්ක කතා නොකර වෙන කාත් එක්ක කතා කරන්නද? දරුවන්ගේ සහ අපේ පවුලේ දේවල් ගැන තීරණ ගන්නකොට එයා මගෙනුත් අනිවාර්යයෙන්ම අහනවා.

**ඔය වගේ කාර්යබහුල ජීවිතයක් ගෙවද්දි චන්නට පවුලත් එක්ක ඉන්න වෙලාව තියෙනවද?**

ඇත්තටම වෙලාව නම් හරිම අඩුයි. ඒත් එහෙමයි කියලා එයා එයාගෙන් අපිට වෙන්න ඕනෙ යුතුකම් වගකීම් කවදාවත් අමතක කරන්නේ නෑ.

**මාධ්‍ය ඉස්සරහ අපි දකින චන්න නම් බොහොම නිවුණ චරිතයක්. ගෙදර ඉන්නෙත් ඒ චන්නමද?**

ඔව්. එළියෙදි ඉන්න චන්නම තමයි ගෙදරත් ඉන්නේ.

**චන්න වැඩිපුරම කැමති ගෙදරින් කන්නද? පිටින් කාලා එන්නද?**

කොහොමටත් ගෙදරින් කන්න තමයි වැඩිපුරම කැමති. හැබැයි චන්න කාර්යබහුල නිසා සමහරක් වෙලාවට පිටින් කාලා එන වෙලාවලුත් තියෙනවා.

**ඔබට ඉන්නේ අවුරුදු හය, හතර, එකහමාරක වගේ පුංචි දරුවෝ තුන්දෙනෙක්. චන්න වැඩිපුරම උදව් කරන්නේ ළමයින්ගේ වැඩවලටද? කුස්සියේ වැඩවලටද?**

එයා වැඩිපුරම කැමති ඉඩ තියෙන හැමවෙලාවෙම බබාලා තුන්දෙනාගේ වැඩවලට උදව් වෙන්න තමයි. සමහරක් වෙලාවට මම කුස්සියේ වැඩ ටික කරගන්නකල් එයා දන්නේ නැති දේවල් මගෙන් අහගෙන බබාලගේ වැඩ ටික කරනවා.

**චන්නට රහටම උයන්න පුළුවන් කෑමක් එහෙම නැද්ද?**

අපෝ මොන වැඩේ කළත් අපේ මහත්තයට උයන්න නම් බෑ. හදිසියකට හරි කුස්සියට ගියොත් මුළු කුස්සියම කණපිට හරවනවා.

**ඔහු කැමති විනෝදාංශ එහෙම මොනවද?**

එයාට වැඩිපුරම තියෙන්නේ ක්‍රිකට් පිස්සුව තමයි. මැච් එකක් තියෙනවා කිව්වොත් වාහනේ යන එන ගමන් හරි ඒක බලනවා. ඊට අමතරව ඉතින් නිවාඩුවක් ලැබුණ හැටියේ රුවන්වැලි මහා සෑය වැඳලා එන්න යනවා. රටේ ලෝකේ කොහේ ඇවිදින්න ගියත් එයා වැඩිපුරම කැමති රුවන්වැලි සෑය ළඟට ගිහින් හිත නිදහසේ වාඩිවෙලා ඉන්න.

**හිටපු ඇමති බිරිඳක් විදියටත්, ව්‍යාපාරික කාන්තාවක් විදියටත් රටේ අනෙකුත් කාන්තාවන්ට ඔබට මොනවද කියන්න තියෙන්නේ?**

මෙහෙමයි. අපේ රටේ ගොඩක් කාන්තාවන්ගේ තියෙන දුර්වලකම තමයි ගෙදරට වෙලා ස්වාමියාගෙන් යැපෙන්න බලන් ඉන්න එක. මම නම් කියන්නේ බිරිඳක් ස්වාධීන වෙන්න ඕනේ කියලා. දරුවොන්ගේ වැඩත් එක්ක රැකියාවක් කරන්න බැරි නම් අඩුම තරමේ ගෙදරට වෙලා ස්වයං රැකියාවක්වත් කරන්න පටන්ගන්න. මොකද ඒ විදියට තමන්ටත් කියලා අරමුණක් තියෙනකොට ජීවිතය හරි ලස්සනට සතුටින් ගෙවන්න පුළුවන්. මං කියන විදියට දෙයක් කරන්න උත්සාහ කළොත් හැමදේටම මහත්තයාගේ සාක්කුවට අත දානවට වඩා කොයිතරම් හොඳද කියලා ඔබටම තේරුම් යයි.



**චන්න කියන්නේ ක්‍රිකට් පිස්සෙක්. හැබැයි එයාට උයන්න නම් බෑ. හදිසියකට හරි කුස්සියට ගියොත් මුළු කුස්සියම කණපිට හරවනවා.**

ලිහිණි මධුෂිකා




# කටු ගහලා ඒ කටුවලින් එල්ලද්දී මං කොච්චර ශක්තිමත් කෙල්ලෙක්ද කියලා හිතුණා

**මේක සංස්කෘතියට කරපු අභියෝගයක් නම් නෙවෙයි**







පසුගිය ඔක්තෝබර් 23 වැනි ඉරිදා ඉර බහින හෝරාවේ වෙනස්ම කටයුත්තක් වෙනුවෙන් මට ගාල්ල, අහංගම ප්‍රදේශයට යන්නට සිදුවිය. මා එහි යනවිටත් දේශීය තරුණ තරුණියන්ගෙන් පමණක් නොව විදේශිකයින්ගෙන්ද එම ස්ථානය පිරී ඉතිරී තිබුණි. එම අවස්ථාව ගැන කිසිඳු අවබෝධයක් නොතිබූ නිසාදෝ එක්වරම මට දැනුණේ මා වට කීපයක් කරකවා එහි තබා ඇති සෙයකි. මන්ද මා හැරුණුකොට එතැන සිටි සියල්ලන්ම සිටියේ අමුතුම හැඩයකිනි. ඒ අතරින් ගැහැනුද පිරිමිද කියා වෙනසක් නැතිව බොහෝදෙනෙකුගේ ඇඟේ ටැටූ ඇඳ තිබීම නිසා මොකක් නමුත් එය ටැටූ හා සම්බන්ධ වැඩසටහනක් බව නම් මට පැහැදිලි විය.

ඒ අතරවාරයේ එක්වරම එතැන උන් තරුණියක් දෙසට කාගේත් අවධානය යොමුවිය. ඇයගේ ශරීරයේද අලංකාර ටැටූ කීපයක් තිබුණි. මොකක් නමුත් ඇය අමුතුම අඩවිවකට සැරසෙන බව නම් ඒ වනවිට මට පමණක් නොව එතැන උන් සියල්ලන්ටම වැටහී තිබුණි. අලේ බහිනකල් හිටියත් තැම්බෙනකල් ඉන්න බෑ කිව්වාක් මෙන් ඊළඟ මොහොතේ ඇය කරන්නට යන්නේ කුමක්දැයි දැකගන්නා තෙක් මගේ හිතද කුතුහලයෙනි.

සුළු මොහොතකින් රැස්ව සිටි පිරිස මැදට පැමිණි හැඩකාර තරුණිය බිම ඉඳගත්තාය. අනතුරුව පිරිමින් කීපදෙනෙකු පැමිණ ඇගේ නිරාවරණය වී තිබූ කොන්ද ප්‍රදේශයේ කටු ගැසූහ. මට එක්වරම සිහිවූයේ ඇසළ මහට පවත්වන කතරගම පෙරහරයි. මන්ද මීටපෙර ඇඟේ උල් කටු ගැසූ මිනිසුන් මා ඇස්දෙකට දැක තිබුණු එකම තැන එතැනය. එහෙත් එවැනි තැනකදීවත් ඇඟේ කටු ගැසූ ගැහැනුන් මා දැක තිබුණේ නැත. ඒ නිසාම මෙකී තරුණිය ගැන වූ උනන්දුව මට තවත් වැඩිවිය. ගතවූයේ සුළු මොහොතකි. එක්වරම ගැසූ කටුවලින් ඇය සෙමෙන් සෙමෙන් ඉහළට එසවෙන්නට විය. දැන් ඇය මට වඩා අඩි ගණනක් උඩින් ඉහළ අහසේ කොන්දට ගසා තිබූ කටු ආධාරයෙන් ඔසවා තිබේ. ඇත්තම කිව්වොත් ඉහළ ගිය ඇයට වඩා රිදුනේ පහල උන් මටය. නමුත් තරුණියට නම් ගාණක්වත් තිබුණේ නැත. මා එහෙම කියන්නේ එල්ලෙමින් සිටියදීම ඇය ඉදිරිපත් කළ සරාගී නර්ථනය නිසාය.

**"මේකි නම් යක්ෂ කෙල්ලෙක්."**

ඒ එතැන උන් බොහෝදෙනෙක් ඇගේ හැකියාව ගැන නොයෙකුත් කතා කියද්දී මට සිතුණු හැටිය. තවත් විනාඩි කිහිපයක් ගතවෙද්දී ශරීරය පුරා කටු ගසා එල්ලා සිටි තරුණිය බිමට පහත් කරන්නට විය. ඒ මොහොතේ නම් ඇය සමඟින් වචනයක් හෝ කතා කර යන්නටයි මට හිතුණේ.

**"ගංඟාවන් හරහා මුහුදට ගසාගෙන යන ප්ලාස්ටික් හා කැලිකසල මුහුදට යාම වැළැක්වීම තමයි මේ වැඩසටහනේ අරමුණ වෙන්නේ. ඉතින් වෙරළ ආශ්‍රිත පරිසරය රැකගනිමු කියන තේමාව උඩ තමයි වෙරළ සුද්ධපවිත්‍ර කිරීමේ මේ වැඩසටහන පැවැත්වුණේ. ඒ වෙනුවෙන් ලංකාවට ආපු විදෙස් ටැටූ ශිල්පීන් සතුටු කරන්න තමයි ඔය ගෑනු ළමයා මෙහෙම ඉදිරිපත් කිරීමක් කළේ."**

ඒ එතැන උන් තරුණයෙක් එම සිද්ධිය ගැන මා සමඟ කළ කෙටි පැහැදිලි කිරීමය. නමුත් ඒ අතරවාරයේ පවා මගේ ඇස් තිබුණේ කටු ගැසූ තරුණිය වෙතය. මට උවමනාව තිබුණේ ඇය ලවාම මගේ ප්‍රශ්නවලට උත්තර අරගැනීමටයි.

## කටු ගහන්න කලින් මම පේ වුණේ නෑ



**"කිව්වත් වගේ මේ වැඩසටහන වෙනුවෙන් ලංකාවට ආපු ජාත්‍යන්තර ටැටූ ශිල්පීන්ගේ ආශ්වාදය වෙනුවෙන් තමයි මං මේ වැඩේ කළේ. ඒ වෙනුවෙන් මට කතා කළේ ලංකාවේ ප්‍රවීණ වගේම ප්‍රසිද්ධ ටැටූ ශිල්පියෙක් වෙන සජී සර්. එයා කිව්වා ජාත්‍යන්තර ටැටූ ශිල්පීන් සතුටු කරන්න පුළුවන් විදියේ Body Suspension Event කීපයක් සූදානම් කළා එන්න කියලා. සජී සර් කියන්නේ මගේ සැමියගේ යාළුවෙක්. ඉතින් එයාලගේ යාළුකම එක්ක මට බෑ කියන්න බැරිවුණා."**

ඇය කොළඹ, මෝදර ප්‍රදේශයේ තරුණියක වන පියුමි සෙව්වන්දි නානායක්කාර ය.

**"මං කෝවිල් සහ දේවාල මංගල්‍යයවල වගේම පෙරහර මංගල්‍යයවල එහෙම කටු ගහනවා දැකලා තියෙනවා. ඒ නිසා මුලින් කැමති වුණත් පස්සේ බයටම මං සැමියට කිව්වා මට මේ වැඩේ කරන්න බෑ කියලා. ඒත් එයා කිව්වා නෑ ඔයාට මේ වැඩේ කරන්න පුළුවන් කරන්න කියලා. කොහොම හරි මං හිත ශක්තිමත් කරගෙන හිටියා. මට බය තිබුණේ කටු ගහන එකට නෙවෙයි කටු ගහලා උඩට උස්සන එකට. මොකද මගේ ඇඟේ ටැටූ කීපයක් ගහල තියෙන හින්දා කටු ගහනවට ලොකු බයක් හිතුණේ නෑ. මට හිතුණේ ටැටූ ගහද්දි අර ඉඳිකටුවෙන් එන වේදනාව වගේ පොඩි වේදනාවක් දැනෙයි කියලා. ඒත් ඉහළට උස්සන එක මතක් වෙනකොට පුදුම බයක් දැනුණා."**

අවසානයේ ඇය බය පසෙක තබා කටු ගැසීම වෙනුවෙන් හිත ගලක් මෙන් හයිය කරගෙන තිබුණි.

**"කටු ගහද්දි නම් ඇත්තටම ටිකක් රිදුණා. ඒත් ඉහළට උස්සද්දි එහෙම වේදනාවක් දැනුණේ නෑ. මට ආවේ මං අහසේ පාවෙනවා වගේ හැඟීමක්. ඉතින් ආස හිතුණා. මුලදි තිබුණු බයත් නැත්තටම නැතිවෙලා ගියා. ඊටපස්සේ පොඩි නැටුමකුත් නටලමයි පහළට ආවේ."**

මා දන්නා පරිදි මෙකී කටුගැසීමට හෙවත් කටු පූජාවට ඇත්තේ දිගු ඉතිහාසයකි. එසේම එය දේව සංකල්පයන් හා බැඳී පවතින විශ්වාසයකි. එම විශ්වාසය වන්නේ දෙවියන් ඉදිරියේ කටු ගැසීමෙන් සිරුරේ ඇති සියලු වස්දෙස් දුරු වී ජීවිතයට සතුට උදාවෙන බවයි. තව දෙයකි. එනම් කිසිවෙකුට හෝ හිතුමතේ ශරීරයට කටු ගැසීමක් කළ නොහැකිය. ඊට යම් පිළිවෙතක් තිබේ. ඒ අනුව කටු ගැසීමට නියමිත අයෙක් කිලිවලට අසුනොවී දින ගණනක් පේවී ඊට සූදානම් විය යුතුය. මගෙන් ඇයට ලැබුණු ඊළඟ ප්‍රශ්නය වූයේ ඒකය.

**"ආගමික උත්සවවලදි කටුගහලා එල්ලන එකයි මං මෙතැනදි කටුවලින් එල්ලුණු එකයි දෙකක්. මං දන්න තරමින් ආගමික උත්සවවල කටුගහලා එල්ලෙන්නේ බාරහාර ඔප්පු කරන්න. ඒත් මං මෙතැනදි කළේ ටැටූ කලාව ඇතුළේ තියෙන ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රිය ප්‍රසිද්ධ Event එකක්. ඒක Body Suspension Event එකක් කියලයි කියන්නේ. ලංකාවට මේක තවමත් අලුත් අත්දැකීමක්. දන්න තරමින් මට කලින් අපේ රටේ කිසිම ගෑනු ළමයෙක් මේ Event එක කරලා නෑ."**

*එතකොට ඔයා කටු ගහන්න කලින් කිසිම පේවීමක් කළේ නැද්ද?

**"මං කිසිම පේවීමක් කළේ නෑ. මොකද මං කළේ Body Suspension Event එකක් මිසක් ආගමික දෙයක් නෙවෙයිනේ. ඒත් මං කිසිම පේවීමක් නැතිව ආගමික උත්සවයකදි වගේම කටුවලින් එල්ලුණු නිසා මිනිස්සු එක එක කතා කියලා තිබුණා. හැබැයි කියන්න ඕන මං මෙතැනදි කළේ කිසිම සංස්කෘතියකට අභියෝග කිරීමක් නෙවෙයි. මේ Event එක කරපු එකේ එකම අරමුණ වුණේ අපේ රටට ආපු ජාත්‍යන්තර ටැටූ ශිල්පීන්ට ආශ්වාදයක් දෙන්න සහ අපේ රටේ සංචාරක කර්මාන්තයට හොඳ ඉඩක් තියෙනවා කියලා පෙන්නන්න. හැබැයි ඒ හරහා ලංකාවේ මෙච්චර දක්ෂ කෙල්ලොත් ඉන්නවා කියලා එයාලා දැනගත්තා සහ මං කොච්චර ශක්තිමත් කෙල්ලෙක්ද කියලත් මං තේරුම්ගත්තා."**

පියුමි එසේ කියා සිනාසෙද්දී මට නිකමට මෙන් ඇගේ පෞද්ගලික තොරතුරක් දෙකක් දැනගන්නට සිතුනි.

**"පුංචි කාලේ ඉඳන්ම මට තිබුණේ ගුරුවරියක් හරි හෙදියක් හරි වෙන්න ආසාවක්. අවසානේ මට පුළුවන් වුණා හෙදියක් වෙන්න. හැබැයි ඒ වෘත්තියේ මං හිටියේ කෙටි කාලයයි. මොකද හෙද වෘත්තිය හරිම කාර්යබහුල වෘත්තියක්. වගකීම් වැඩියි. මං ටිකක් නිදහසේ ඉන්න ආස කෙනෙක්. ඒ ගැන හිතලා පස්සේ කාලේ මං හෙද වෘත්තියට සමුදුන්නා."**

මේ වනවිටත් සමාජ මාධ්‍යවලනම් පියුමි හරි ප්‍රසිද්ධය. කොතරම් ප්‍රසිද්ධද කිව්වොත් වෙනදාට හොයන පියුමිලා වෙනුවට අද කවුරුත් හොයන්නේ කටු ගැසූ පියුමිය. ඉතින් ප්‍රථම වතාවට ශ්‍රී ලංකාව තුළ එවැනි අභියෝගයක් භාරගත් ඇගේ ඉදිරි ගමනට සුබපැතුම් එක් කරමින්ම මා ඈ හා කතාබහ නිමා කළෙමි.

**රුවන් එස්.සෙනවිරත්න**

"කෙල්ලොම පහක් නේද?"

"කොල්ලෙකුත් හිටියනං හොඳයි."

"කෙල්ලො පහක් හදනවා කියන එක ලේසි නෑ."

කේ.රම්‍යලතා මැණියන්ට මෙවැනි කතා ඕනෑතරම් අසන්නට සිදුවිය. වැඩිමහල් දියණිය පෙරපාසලට රැගෙන යන විට ඇගේ අතේ දෙවැනි දියණියයි. කුසයේ තවත් දියණියකි. ඒ ගැන අවඥාවෙන් හිනැහුණු කිසිවකු හා ඈ වාද නොකළාය. සවිමත් ගසක් විලාසයෙන් ඒවා දරාගත් මැණියන් සහ සිරිල් ප්‍රේමනාත් පියාණන් අවධානය යොමු කළේ තම සෙවණේ වැඩෙන පැළ නිසි ලෙස පෝෂණය කිරීම ගැනයි. අද එහි ප්‍රතිඵල ලැබී ඇත. ඒ පැළ උස්මහත් වී සවිමත්ව තනිව නැගී සිටිනු දැකීම හැර වෙනත් සතුටක් දෙමාපියන්ට කොහින්ද?

ගාල්ල ගෝනපීනුවල ග්‍රාමයේ වාසය කරන සිරිල්-රම්‍යලතා යුවළට දියණිවරුන්ම පස්දෙනෙකි. සියලු දෙනා යැපුණේ පියාගේ මුහුදු රස්සාවෙනි. පරම්පරාවේ දේපළ හෝ බැංකු පොත්වල ලක්ෂ ගණනින් මුදල් ඔවුන්ට තිබුණේ නැත. එහෙත් පියා අපමණ වෙහෙස වී මුදල් ඉපැයුවා මෙන්ම ඒවා නැති නාස්ති නොකිරීමට වග බලා ගත්තේය. මවගේ මූල්‍ය කළමනාකරණය ඉතා ඉහළ මට්ටමකට තිබිණ. එනිසාමදෝ අගහිඟකම් කොතෙක් වුවද කිසිවකුට ණය නොවී දියණියන් උස්මහත් කිරීමට ඔවුහු සමත් වූහ. හෂිනි කසුන්තා, විෂානි වලොංගා, තමේෂි ලක්ෂිතා, තෙනුෂි නිමන්තිකා සහ හිමේෂි තරුෂිමා දියණිවරුන්ද ඒ අනුව හැඩ ගැසී ජීවත්වීම දෙමාපියන්ට පහසුවක් විය.

සහෝදරියන් පස්දෙනාම ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරුවේ ගෝනපීනුවල සාරාලංකාර ප්‍රාථමික විද්‍යාලයෙනි. පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමෙන් පසු දෙවැන්නිය විෂානි ගාල්ල රිපන් බාලිකාවටත්, සිව්වැන්නිය තෙනුෂි අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයටත්, බාලයා හිමේෂි ගාල්ල සංඝමිත්තා බාලිකාවටත් ඇතුළත් වූහ. හෂිනි සහ තමේෂි දියණිවරුන් රැඳී සිටියේ සාරාලංකාර මහා විද්‍යාලයේයි. දැඩි ආර්ථික අපහසුතා මත ජීවත්වන පවුලට තිදෙනෙකු ශිෂ්‍යත්වය සමත්ව නගරයේ පාසල් කරා යාම පහසු වූයේද නැත. නිවසේ සිට ගෝනපීනුවල හන්දියට කිලෝමීටරයක් පමණ පැමිණිය යුතුය. එතැනින් පිටත්වන එකම බස් රථය මග හැරුණොත් පාසල් යාම නවතී. එනිසාම මව පාපැදියක් පවා මිලට ගත්තාය. ආරම්භයේදී දරුවන් පාසල් වෑන් රථවලට යොමු කළද වැඩි කලක් යාමට පෙර ආර්ථිකය ඊට හරස් විය. ඒ සියල්ල අතරේ ශිෂ්‍යත්ව සමතුන්ට ශිෂ්‍යාධාර හිමිවීම පවුලට යම් සහනයක් විය. එය අනෙක් දරුවන්ට දිරිගැන්වීමක්ද විය. ප්‍රථමයෙන්ම ශිෂ්‍යාධාර ලැබුවේ විෂානි ය. ඈ එම මුදල් මවට දෙනවා බලා සිටි තෙනුෂි මවට පොරොන්දුවක් වූවාය.





# මමත් ලොකුවෙල
# අම්මට මොනර
# ගොඩක් ගෙනත්

## දෙගුරුන් හෙළු දහඩිය කඳුළුවල ණය ගෙවන්නට කැපවුණු එකම පවු අක්කා නගෝ පස්දෙනාගේ කතාව

අපේ ගෙවල් ගාව කුරුඳු තවානක් තිබුණා. අම්මා අපිව ඉස්කෝලෙ දාලා එතැන වැඩට ගියා. කුරුඳු පැළ දාන පැකට් හදන එකයි අම්මා කෙරුවෙ. එකකට සත 50ක් ලැබුණා. අපිත් ඉස්කෝලෙ ගිහින් ඇවිත් එතැනට ගිහින් හවස 5 විතර වෙනකල් උදව් කරනවා. එතකොට දවසකට රුපියල් තුන්සීයක් විතර හොයන්න පුළුවන්

"මමත් ලොකුවෙලා අම්මට මොනර කොළ ගොඩක් ගෙනත් දෙනවා."

පවුලෙ වැඩිමහල් දියණිය උසස් පෙළට මුහුණ දුන්නේ වාණිජ විෂය ධාරාවෙනි. A සාමාර්ථ තුනක් සමඟින් සමත් වූ ඇය සබරගමුව විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබාගත්තාය. ඈ ගුරුවරියකි. පාසල් සමයේ බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි උනන්දුවක් දැක්වූ විෂානිට අවශ්‍ය වූයේ කලා අංශයෙන් උසස් පෙළ හැදෑරීමටයි. සාමාන්‍ය පෙළ A සාමාර්ථ 9ක් සමඟ සමත් වුවද ඈ එම තීරණය වෙනස් නොකළාය. එහි ප්‍රතිඵල ලෙස විෂානි කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළත් වූයේ දිස්ත්‍රික්කයේ සිව්වැනියා සහ දිවයිනේ හතළිස්වැනියා ලෙසිනි. ඇය දැන් නීතීඥවරියක ලෙස කටයුතු කරයි. තෙවැන්නිය වූ තමේෂිට දෙවරක්ම විශ්වවිද්‍යාල වරම් අහිමි විය. එනිසා ඈ ඒ පිළිබඳ බලාපොරොත්තු අතහැරියාය.

"අක්කලා දෙන්නම කැම්පස්. ඔයා කවදහරි පසුතැවෙයි. අපි කොහොම හරි වියදම් කරන්නම්. තව සැරයක් තියෙනවනේ. කැමතිනම් ආයෙ විභාගෙ කරන්න."

ඒ උපදෙස් මවගෙනි. ඒ අනුව තෙවන වරට විභාගයට මුහුණ දුන් ඇය A සාමාර්ථ තුනක් සමඟ සමත්ව රුහුණු විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයෙන් උපාධිය ලැබුවාය. සිව්වැනියා වූ තෙනුෂි සාමාන්‍ය පෙළ A සාමාර්ථ නවයක් ලබා උසස් පෙළ හැදෑරුවේ ගණිත අංශයෙනි. ඇය පළමු වතාවේ පරිගණක විද්‍යාව හැදෑරීමට සුදුසුකම් ලැබුවද නැවත වතාවක් විභාගය කිරීමට තීරණය කළාය. අනතුරුව දිස්ත්‍රික්කයේ 117 වැනියා ලෙස ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ඉංජිනේරු උපාධිය ලැබුවාය. බාලයා හිමේෂි උසස් පෙළට තෝරා ගත්තේ ජීව විද්‍යාවයි. මුල් අවස්ථා දෙකේදීම ඇය විශ්වවිද්‍යාල වරම් ලැබුවද වෛද්‍ය විද්‍යාව හැදෑරීමට සුදුසුකම් නොවීය. තුන්වන වර ගාල්ලේ 31 වැනියා ලෙස විභාගය සමත් වූ හිමේෂි කරාපිටිය වෛද්‍ය පීඨයට ඇතුළත් වූවාය. ඇය එහි දෙවන වසර ශිෂ්‍යාවකි.

"අපි ඉගෙනගන්න දේ ගැන කවදාවත් දෙමාපියන්ගෙන් බලපෑමක් තිබුණෙ නෑ. එයාලා අපිට උපරිම සහයෝගය දුන්නා. අපි තමයි කරන විෂයන් තීරණය කළේ. මම විෂය පරිබාහිර දේවල් ගොඩක් කෙරුවා. අක්කටයි මටයි දෙන්නටම කැම්පස් එකේදීත් ක්‍රීඩා වර්ණ තිබුණා. තෙනුෂිට හොඳට චිත්‍ර අඳින්න පුළුවන්. සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ ගොඩක් අරන් තියෙනවා."

පවුලේ දෙවැනි දියණිය විෂානි කියයි. මෙම පවු... දුක සැප දෙක අතර දෝලනය වෙමින් ජීවිතයට මුහුණ දුන්නේය.

"තාත්තා මූදු ගියාම සති දෙක තුන ගෙදර නෑ. එතකොට අම්මා තමයි ඔක්කොම දේවල් බලාගන්නෙ. තාත්තා එනකල් අසීරුවෙන් වුණත් කාටවත් ණය වෙන්නෙ නැතුව අම්මා ගෙදර වැඩ කරගත්තා. අපි කවදාවත් දකින දකින දේ ඉල්ලලා අම්මා තාත්තාට කරදර කළේ නෑ. තාත්තා මූදු ගිහින් ආවම එයාලට මුදල් දෙන විදියට කියන්නෙ බිල දනවා කියලා. තමන්ගෙ කොටස ගත්තම තාත්තා අපි කැමති හැමදේම අරගෙන

තාත්තා මූ... සති දෙක ... නෑ. එතකොට ... ඔක්කොම දේව... තාත්තා එනක... වුණත් කාටවත් ... නැතුව අම්මා ... කරග...

රණි



# ා
# කොළ
# දෙනවා

## වුලේ



ආවා. අම්මත් හැකි හැම විදියටම ගෙදර ආර්ථිකයට උදව් කළා. අපේ ගෙවල් ගාව කුරුඳු තවානක් තිබුණා. අම්මා අපිව ඉස්කෝලෙ දලා එතැන වැඩට ගියා. කුරුඳු පැළ දන පැකට් හදන එකයි අම්මා කෙරුවෙ. එකකට සත 50ක් ලැබුණා. අපිත් ඉස්කෝලෙ ගිහින් ඇවිත් එතැනට ගිහින් හවස 5 විතර වෙනකල් උදව් කරනවා. එතකොට දවසකට රුපියල් තුන්සීයක් විතර හොයන්න පුළුවන්. ඒ වැඩේ අම්මා ටික කාලයක් කළා."

**...ුදු ගියාම ...ුන ගෙදර ... අම්මා තමයි ...ල් බලාගන්නෙ. ...ල් අසීරුවෙන් ... ණය වෙන්නෙ ... ගෙදර වැඩ ...ත්තා**

පියාගේ ධීවර රැකියාව පදනම වූ පවුල තවත් අසීරුවට පත් කිරීමට 2004 වසරේ සුනාමිය හේතු විය. මුදු යාම තාවකාලිකව නැවතිණ. එකම ආදායම් මාර්ගය අහිමි වීම ගැටලු නිර්මාණය කළේය. එහෙත් එම අවස්ථාවලදී ලද ආධාර නිසි පරිදි යොදගනිමින් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගැනීමට ඔවුන්ට හැකිවිය. හික්කඩුව සිංහ සමාජයේ ආධාර සඳහා ඔවුහු සුදුසුකම් ලැබූහ. ගුණ ජය සතුට පදනමේ ශිෂ්‍යත්වයකටද චිෂානි හිමිකම් කීවාය. එමෙන්ම ඔස්ට්‍රියාවේ පදිංචි කුසුම් කොහොඹගේ එම අවස්ථාවේ ගාල්ලේ දරුවන් 25 දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනැමුවාය. චිෂානි ඉන් අයෙකි. එම කාන්තාව සහ චිෂානිගේ පවුල අතර සබඳතාව අදටත් නොබිඳී පවතී. එමෙන්ම උපකාරක පන්තිවල ගුරුවරුන්ගේ සහායද මෙම සහෝදරියන්ට හිමිවිය. සහෝදරියන් සියලුදෙනාට මහපොළ ශිෂ්‍යාධාරද ලැබිණ. ඒවා සියල්ලේ ප්‍රතිඵල අද ඔවුන්ට මෙන්ම මේ රටට ලැබී තිබේ.

**"අපි සමහර වෙලාවට මහපොළ ආධාර එකතු කරගෙන ගෙදර අවශ්‍යතාවක් වුණාම අම්මටත් දීලා තියෙනවා. ඒ වගේම කොළඹ ගියාම මම අර්ධකාලීන රැකියා කළා. මොකද අපේ අවශ්‍යතාවලට ගෙදරින් ඉල්ලන්න හිතෙන්නෙ නෑ. අම්මා තාත්තා අපි වෙනුවෙන් ගොඩක් දේවල් කළා. අද ඒ හැම දේ ගැනම සතුටුයි."**

චිෂානි තමන් පැමිණි ගමන් මග එලෙස සිහිපත් කරයි.

දියණියන් පස්දෙනෙකු ප්‍රයෝජනවත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ සතුට වැඩියෙන්ම දැනෙන්නේ දෙමාපියන්ටයි. අනේක දුක්ගැහැට මැදින් පැමිණි ගමනක සාර ඵල ලැබී ඇත.

**"අද අපේ දරුවන් ඉන්න තැන ගැන නිහතමානීව ආඩම්බර වෙනවා. අවුරුදු විසි ගණනක කැපවීමක්. අපිට උදව් කරන්න ලොකුවට කවුරුත් හිටියෙ නෑ. මගෙ අක්කගෙ දරුවන් දුවලා පුංචි කාලෙ එයාලව බලාගන්න උදව් කළා. ඒ වගේම මගෙ මල්ලිත් උදව් කළා. දුවලත් එකිනෙකාට උදව් කරගත්තා. අනික එයාලට හරිම සුන්දර ළමා කාලයක් තිබුණා. දවසක් මම එයාලා පාසල් ඇරිලා එන වෙලාවෙ මගට යනකොට චිෂානි නංගිත් එක්ක ඇලට බැහැලා එනවා. සපත්තු කරේ. ගෙදර වැඩවලටත් ඉඩ තියෙනකොට එයාලා මට උදව් කළා. අපි දෙන්නම එයාලට දුන්නෙ තල්ලුවක් විතරයි. එයාලාගෙ කැපවීම නිසා ඔය තත්ත්වයට ආවා."**

**වැඩිමල් දුව ගුරුවරියක්. දෙවැනියා නීතීඥවරියක්. තුන්වැනියා කළමනාකරණ උපාධිධාරිනියක්. සිව්වැනියා ඉංජිනේරුවරියක්. බඩපිස්සී වෛද්‍යවරියක්**

කේ. රම්‍යලතා මෑණියන් පවසන්නේ සතුට මුසුවූ අභිමානයකිනි. දරුවෙකුට දීමට ඇති හොඳම දයාදය සමාජයක ස්වාධීනව නැගී සිටීමේ හැකියාවයි. මේ අක්කා නගෝ පස්දෙනාටම එය ලැබී ඇත. චිෂානි චලොංගා පවසන්නේ කෙතරම් ආර්ථික අපහසුතා තිබියද කැපවීමෙන්, නිවැරදි මග ගමන් කරන්නේනම් ජය හිමිවන බවයි.

**"අපි හැමෝම එකිනෙකාගෙ ඇඳුම් හුවමාරු කරගෙන ඇන්දා. ඒක අදටත් කරනවා. අලුත් අවුරුද්දට අලුත් සපත්තු ඉල්ලලා කරදර කළේ නෑ. ඉරිලා තිබුණොත් ඒක මහගෙන ගියා. සමහර තැන්වලින් කන්න ආසාව තිබුණට අපි ඒක කිව්වෙ නෑ. කිව්වනම් අම්මා තාත්තා ඒක කොහොමහරි කරන්න උත්සාහ කරයි. ඒත් ඒක එයාලට අමාරුයි කියල අපි දන්නවා. හැබැයි දැන් අපි අපිට ඕන තැනකට ගිහින් කනවා. අඳිනවා. අපි හරිම අමාරු කාලයක් පහුකෙරුවා. දැන් ජීවිතේ විඳින්න ඕනෙ. අම්මයි තාත්තයි හැමදේම කළේ අපි වෙනුවෙන්. අදටත් අපේ තාත්තාගෙ නමට බැංකු ගිණුමක්වත් නෑ. ඒත් එයාලා සතුටු වෙනවා අපි අද ඉන්න තැන ගැන. අපිට ඉගැන්නුවා. අපි දැන් ස්වාධීනයි. ඒ නිසා මොන අමාරුකම් මැද වුණත් අධ්‍යාපනය අත අරින්න හොඳ නෑ. මමයි ලොකු අක්කයි විවාහකයි. අපිව විවාහ කරගත් අයට දෑවැද්දෑක් විදියට මුදල්, දේපළ ලැබුණෙ නෑ. එයාලා ඒවා බලාපොරොත්තු වුණෙත් නෑ. එයාලට දීපු දයාදය තමයි කාටවත් බරක් නොවන ස්වාධීන ගැහැනුන්."**

රෂ්නිකා ලියනගේ



# තපෝවනයේ සිට බුදු මඟ වඩන ඌරු පැටික්කී අකිරා

නිස්කලංක වූ ආරණ්‍ය සේනාසනයේ නිහඬ බව මොහොතකට හෝ බිඳෙන්නේ කුරුලු හඬකට හෝ ලේන් හඬකටය. ඒත් නැත්නම් පිඹුරෙකුට, හඳුන් දිවියෙකුට වැනි සතෙකුට බයවූ වඳුරු රිළා රංචුවේ බුකු බුකුවටය. එසේ වූවා කියා මහකැලේ භාවනානුයෝගීව වැඩවසන ස්වාමීන් වහන්සේලාගේ දැහැන බිඳෙන්නේ නැත. රත්නපුර පැල්වාඩියේ මිණිපුර අමාශාන්ති තපෝවනයේ ස්වාමීන් වහන්සේලා විසිඑක් නමක් වැඩවසති. රත්නපුර දිසාවේ ප්‍රධාන සංඝනායක තපෝවනයේ රතන හිමි මේ ආරාණ්‍ය සෙනසුනේ නායක හාමුදුරුවෝය. වනවාසීව වැඩ වැඩවසන මේ සියලු ස්වාමීන් වහන්සේලාගේ හිත් මිනිසුනට පමණක් නොව ගහට කොළටද සතා සිවුපාවන්ටද එකසේ කරුණාවන්තය. ඒ නිසාම සෙනසුන ඇති වනයේ සිටිනා කොයි සතාත් ස්වාමීන් වහන්සේලාට බයක් සැකක් නැත. සෙනසුනෙන් ඒ සා කරුණාවක් හිමිවුවත් සෙනසුන අවට ගම්වල සිටින සමහර මිනිසුන්ගෙන් නම් ඒ සතුන්ට හරියට අඩන්තේට්ටම්ය. කෑම හෝ වතුර හොයාගෙන, එසේත් නැත්නම් මග වැරදී ගම් වදින හාවුන්, ඌරන්, වැලි මුවන් ඉත්තෑවුන් වැනි සතුන් ගමේ දඩක්කරුවන්ගෙන් ගැලවුණේ අහම්බෙනි. බඩගින්නට කෑම ටිකක් හොයාගෙන එන සතුන්ට ගිනිබිඳ මස් කළාට පසු ලැබෙන පාපය ඔවුන් නොතකන්නේ ඇතැම්විට පරලොවක් ගැන වගේ වගක් නැති නිසා විය යුතුය.

දවසක් ද අකිරාගේ අම්මාත් පුංචිම පුංචි අකීරාත් රැගෙන ගම්මානය පැත්තට ගොස් තිබුණේ කන්නට යමක් හොයාගෙනය. නමුත් අවාසනාවට එද අකිරාගේ අම්මා එවන් දඩයක්කාරයෙකුට අසුවුණේය. වෙඩි හඬටත්, අම්මා වේදනාවෙන් කෑගැසමින් දුවන හඬටත් බියවූ පුංචි අකිරා වෙල්යායේ වෙන පැත්තකට දිව ගොයම අස්සේ සැඟවුණේය. යායුතු අතක් නොදැන වෙල්යායේ අතරමං වී සිටි පුංචි අකිරාගේ වාසනාවට ඒ ඉසව්වට කරුණාවන්ත ගම්වැසියෙකු පැමිණ තිබුණි. ඔහු ගොයම් අස්සේ සැඟවී සිටි පුංචි ඌරු පැටවා දැක ගෙදර ගෙන ගියේ හිත උපන් කරුණාව නිසාය. ඒ නිසාම ඌරු පැටවාට ගෙදර නිදහසේ හැදෙන්නට ඉඩ දුන් අතර 'අකිරා' යනුවෙන් නමක්ද දුන්නේය.

**"මීට අවුරුද්දකට විතර කලින් ඒ ගම්වැසියා ආරණ්‍ය සේනාසනේට ඇවිත් අකිරාගේ කතාව කියලා ගෙනත් දුන්නා එයාව කැලේට යවන්න කියලා. එතකොට එයා ටිකක් ලොකුයි. ගමේ හිටියොත් අකිරාගේ ජීවිතේට අනතුරක් වෙයි කියන බයට තමයි ඔහු අකිරාව ආරණ්‍ය සේනාසනේට ගෙනැත් දුන්නේ. ඉතින් ටික දවසකට පස්සෙ අපි අකිරාව කැලේට යැව්වා. ඒත් එයා ගියේ නෑ. අපි පස්සෙන් ආවා. ආයෙ අයෙත් එහෙම කළාට අකිරා කැලේට යන්න කැමති වුණේ නෑ. ඇවිත් අපිත් එක්ක හිටියා."**




තපෝවනයේ රතන හිමි



**පොඩි උන්නාන්සෙලා පිරිවෙන් ගියාම පේන්න නැත්තම් කෙඳිරි ගගා මොනවදෝ කියනවා. පිරිවෙන් ඇරිලා එනකල් මගට වෙලා බලන් ඉන්නවා.**





තපෝවනයේ රතන හාමුදුරුවෝ කියන්නේ අකිරා ළඟ ඒ වෙනකොටත් තිබුණේ වනයේ සතෙක් ළඟ තිබිය යුතු ගතිගුණ නොවන බවයි. ඉතාමත් කීකරුකමකින් සහ පිරිසිදුව සිටින්නට කැමති අකිරා වැඩි කලක් යන්නට කලින් බණදහම් ආදියේද ලැදිබවක් පෙන්වන්නට ගත්තේය.

**"අපේ මෙහෙ පොඩි හාමුදුරුවරු හත් අටනමක් ඉන්නවා. අකිරා මං එක්ක වගේම උන්නාන්සේලා එක්කත් බොහොම ඉක්මනට යාළු වුණා. පොඩි දරුවන්ට වගේ අකිරාටත් ඕන සෙල්ලම් කරන්න. පොඩි උන්නාන්සේලා පස්සෙන් දුවනවා. ළඟට ගිහින් හොම්බෙන් ඇන ඇන සෙල්ලමට කතා කරනවා. තව අමුතු සද්දෙකින් කෙඳිරි ගගා මොනවදෝ කියනවා. පොඩි උන්නාන්සෙලා පිරිවෙන් ගියාම පේන්න නැත්තම් එහෙම කෙඳිරි ගගා මොනවදෝ කියනවා. පිරිවෙන් ඇරිලා එනකල් මගට වෙලා බලන් ඉන්නවා. ඇඟ අත ගගා ඉන්නවනම් හරි ආසයි."**

**මෙහාට ආව දවස්වලම ඉඳලා අකිරා බණ කියන තැනට ඇවිත් ඉන්න පුරුදු වුණා. මං බණ කියනවා නම් එතෙන්ට ඇවිත් හෙළවෙන්නෙවත් නැතුව බණ ඉවරවෙනකල් ඉන්නවා. අදටත් එහෙමයි**

තපෝවනයේ වැඩ සිටින හිමිවරුන්ට ස්නානය කරන්නට ඒ ආසන්න දිය පිහිල්ලක් ඇත්තේය. පොඩි හාමුදුරුවරු ස්නානයට යද්දී අකිරා කරන්නේ ඊට පෙර යන්නට කෙටි පාරවල්වලින් එතැනට දිවීමයි. කැලෑවේ ඉන්නා ඌරන් මඩේ ළගින්නට ප්‍රිය වුණත් අකිරාට ඕනෑ මඩ සෝදා ගන්නටය. ඒ නිසා පොඩි හාමුදුරුවරු දිය ස්නානය කරන තුරු අකිරා ද දියේ බැස සෙල්ලම් කරයි.

**"පොඩි හාමුදුරුවරු වතුරට පනිද්දි අකිරාත් වතුරට පනිනවා. අන්තිමට පොඩි හාමුදුරුවරු නාලා ගොඩට එන්න කලින් අකිරාගෙත් සබන් ගාලා නාවලා ගොඩට ගන්නවා. මුළු දවසම ඉන්නෙ අපිත් එක්ක. කැලේ සතෙක් වුණාට කැලේට යන්න ආසම නෑ. එයා කන්නේ මෙහෙ ඉතුරුවෙන කෑම. අවට වටාපිටාවෙ අල වර්ග එහෙම තියෙනවනම් ඒවත් කනවා. රෑට වුණත් එළියෙන් ඉන්න එච්චර කැමැත්තක් නෑ. පොඩි හාමුදුරුවෝ නිදාගන්න කුටිය ඇරලා නම් අකිරා නිදාගන්නේ ඒ ඇඳක් යට.**

මෙහාට ආව දවස්වලම ඉඳලා අකිරා බණ කියන තැනට ඇවිත් ඉන්න පුරුදු වුණා. මං බණ කියනවා නම් එතෙන්ට ඇවිත් හෙළවෙන්නෙවත් නැතුව බණ ඉවරවෙනකල් ඉන්න පුරුදු වුණා. අදටත් එහෙමයි. පොඩි හාමුදුරුවරු බුදුන් වඳිද්දිත් එහෙමයි. ළඟට වෙලා නොසෙල්වී ඉන්නවා. හරියට අහගෙන ඉන්නවා වගේ. තේරෙනවා වගේ. ධර්මශාලාවටත් යන්න ආසයි. ඒත් මිනිස්සු බයවෙන නිසා වැඩිපුර යන්න දෙන්නෙ නෑ. උදේ හතරවෙද්දී පොඩි හාමුදුරුවරු අවදිවෙනවා. වැඩක් නැතත් අකිරාත් ඒ වෙලාවට නැගිටිනවා. පොඩි හාමුදුරුවෝ උදේම බුදුන් වඳින්න ගියාම එතෙන්ට වෙලත් ඉන්නවා. දවල්ටත් අපේ ආශ්‍රයේ ඇවිද ඇවිද ඉන්නවා."

අකිරාට හොඳ බුද්ධි මට්ටමක් ඇති බවත් හැමදෙයක්ම හොඳින් තේරෙන බවත් තපෝවනයේ රතන හාමුදුරුවෝ කියන්නේ ඒ හැසිරීම් නිතර ඇසට දකින සහ විඳින නිසාය. එසේම දැන් දැන් අකිරා ගැන තපෝවනයට යන එන්නවුන් දනිති. ඒ නිසා ඒ බොහෝදෙනෙක් නැවත යනවිට අකිරා හා පින්තූරයක් ගෙන යන්නට අමතක කරන්නේත් නැත.

මින් පෙරද තපෝවනයේ අකිරා වන්ම දහමට ලැදි මුවෙක් සිටියේය. ඒ 'බෝධි'ය. බෝධි ද තපෝවනයේ නිදහසේ හැදෙන අතරේ බණදහම් ඇසුවේය. බණ කියණා තැන්වල ඉඳගෙන අකිරා සේම පැය ගණන් නොසැලී අසා සිටියේය. බෝධි ද පොඩි හාමුදුරුවන් ඇසුර ප්‍රිය කළ මුවෙකි. අවුරුදු නවයක් තපෝවනයේ වැඩුණු බෝධි දිනක් පොඩි හාමුදුරුවරු පිරිවෙන් ඇරී එන මොහොතේ පාරට ගොස් තිබුණි. ඒ වෙලාවේ බසයක වැදී බෝධි අවසන් ගමන් ගියේය. ගිහිගෙයින් මිදී සිටියත් සියල්ල අනිත්‍ය බව දැන සිටියත් බෝධිගේ සමුගැන්ම තපෝවනයේ හිමිවරුන්ගේ සිතටද එද දුකක් ගෙනාවේය.

**"සත්තුන්ට වුණත් කුසල් සිත් ඇතිවෙනවා. පෙර සංසාරේ අකුසල් නැතිවෙන්න කුසල් එකතු කරනවා. ඒ වගේ අය මැරුණට පස්සෙ හොඳ තැන්වල උපදිනවා. අකිරත් ඒ වගෙයි කියලයි මං හිතන්නේ. සමහර මනුස්සයෝවත් බණදහම්වල රඳවන්න බැරි කාලෙක සතෙක් වෙලා අකිරා එයා විසින්ම ධර්මයේ හැසිරෙනවා."**

තපෝවනයේ සෙනඟ ගැවසෙන්නේ ඔවුන්ට වෙන් කරපු කලාපයකය. භාවනා කරන ස්වාමීන් වහන්සේලා වැඩ වසන්නේ එතැනිනුත් කිලෝමීටර් දෙක තුනක් ඇතුළේ වූ වනයේය. ගමේ දඩයක්කාරයන් සිටියත් මේ කොටසට දඩක්කාරයන් එන්නේද නැත. අකිරා ටවුමට යන්නේත් නැත. ඒ නිසා දහම් සෙවනේ ඉන්නා අකිරාගේ ජීවිතය සුරක්ෂිතය.

බියංකා නානායක්කාර

# මහත්තයට ඉර හඳ ගෙනත් දෙන්න පුළුවන් වුණත් ඔයා රස්සාවක් කරන්න



**ගෑනු රස්සා කරනකොට පවුල් කැඩෙනවා, ළමයින්ගේ සෞඛ්‍ය, අධ්‍යාපනය දුර්වල වෙනවා කියලත් කියනවා. ඒ දේවල් හරියට කළමනාකරණය කරගන්න දෙන්නම දැනගන්න ඕනේ**

**"එයාට රස්සාවක් තිබුණු නිසා මට රස්සාවට යන්න කම්මැලි හිතුණා. පස්සේ මම ජොබ් එකෙන් අයින් වුණා. බැඳලා ටික දවසක් යනකොට එයා සෑහෙන වෙනස් වුණා. එයා කුඩු ගහන කෙනෙක් කියලා මම දැනගත්තේ ළමයි දෙන්නත් ලැබුණට පස්සෙයි."**



**ඉන්දිකා ප්‍රනාන්දු**
**මනෝඋපදේශිකා**
**සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරි**

ජීවිතේට එක පිට එක කරදර ප්‍රශ්න විතරක්ම එනකොට කෙනෙක්ගේ මානසික තත්ත්වය පිරිහෙන එක අමුතු දෙයක් නෙමෙයි. ඇයටත් වෙලා තිබුණේ ඒක. නම් ගම්වලින් හඳුන්වන්න බැරි නිසා  ඇයට මම රංගනී කියන්නම්. වරක් දෙවරක්ම සියදිවි නසාගන්නත් රංගනී උත්සාහ කරලා. තනියම නෙමෙයි දරුවෝ දෙන්නත් එක්ක.

ජීවිතේ එපාවෙච්ච ස්වභාවය වගේම තමන් වරදක් කළා වගේ හැඟීමකුත් ඇයට දැනුණාලු. ඒ වගේම කිසිදේකට ආසාවක් නැතිකමක් එක්ක මහා වෙහෙසෙකර බවකුත් දැනිලා. ඔය ලක්ෂණත් එක්ක රංගනී විශාදයෙන් පෙළෙන බව වෛද්‍යවරු නිගමනය කරලා. ඖෂධ ප්‍රතිකාර ලබාදෙන අතරතුරේ මානසික උපදේශන ලබාදෙන්න තමයි ඇයව මගේ ළඟට යොමු කරලා තිබුණේ.

වැඩි වයසක් නැති වුණත් ඇයට තිබුණේ බොහොම වැඩිමල් පෙනුමක්. ඉතින් බොහොම දුක් විඳපු කාන්තාවක් බව ඇය දිහා බැලූ බැල්මට කෙනෙක්ට අනුමාන කරන්න පුළුවන්. රංගනී සාමාන්‍ය පවුලක කෙනෙක්. පාසල් අවසන් වෙච්ච හැටියේ රැකියාවකට ගිහිල්ලා. ඒ යනකොට එතැනදි හිතවත් වුණු තරුණයෙක් එක්ක හිතුවක්කාරෙට පැනලා යද්දි වයස 19යිලු.

**"එයාට රස්සාවක් තිබුණු නිසා මට රස්සාවට යන්න කම්මැලි හිතුණා. පස්සේ මම ජොබ් එකෙන් අයින් වුණා. බැඳලා ටික දවසක් යනකොට එයා සෑහෙන වෙනස් වුණා. එයා කුඩු ගහන කෙනෙක් කියලා මම දැනගත්තේ ළමයි දෙන්නත් ලැබුණට පස්සෙයි."**

රංගනීට ලැබිලා තිබුණේ නිවුන් දරුවෝ. දරුවන්ට අවුරුද්ද යන්න කලින් සැමියා ඇයව දාලා ගිහින්.

**"දරුවෝ දෙන්නා ජීවත් කරවන්න මම නොසෑහෙන්න මහන්සි වුණා. ළමයි බලාගන්න කෙනෙක් නැති නිසා රස්සාවක් කරන්න පුළුවන්කමක් තිබ්බෙත් නැහැ. එහෙන් මෙහෙන් සල්ලි ඉල්ල ඉල්ලා තමයි ජීවත් වුණේ."**

එක දරුවෙක්ට හැදෙන දරුණු අසනීපයක් නිසා ඔය අතරේ රංගනී කබලෙන් ළිපට වැටිලා. රංගනීගේ අසරණකම දැනගත්තු පිරිමි කීපදෙනෙක්ම විටින් විට ඇගෙන් ප්‍රයෝජනත් අරගෙන තියෙනවා. මුදල් අවශ්‍ය නිසා ඕනම කෙනෙක්ගේ අයුතු යෝජනාවකට කැමැති වෙන තත්ත්වයක තමයි ඇයත් ඉඳලා තිබුණේ. හැබැයි ඒ පුද්ගලයන්ගෙත් විවිධ තාඩන පීඩනවලට මුහුණ දෙන්න වුණු නිසා තමයි ඇයට විශාදය වැළදිලා තිබුණේ.

මුලින්ම මම ඇගේ වැඩිහිටින්ට කතා කරලා ඇයට ඔවුන්ගේ සහාය ලබාදුන්නා. රංගනීට මනෝ අධ්‍යාපනය සහ ප්‍රජනන චර්යා ප්‍රතිකාර කළා. සමාජ සුබසාධන ආයතනවලට කතා කරලා මූල්‍යමය උදව් අරන් දුන්නා. ඉතින් රංගනී ටිකෙන් ටික සුවවුණා. මේ වෙනකොට ඇය නිවසේම පුංචිවට ඇඳුම් මහගෙන දරුවට ප්‍රතිකාර කරගෙන ඉන්නවා.

රංගනී ඇගේ ජීවිතේ ගොඩක් තැන්වල අරන් තිබුණේ වැරදි තීරණ. අඩු වයසින් නොගැළපෙන විවාහයක් කරගත්තු එක එකක්. අනික රස්සාව අත්අරින්න ගත්තු තීරණය. මානසික රෝහල්වලයි, සිරගෙවල්වලයි ඉන්න ගොඩක් කාන්තාවන් ආර්ථික අනාරක්ෂිතතාව නිසා ඒ තත්ත්වයට වැටුණු අය. ඒ ගැන මම පෞද්ගලිකව අධ්‍යනය කරලා තියෙනවා.

ලොකු වෙලා හොඳ රස්සාවක් කරන්න ඕනේ කියන අදහස පුතාගේ ඔලුවට දන ගොඩක් අම්මා, තාත්තලා දුවගේ ඔලුවට දන්නේ ලොකු වෙලා හොඳ කසාදයක් කරගෙන ගෙදරදොරේ වැඩ කරගෙන ඉන්න වගේ අදහසක්. විවාහයක් හොයද්දි වුණත් බලන්නේ මනමාලයට සල්ලි තියෙනවද කියන එකනේ. ඇත්තටම රස්සාවක් කරන්න ඕනේ සල්ලි නිසාම නෙමෙයි. ඒකට හේතු ගොඩක් තියෙනවා. පළවැනි එක ආර්ථික සුරක්ෂිතාව. ජීවත් වෙන්න සල්ලි නැති නිසා යන්න එන්න තැනක් නැති නිසා සැමියගේ දස වද ඉවසගෙන ජීවත්වෙන ගෑනු ඕනතරම් අදටත් අපේ රටේ ඉන්නවා. විවාහවෙලා ටික දවසක් යද්දි ගොඩක් සැමියන් බිරිඳට රස්සාවෙන් අයින් වෙන්න කියනවා. **"ඔයා මහන්සි වෙන්න ඕනේ නෑ ඔයාට සලකන එක මගේ යුතුකමක්. ඔයා වැඩට ගියාම ළමයි බලාගන්නේ කවුද?"** වගේ හේතු ගොඩක් කියනවා. ඇතැම්දෙනා ඔය දේ කරන්නේම බිරිඳව තමන්ගේ යටතේ තියාගන්න පහසු වෙන්න. එතකොට මොන දේ වුණත් ඇයට විවාහයෙන් යන්න බැහැ කියන අරමුණ මතයි.

ඒ වගේ ගැටලුවක් නැති වුණත් හිතන්න හදිස්සියේවත් සැමියා නැතිවෙනවා නැත්තම් දරුණු අසනීපයක් හැදෙනවා. එතකොට ඒ පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටෙනවා. මේ වගේ ප්‍රශ්න නිසා අසරණ වුණු කාන්තාවන් කොච්චරද? දීර්ඝකාලයක් රැකියාවක් නොකළ කෙනෙක්ගේ නිපුණතාව අවම නිසා අලුතින් රැකියාවකට යන එකත් ඔතැනදි ටිකක් දුෂ්කර වෙනවා.

මගේ මිතුරියක් හිටියා. ඇගේ සැමියාට උතුරන්න තරමට සල්ලි තියෙනවා. ඒ මොනා වුණත් සැමියගේ සල්ලිවලින් ජීවත්වෙනකොට කියාගන්න බැරි අමුතු හිස්කමක් දැනෙනවාය කියලා ඇය මාත් එක්ක කියලා තියෙනවා.

රස්සාවක් කරද්දි නැත්තම් තමන්ටම කියලා අතට මුදල් එන මාර්ගයක් තියෙද්දි ඒකෙන් ලොකු තෘප්තියක්, ආත්මඅභිමානයක් දැනෙනවා. අනික ඒක පෞරුෂයටත් හොඳයි. රැකියාවක් නොකරන කාන්තාවක් දවල් දවසේ ගෙදර තනිවෙනවා. එතකොට ඇගේ සමාජ සම්බන්ධතා අඩුවෙනවා. හැබැයි රැකියාවක් කරන කාන්තාවකට යාළු මිත්‍ර සම්බන්ධකම් හදාගන්න පහසුයි. ගෙදර වැඩ කර කර තනියම ඉන්නවට වඩා ඒක මනසට සහනයක්.

2021 වර්ෂයේ දත්තවලට අනුව ලංකාවේ කාන්තා විරැකියා අනුපාතය 8.39%.  උපාධි ගත්තු බොහොම දැන උගත් කාන්තාවන් පවා දරුවෝ ලැබුණු හැටියේ රැකියාවලින් ඉවත්වෙන තත්ත්වයක් තියෙනවා. එක අතකින් ඒක රටේ සම්පත් නාස්ති කිරීමක්. රටේ සල්ලිවලින් ඉගෙනගෙන රටේ ආදායමට දායකත්වයක් සපයන්නේ නැත්තම් ඒක රටටත් කරන වරදක්.

ඊළඟට සැමියට කරන උදව්වක් විදියට රැකියාවක් කරන්න පුළුවන්. සමහර සැමියන් ඉන්නවා ඇත්තටම බිරිඳව මහන්සි කරවන්න කැමැති නැහැ. අනික පවුල් බර අදින්න ඕනේ පිරිමියා විතරයි කියන මතය පුංචි කාලෙදිම ඒ අයගේ ඔලුවට දාලා තියෙනවා. ඒ කාලේ හැම ගෙදරකම වගේ අම්මලා පැදුරු, වට්ටි, පෙට්ටි විව්වා, ලුණු ඇඹරුවා, බෝතල් කිරි නැත්තම් කඩේඅප්පන් හරි විකුණලා සැමියට හයියක් වුණා. අනික ඒ කාලේ වගේ නෙමේ මේ කාලේ ආර්ථිකේ. පිරිමියට විතරක් ගෙදර බර තනියම දරන්න අමාරුයි කියන එක අමුතුවෙන් කියන්න ඕනේ නෑනේ.

ගෑනු රස්සා කරනකොට පවුල් කැඩෙනවා, ළමයින්ගේ සෞඛ්‍ය, අධ්‍යාපනය දුර්වල වෙනවා කියලත් කියනවා. ඒ දේවල් හරියට කළමනාකරණය කරගන්න දෙන්නම දැනගන්න ඕනේ. බුද්ධිමත් දක්ෂ දරුවොත් හදලා වෘත්තීය ජීවිතෙත් සාර්ථක කරගත්තු කාන්තාවෝ කොච්චර ඉන්නවද? දරුවෝ දාලා රස්සාවකට යන්න බැහැ කියලා හිතෙනවා නම් ස්වයං රැකියාවක් කරන්න. තමන්ගෙම දෙයක් ගෙදර පටන්ගන්න. එතකොට දරුවොත් ඒවගෙන් ආදර්ශ ගන්නවා.

ඉතින් මම කියන්නේ හස්බන්ඩ් කෝටිපතියෙක් වුණත් කමක් නැහැ, තමන්ගෙම දෙයක් කරන්න. බුක්මාර්ක් ටිකක් හදලා කඩේකට දාන්න. නැත්තම් ඔන්ලයින් ජොබ් එක්ක කරන්න.

දෙමාපියන් වුණත් දුවනියන්ව සල්ලිකාරයන්ට බන්දන්න හදන්නේ නැතිව ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න. අධ්‍යාපනය කියන්නේ උපාධි ගන්න එකම නෙමේ. දරුවන්ගේ නිපුණතා, වෘත්තීය හැකියාවන් එහෙමත් දියුණු කරගන්න උදව් දෙන්න. කාන්තාවක් මහන්න, ගොතන්න ඉගෙන ගන්න එක කවදාවත් අපතේ යන්නේ නැහැ. දියණියකගේ ජීවිතේට ආත්මාභිමානයක් සමාජ වටිනාකමක් දෙන්න පුළුවන් නම් ඒක තමයි දෙමාපියන්ට ඇය වෙනුවෙන් දෙන්න  පුළුවන් හොඳම දේ.

ඒ වගේම මේකත් කියන්න ඕනේ තමන් රැකියාවක් කරද්දි සැමියව යටත් කරගන්න ඕනේ කියලා හිතන ගෑනු උදවියත් ඉන්නවා. සල්ලි, රැකියා තිබ්බා නැතා, සම්බන්ධතාවයක් ඇතුළේ කවුරුත් කාවවත් යටත් කරගන්න ඕනේ නැහැ. දෙන්නට දෙන්නා සහයෝගයෙන් ආදරෙන් ඉන්න එකයි වැදගත්.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# විදුහල්පති කෙනෙක් ඇයි ගවුම් ඇඳලා ෆොටෝ දාන්නේ කියලා සමහරු අහනවා



සුභාෂිණී ඒකනායක

රුසියාවේ මහා ගත්කරු විදියට හඳුන්වන ලියෝ ටෝල්ස්ටෝයි කතුවරයෙක් වගේම ගුරුවරයෙක්. ටෝල්ස්ටෝයිගේ කතු භූමිකාව ප්‍රකට වුණත් ගුරු භූමිකාව එච්චරම ප්‍රකට නැහැ.

ටෝල්ස්ටෝයි පාසලක් හදනවා. පාසලේ මුල් ගුරුතුමා වගේම එකම ගුරුතුමත් ඔහු. මේ පාසලට දරුවන්ට කැමැති වෙලාවක යන්න එන්න පුළුවන්. පොතේ පාඩම් උදේට විතරයි. දවල්වරුවේ ලියෝ දරුවෝ එක්ක එකතු වෙලා සිංදු කියනවා, නටනවා, දරුවන්ට කතන්දර කියලා දෙනවා. මේක හරි අපූරූ ඉස්කෝලයක් නිසා දරුවොත් ඔහුට සැලකුවේ යාළුවෙක්ට වගේලු.

හැබැයි ලියෝගේ ඉස්කෝලේ දරුවන්ට මුල් ගුරුවරයා එක්ක තිබුණු සමීප බැඳීම අපේ රටේ ගොඩක් දරුවන්ට නැහැ. ඒකනේ ඉස්කෝලේ කාලේදි ප්‍රින්සිපල්ගේ ඔෆිස් එක ගාවින් යන්නත් අපි බය... ප්‍රින්සිපල් එද්දි මහා භයානක සත්වයෙක් දැක්කා වගේ රොත්ත පිටින් පංති කාමරවලට දුවපු අතීතයක් මට වගේම බහුතරයකට තියෙනවා.

දුර්වලම ගුරුවරයගේ අවිය තමයි දඬුවම. ගුරුවරුන්ට, දරුවන්ට ගහන්න එපා කියලා චක්‍රලේඛයක් පවා තියෙනවා

හැබැයි මාතලේ සුමංගල විද්‍යාලයේ දරුවොත් අර ලියෝගේ පාසලේ දරුවෝ වගේයි. මේ පාසලේ දරුවන්ට ඕන වෙලාවක බය නැතිව විදුහල්පතිගේ කාර්යාලයට යන්න එන්න පුළුවන්ලු. ඒ නිසා ඉස්කෝලේ හැම දරුවෙක්ම ප්‍රින්සිපල්ව මුණගැහිලා "බුදුසරණයි, ටටා බායි" කියලලු ගෙවල්වලට යන්නේ. මේ විදුහල්පතිත් ලියෝ වගේම දරුවෝ එක්ක නටනවා, ගයනවා, සිංදු කියනවා.

හැබැයි මේ පාසලේ ඉන්නේ විදුහල්පතිවරයෙක් නෙමෙයි දරුවන්ට බොහොම ලෙන්ගතු විදුහල්පතිනියක්.

**"ඔන්න දවසක් ටිකක් දවල් වෙලා අම්මා කෙනෙක් ඉස්කෝලේට දුවගෙන දුවගෙන ආවා. දරුවෝ දෙන්නට දවල්ට කෑම අරගෙනයි අම්මා ඇවිත් තිබුණේ. දරුවෝ කෑම අමතක කරලා ඇවිල්ලා කියලයි මම හිතුවේ.**

**මේ දරුවෝ දෙන්නාගේ තාත්තා ගහකින් වැටිලා. ඉතින් හරියට කන්න බොන්න නැතිලු. උදේට කහට බීලලු ඉස්කෝලේ එන්නේ. අනේ අර අම්මා කොහෙන් හරි කෑම ටිකක් හොයාගෙන තමයි ඇවිත් තිබුණේ. එදා ඉඳලා මම ඒ දරුවන්ට ගෙදරින් කෑම ගේනවා. දරුවෝ දෙන්නත් වැඩේට හරි ආසයි. ප්‍රින්සිපල්ගේ කෑම කන එක පොඩ්ඩෝ දෙන්නට ලොකුකමක්ලු. හැමෝත් එක්කම ආඩම්බරෙන් ඒ ගැන කියනවලු. මම ඉන්නේ ග්‍රාමීය පාසලකනේ. ඉතින් ඉස්කෝලේ ගොඩක් දරුවන්ට ආර්ථික ප්‍රශ්න. මම ඇතුළු කාර්යයමණ්ඩය අපිට පුළුවන් විදියට ඒ හැම දරුවෙක්ටම උදව් කරනවා."**

දරුවෝ ගැන ඇගේ හිතේ තියෙන බැඳීම පැහැදිලි කරන්න ඒ වචන ටිකම ඇති. විදුහල්පති කෙනෙක් කිව්වහම අපේ ඔලුවට එන්නේ ටිකක් තලත්තෑනි වයසක කෙනෙක්වනේ. හැබැයි ඇය බොහොම තරුණයි. සුන්දරයි. අද 'ධරණී' කවරය හැඩවෙන්නේ ඇගේ ආදරණීය රුවෙන්. ඇය සුභාෂණී ඒකනායක. විදුහල්පතිනියක් වගේම ඇය ප්‍රකට සාහිත්‍ය විචාරිකාවක්.

**"ලෝයර්ස්ලා අඳින සුදු සාරියට මම හරි ආසයි. ඒ නිසා පුංචි කාලේ මට ඕන වුණේ නීතීඥවරියක් වෙන්න. එක එක කාලෙට එක එක හීන දැක්කා. කොහොම හරි යමක්කමක් තේරෙන කාලෙදි මට ඕන වුණේ ගුරුවරියක් වෙන්න.**

**2005දී මාතලේ දිස්ත්‍රික්කයේ හොඳම ප්‍රතිඵලයකුත් එක්ක විශ්වවිද්‍යාල වරම් ලැබුණා. හැබැයි ගුරුවරියක් වෙන්න ඕන නිසාම කැම්පස් නොගිහින් විද්‍යාපීඨ ගියා. පස්සේ අනුරාධපුර ස්වර්ණපාලි බාලිකාවට නැටුම් ගුරුවරියක් විදියට පත්වීම ගත්තා. මාතලේ සංඝමිත්තා ඉස්කෝලෙත් සේවය කළා. වයසින් අඩු වුණත් සේවා කාලය වසර පහට වැඩි නම් විදුහල්පති විභාගයට ලියන්න පුළුවන්. ඒ විභාගය සමත් වෙලා නියෝජ්‍ය විදුහල්පති විදියට මාතලේ සුමංගල විද්‍යාලයට ආවා. වසරකින් පාසලේ විදුහල්පති විදියට පත්වුණා."**



*තරුණ වයසකින් විදුහල්පතිනියක් වෙන එක මොන වගේ අත්දැකීමක්ද?

**"ඒක හරි විශේෂ අත්දැකීමක්. මටත් මගේ පාසලේ දරුවන්ගේ වයසෙම පුංචි දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ඒ නිසා ඉස්කෝලේ දරු පැටව් මට හරි ළඟයි. ළමයෙක්ට අකුරු ලියන්න බැරි නම් මට දැනෙන්නේ මගේ දරුවෙක්ට අකුරු බෑ වගෙයි. ඉතින් මට හිතෙන්නේ මේ වගේ තනතුරුවලට තරුණ අයත් එන්න ඕනේ. පරම්පරා අතර දුරස්ථ බව අඩු වුණහම දරුවන්ගේ අදහස් තේරුම් අරන් ඔවුන් එක්ක පෑහිලා වැඩ කරන්න ලේසියි."**

ගුරුවරයා සහ ශිෂ්‍යයා අතර පිය පුතු සම්බන්ධයක් තියෙන්න ඕනය කියලා වග්ග පාලියේ බුදුන් දේශනා කරලා තියෙනවා. පාසලේ දරුවන්ට ඈ සලකන්නේ ඇගේම දරුවන්ට වගේ බවයි ඇයත් කියන්නේ.

**"දරුවෙක් සමාජයට යන්නේ පාසලෙන්. එතැනදි ගුරුවරයෙක්ටත් ලොකු වගකීමක් පැවරෙනවා. ඉතින් ගුරුවරු හැමවෙලාවෙම සමාජයට වඩා ඉස්සරහින් ඉන්න ඕනේ, තාක්ෂණය වගේම ලෝකේ ගැනත් දැනගෙන ඉන්න ඕනේ. කොරෝනා කලේ තාක්ෂණය නොදන්නකම නිසා ගොඩක් ගුරුවරුන්ට උගන්වන්න අමාරු වුණා. හැබැයි ඒකට ගුරුවරයටම ඇඟිල්ල දික්කරන්නත් බැහැ. අපේ සිස්ටම් එකෙන්ම ගුරුවරයා කියන කෙනාව පුංචි කොටුවට දලා රාමු කරලා තියෙනවා, එක විෂයක් වෙන් කරගෙන ඒක උගන්වගෙන ඉන්න එකයි ගුරුකම කියලා. ඉස්සරහදිවත් අන්න ඒක වෙනස් කරන්නයි අපි බලන්න ඕනේ."**

ගුරුවරුන්ගේ දඬුවම්වලට ලක්වෙන දරුවන් ගැනත් අපිට නිතර අහන්න ලැබෙනවනේ. ඒ ගැන ඇය කිව්වේ මෙහෙම දෙයක්.

**"දරුවෙක්ට විතරක් නෙමේ කෙනෙක්ට ගහන්න තවත් කෙනෙක්ට අයිතියක් නැහැ. දුර්වලම ගුරුවරයගේ අවිය තමයි දඬුවම. ගුරුවරුන්ට, දරුවන්ට ගහන්න එපා කියලො චක්‍රලේඛයක් පවා තියෙනවා. අපි ඉන්නේ දරුවන්ට හොඳ නරක කියලා දෙන්න. සමාජෙට ගිහින් වැරදි කළාම දඬුවම් ලැබෙන්න පුළුවන් කියන එක**

උගන්වන්න. වැරදි හදාගන්න උදව් කරන්නේ නැතුව ඒවට ළමයින්ට දඬුවම් කරන්න ගුරුවරුන්ට අයිතියක් නැහැ. ඒ වැරැද්ද වුණත් නිවැරැදි කරන්න සුන්දර විදියක් හොයාගන්න ගුරුවරයා දක්ෂ වෙන්න ඕනේ.

ඒ වගේම තමා සමහර ගුරුවරු ඉන්නවා දරුවන්ට නිතරම අරක කරන්න එපා මේක කරන්න එපා කියන. එක වසරට යන දරුවෝ ඉස්සරහා පේලියේ ඉඳගන්න පොරකනවා. ප්‍රශ්නයක් ඇහුවම උත්තර දෙන්න අත් උස්සනවා. හැබැයි බලන්න උසස් පෙළ පංතිවලදි දරුවෝ ඉඳගන්න ආසම පිටිපස්සේ. පුංචි කාලේ ඉඳලම දරුවන්ට එපා කියන එකෙයි දඬුවම් කරන එකෙයි ප්‍රතිඵලය තමයි ඒක."

ඒ කතාවෙන් පස්සේ මම ඇගෙන් ඇහුවේ සාහිත්‍ය ගැන.

"මට ඉන්නේ අයියයි, නංගියි. ඒ දෙන්නටම ලස්සනට සිංදු කියන්න පුළුවන්. මට හොඳටම සිංදු කියන්න බැහැ. ඒ නිසා පුංචි කාලේ ඉඳලම මම කළේ සිංදු, කවි, කතා විචාරය කරපු එක. එකපාරක් මට 'සිහිනයකි රෑ' වැඩසටහනට ආරාධනාවක් ලැබුණා. මාව බොහෝදෙනා අඳුනගත්තේ ඒකෙන්. ග්‍රන්ථ එළිදැක්වීම්, රූපවාහිනී ගීත විචාර වගේ වැඩසටහන්වලට සහභාගී වෙනවා. මේ දවස්වල ගුවන්විදුලි රසාස්වාදන වැඩසටහනකටත් සම්බන්ධ වෙලා කටයුතු කරනවා."

ඒ වගේම ඇය කිවිඳියක්. ඇගේම කවිපොතක් එළිදක්වන්නත් වැඩ කටයුතු සූදානම් බව ඇය කිව්වා.

"අපේ ළමයි පොත් කියවන්නේ නෑ කියලා ගොඩක් අම්මලා තාත්තලා කියනවා. මම නම් ඒ වරද පටවන්නෙත් වැඩිහිටියන්ට. එයාලා රෑට ටීවී එකේ යන ටෙලිනාට්‍ය බලන ගමන් දරුවන්ට පොත් කියවන්න අවවාද දීලා හරි යන්නේ නැහැ. අවවාදයට වඩා ආදර්ශය කවදත් වටිනවා.

පවුලක් ගොඩ නැගෙන්නේ අම්මා මත. ඉතින් අම්මාට හොඳ දැනුමක් තියෙන්න ඕනේ. ගෑනියෙක් වුණාම සිංදුවක් අහන්න ඕනේ, පොතපතක් කලාත්මක චිත්‍රපටයක් බලන්න ඕනේ. ඉස්සර අපේ අම්මා නිදාගන්නකොට මට කතන්දර කියලා දෙනවා. පොඩි කාලේ දවසක් අම්මා 'මා එක්කලා අමනාපව වී දබර...' සිංදුව කිව්වා. ඒ තාත්තා දුවව දල ගිය දුකට එදා මම හොඳටම ඇඬුවා. තව කෙනෙක් ගැන සංවේදී දරුවෝ හදන්නේ අන්න එහෙමයි. අනික මම හිතන හැමදේම හරි, මම හැමදේම දන්නවා කියලනේ ගොඩක් අය හිතන්නේ. හැබැයි පොත් කියවනවා නම් ඒක වැරදියි කියලා තේරෙනවා. ඇත්තටම මේ ලෝකේ අපි දන්න දේවල් බොහොම පොඩ්ඩයි."

**පොඩි කාලේ දවසක් අම්මා 'මා එක්කලා අමනාපව වී දබර...' සිංදුව කිව්වා. ඒ තාත්තා දුවව දාල ගිය දුකට එදා මම හොඳටම ඇඬුවා. තව කෙනෙක් ගැන සංවේදී දරුවෝ හදන්නේ අන්න එහෙමයි**

ඇත්ත, අපි දන්න දේ බොහොම ඇබිත්තයි කියලා බුදුන් පවා දේශනා කරලා තියෙනවානේ. ඔය කතාවෙන් පස්සේ ඇගේ පවුල ගැනත් අපි ටිකක් කතා කළා.

ඇයට පුංචි දුවනියක් වගේම පුතෙකුත් ඉන්නවා. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අදිකාරිලත් නිලධාරී කනිෂ්ක ජයලත් ඇගේ සැමියා.

"ගොඩක් වෙලාවට මම විරහව ගැන ලියනවා. ඒවා දැක්කම ඔයාගේ හස්බන්ඩ් ඔයාට සලකන්නේ නැද්ද කියලා සමහරු අහනවා. ඒවා මගේ හිතට දැනෙන කවි සිතුවිලි මිසක මගේ පෞද්ගලික අත්දැකීම් නෙමෙයි. මට මගේ සැමියගෙන් ලොකු සහායක් ලැබෙනවා. නැත්තම් මේ හැමදේම හරියට කළමනාකරණය කරගන්න අමාරුයි. මගේ තාත්තාත් මට ලොකු සහායක් දෙනවා."

පාසලේ කාර්යයමණ්ඩලයේ සහාය ගැනත් ඇය නිතරම වගේ මතක් කළා. අවසාන වශයෙන් 'ධරණී' කියවන ඔබ වෙනුවෙන් ඈ කිව්වේ මෙහෙම දෙයක්.

"මම ගවුමක් ඇඳලා ෆොටෝ එකක් දැම්මම විදුහල්පති කෙනෙක් ඇයි ගවුම් ඇඳලා ෆොටෝ දන්නේ කියලා සමහරු අහනවා. විදුහල්පති කෙනෙක් වුණත් මටත් පෞද්ගලික ජීවිතයක් තියෙනවා. මට වගේම හැමෝමටම පෞද්ගලික ජීවිතයක් තියෙනවා. ඉතින් තව කෙනෙක්ගෙ පෞද්ගලික දේ අඩුපාඩු හොය හොයා ඒ අයට මානසික පීඩනයක් දෙන්න එපා. ගොඩක් වෙලාවට ඔය විදියට අනුන්ගේ මානසික නිදහස සීමා කරන්න හදන්නේ තමන්ට මානසික සතුටක් නැති උදවිය'

ඒ නිසා නිතරම තමන්ගේ සතුට ගැන හිතන්න. ඒ මොහොත සතුටින් ගෙවන්න. වෙන අය මත තමන්ගේ සතුට හොයන්න යන්න එපා. තමන්ගේ හොඳම යාළුවා තමන් කරගන්න. තමන්ට ඇබ්බැහි වෙන්න. එතකොට අනිත් අය ගැන ඊර්ෂ්‍යා හිතෙන්නෙත් නැහැ. එකිනෙකා අතර තරඟයක් ඇතිවෙන්නෙත් නෑ."

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**
ඡායාරූප : **ප්‍රදීප් දඹරගේ**
සාරි නිර්මාණය : **ලියාරා සාරි**
හැඩගැන්වීම : **ශ්‍යාමි රණසිංහ බ්‍රයිඩ්ල් මාතලේ**



බෞද්ධ කාන්තා විද්‍යාලය Buddhist Ladies College



සඳමාලි අව්රුප්පොල
විශ්‍රාමික විදුහල්පතිනි, විශාඛා විද්‍යාලය.
(2009 සිට 2021)
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, I ශ්‍රේණිය,
අධ්‍යාපන තක්සේරුකරණය සහ ඇගයීම
සම්බන්ධ ශාස්ත්‍රපති උපාධි,
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,
පශ්චාත් උපාධි අධ්‍යාපන කළමණාකරණ ඩිප්ලෝමා,
අධ්‍යාපන සැලසුම්කරණය සහ පරිපාලනය
පිළිබඳ ඩිප්ලෝමා.

අධ්‍යක්ෂිකා/විදුහල්පතිනි
අධ්‍යාපන, ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම්

සම්මුඛ පරීක්ෂණ මේ දිනවල පැවැත්වේ.
පෙර පාසල්, පළමු ශ්‍රේණිය - 2023
උසස් පෙළ - 2024
අධ්‍යයන වර්ෂයන් සඳහා සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශිෂ්‍යාවන් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් විද්‍යාලයීය කාර්යාලයෙන් ලබාගත හැකිය.
No. 229, Dharmapala Mawatha, Colombo 07
Tel : 011-2695347 / 0772821954 , www.Buddhistladiescollege.lk



# හොඳ නෝනා කෙනෙක්ට හොඳ නෑනා කෙනෙක් වෙන්නත් පුළුවන්

කසාද බැන්දට පස්සේ ගොඩක් අයට එක්කෝ මහත්තයාගේ ගෙදර නැත්නම් නෝනගේ ගෙදර පදිංචි වෙන්න වෙනවා. කැමැත්ත, අකමැත්ත කොහොම වුණත් එහෙම අවස්ථාවල්වල නෝනගේ හරි මහත්තයාගේ හරි සහෝදර සහොදරියන් එක්කත් ජීවත්වෙන්න සිද්ධවෙනවා. එහෙම වෙලාවල්වල දෙනෑනාවරු අතරේ ප්‍රශ්න ඇති වෙනවා කොහොමත් වැඩියි. රුස්සන්නේ නැතිකම, ඊර්ෂ්‍යාව, කේලම්, පවුල් ජීවිතේට ඇඟිලි ගහන්න එන නිසා ඇතිවෙන කළකිරීම වගේ දේවල් තමයි ඒකට හේතුව. ඒ වගේම නෑනලා මස්සිනාලා අතරෙත් ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. සමහර වෙලාවට වෙනම ගෙදරක පදිංචි වෙලා හිටියත් සැමියාගේ හරි බිරිඳගේ හරි සහෝදර සහෝදරියෝ ඇවිත් නතර වුණාම ප්‍රශ්න ඇතිවෙන අවස්ථා අපි අහලා දැකලා තියෙනවා. ඉතින් මට අද ලියන්න හිතුණේ ඒ ගැන. ඒකත් මගේ අත්දැකීමක් මුල් කරගෙන.

මගේ පවුල ඇතුළේ මගේ මහත්තයයි දරුවෝ තුන්දෙනයි ඇරුණාම තව සමාජිකයෙක් ඉන්නවා. ඒ චුටි මල්ලි... ආදරේට මං කියන්නේ චුට්ටා කියලා. දහම් පවුලේ වැඩිමලා නිසා එයාට මල්ලිලා දෙන්නෙක් ඉන්නවා. ඒ දෙන්නගෙන් චූටි මල්ලි ජීවත්වෙන්නේ ජපානෙ, අපේ ගෙදර...

ඇත්තටම මට මෙහේ ඉන්න හොඳම යාළුවා චූටි මල්ලි කිව්වත් ඒකේ වැරැද්දක් නෑ. කොහේ කොතැනක වුණත් අපිට අපේ විදියට ඉන්න පහසු හැම සම්බන්ධයක්ම හිතට සමීපයිනේ. ඉතින් චූටි මල්ලි කියන්නෙත් මට ඒ වගේ සමීප සහෝදරයෙක්, හොඳ යාළුවෙක්. විහිලුවට විහිලුවකින් උත්තර දෙන්න වගේම වැදගත් කතාවකදි හොඳ සවන්දෙන්නෙක් වෙන්නත් මල්ලිට පුළුවන්. මගේ අතින් හිත රිදෙන දෙයක් වුණත් එයාගෙන් එහෙම දේවල් වෙලා නැතිතරම්. මල්ලි නිතරම එයාගේ හැඟීම් එළියට නොපෙන්නුවට සමහර අවස්ථාවලදී වැඩ කරන විදියෙන් අපි ගැන එයාගේ හිතේ තියන බැඳීම මොන විදියද කියලා මට දැනිලා තියෙනවා. ඒ දැනෙන හැඟීම හිතට ගේන්නේ ලොකු සතුටක්.

ලංකාවේ කෑම කන්න ආසයි කියලා, ගොඩක් වෙලාවට මල්ලි එයාගේ ජපන් යාළුවෝ ගෙදර එක්කගෙන එනවා. එහෙම වෙලාවට මං එයාලා වෙනුවෙන් ආසාවෙන් උයලා දෙනවා. මං ඒ දේවල් කරන්නේ මල්ලි වෙනුවෙන්. එයාගේ යාළුවෙක්ව මගේ ගෙදරට එක්කගෙන එන්නේ මං හොඳින් සලකයි කියන විශ්වාසෙන් නිසා මං කවදාවත් ඒක නැති කරලා නෑ. සමහරවිට එදිනෙදා ගෙදරදොරේ කරන්න තියෙන වැඩ ගැනත් නිතර පැමිණිලි කරන කෙනෙකුටනම්,









**මගේම අක්කා මගේම අයියා කියලා හිතෙන තරමට ඒ අයට ආදරේ දෙන්න. ඒ අය වෙනුවෙන් ඔයා කරන කියන දේ පුංචි පැසසුමක්වත් බලාපොරොත්තු නොවී කරන්න**

**කසාදෙන් පස්සෙ මහත්තයාට තමන්ගේ නංගිට, මල්ලිට සලකන්න වුණොත් ගොඩක් ගෑනුන්ට ඒක ඉවසන්න බෑ... සමහර පිරිමින්ටත් බෑ**

විශේෂයෙන්ම මහත්තයගෙත් නොවී නෑනා හෝ මස්සිනාගේ යාළුවෙක් ගෙදරට එන එක කරදරයක් වෙන්න පුළුවන්. ඒත් හැමෝන්ගෙම ජීවිතවල සුන්දර මතකයක් වෙන්න උත්සාහ කරන නිසා වෙන්න ඕන, මට කවදාවත් එහෙම දැනිලා නෑ.

මල්ලිගේ උපන්දිනේට වුණත් අනිත් හැමෝගෙම උපන්දිනවලට වගේ මගේ අතින්ම කේක් එකක් හදලා, එයා ආස කෑමක් හදලා අපි පස්දෙනා පොඩියට සමරනවා. දහම්ගේ අම්මා මට කියනවා "චුටි පුතා ඔයා ගාව ඉන්න හින්ද මට බය නෑ දුව, ඔයා ඔයාගෙම සහෝදරයෙක් වගේ එයාව බලාගන්නවානේ" කියලා. ඉතින් මං විශ්වාස කරන දේ තමයි, අපි තව කෙනෙක්ට ආදරෙන් සලකද්දි ඒ අයගේ පැත්තෙනුත් අපිට ඒ හා සමාන ආදරයක්, සැලකිල්ලක් ලැබෙනවා.


කසාදෙන් පස්සෙ මහත්තයාට තමන්ගේ නංගිට, මල්ලිට සලකන්න වුණොත් ගොඩක් ගෑනුන්ට ඒක ඉවසන්න බෑ. සමහර පිරිමින්ටත් බෑ. පුළුවන් නම් ඒ දේවල් දිහා සාධරණ විදියට බලන්න. අපි හැමෝම අපරිපූර්ණ මිනිස්සු නිසා අපි හැමෝගෙම අතින් වැරදි වෙන්න පුළුවන්. නෑනාලා මස්සිනාලා කියන්නෙත් පරිපූර්ණ මිනිස්සු නෙවෙයි. ඒ නිසා එකට ජීවත්වෙන තැනක ඔයාගේ හිත කළකිරවන දෙයක් වෙනවානම්, එකට එක කරන්න ඉස්සර නොවී ඒ අය එක්ක විවෘතව කතා කරන්න. විශේෂයෙන්ම ඔයාට එකතුවෙන නෑනා හරි මස්සිනා හරි ඔයාට වඩා වයසින් බාලනම්, ඔයා එයාගෙ අයියා හෝ අක්කාව එකපාර අයිති කරගත්තා වගේ හැඟීමක් ඒ අයට දැනෙන්න පුළුවන්. ඒ අය කේලම් කියලා බිඳවන්න හදන්නේ, පවුල් අවුල් කරන්න හදන්නේ එහෙම අවස්ථාවල කියලයි මට හිතෙන්නේ. ඒ නිසා එහෙම වෙලාවට තව ටිකක් ඒ අයව තේරුම්ගන්න උත්සාහ කරන්න. මගේම අක්කා මගේම අයියා කියලා හිතෙන තරමට ඒ අයට ආදරේ දෙන්න. ඒ අය වෙනුවෙන් ඔයා කරන කියන දේ පුංචි පැසසුමක්වත් බලාපොරොත්තු නොවී කරන්න.

ඇත්තටම මට මගේ නෑනලා මස්සිනාලා ගැන තියන්නේ හොඳ අත්දැකීම් විතරයි. මම ඒ අයව මගේ ජීවිතයට භාරගත්තු විදිය නිසයි ගොඩක් වෙලාවට මට නරක අත්දැකීම් නැත්තේ. ඒ නිසා හැමවෙලේම වැදගත්වෙන්නේ තමන්ගේ පවුලේ සමගියට, පෞද්ගලිකත්වයට බාධා නොවන විදියට සහෝදරත්වයෙන් ඒ අය එක්ක කටයුතු කරන එක.

හැබැයි මේ දේත් කියන්නම ඕන. ඔයා කොච්චර හොඳින් හිටියත් ඔයාගේ හොඳක් දකින්නේ නැත්තම්, ඔයාගේ පවුල ඇතුලේ ප්‍රශ්න ඇති කරනවානම් අයියා, අක්කා, නංගි, මල්ලි, නෑනා, මස්සිනා නෙවෙයි අම්මා තාත්තා වුණත් ඈත්කරලා පවුල රැකගන්න එක අනිත් හැමදේටම වඩා වටිනවා කියන එකත් මතක තියාගන්න.

හෂිනි මනමේන්ද්‍ර

ධරණී



# ඒවසරයි

බියංකා නානායක්කාර ලියයි

94 කොටස

# තේනුක පුතත් අප්පච්චි වගෙයි.. ඒ ආදරේ නැති කරගන්න එපා..

අංජනා සිනා නොවීම මේනක බණ්ඩාර තෙන්නකෝන් දෙස බලා සිටියාය. ඔහුට තේනුකගේ පෙනුම ආවේ කොහොමදැයි ඇයට පුදුම සිතුණි. අංජනා ඒ පුදුම වූ සිතින්ම මේනක බණ්ඩාරගේ ඉහේ සිට දෙපතුල දක්වා ඒ බැල්ම විහිදෙව්වාය. අංජනාගේ ඇස් පුදුම වෙනු මේනක හොඳින්ම දුටුවේය. ඔහුට එක්වරම හිතුණේ එක්කෝ තරුණිය ඔහු අඳුනාගෙන පුදුම වූවා හෝ ඔහුගේ කඩවසම්කමට ඈ එක්වර තිගැස්සුණා කියාය. මේනකද සිටි ඉරියව්වෙන්ම ඈ දෙස බලා සිටියේ ඔහුටද අංජනා දැක්ම පහදදිය නොහැකි හැඟුමක් ඇතිකළ නිසාය. ඈ ළඟ ඇත්තේ ගීත්මාටත් වඩා වෙනස් ලස්සනක් කියා ඔහුට ඒ තත්පරේට සිතුණි.

**"මොකද නෝනා බයවෙලා...? මාව යකෙක් වගේද පේන්නේ..?"**

මේනක බණ්ඩාර සිනසෙමින් අසද්දී ඒ සිනාවට අංජනාගේ හිත තවත් ගැස්සුණි. මූණේ දකුණට ඇඳෙන සිනාවේ ඇත්තේත් ඔහුටම සමාන බවකි.

**"ඔයා මීට කලින් මාව දන්නවද..? මට ඔහොම අඳුරනවා වගේ කතා කරන්න..?"**

**"කාත් එක්ක හරි කතා කරන්න අඳුරන්නම ඕනිද..?"**

ඔහු ඇසුවේ සිනාසෙමිනි. දකුණතේ වූ ජීප් රියේ යතුර ඇගිල්ලේ රඳවාගත් ඔහු වමතින් ඈ ළඟම වූ ඇඳුම් වැට අල්ලා ගත්තේය.

**"මං නම් මෙච්චරකල් අඳුරන්නෙ නැති අයත් එක්ක කතා කරලා නෑ..."**

ඔහුගේ සිනාවේ පැටලීගෙනම මොහොතකින් සාමාන්‍ය තත්ත්වයට ආ අංජනා ඇසුවේ සිනාවක් නැති මුහුණිනි.

**"වැඩක් නෑනේ... මං මෙච්චර හිනාවුණා, කතා කළා. අඩුතරමේ මගෙන් ප්‍රශ්න කරන්න කලින් චුට්ටක් හිනාවෙලාවත් ඉන්න එපැයි..."**

ඔහු ඒ ප්‍රශ්නයට උත්තරයක් නොදී ප්‍රශ්නයක්ම ඇයට දුන්නේය.

**"මොකටද..?"**

ඒ කතාවට ඇත්තටම ඇයට නොමනාපයක් ඇති වුණේය.

**"මනුස්සකමට..."**

මේනක බණ්ඩාර තෙන්නකෝන් මද සිනා ඇතිව කීවේ කිසිදු යුවතියක ළඟ පසුබැස ගියේ නැති පුරුද්දටය. ඒත් මේ තරුණියගේ සුන්දරත්වය එක්ක මොකද්දෝ අහංකාරකමක් ඒ පුංචි වචන දෙක තුන අස්සේ ඔහුට දැනුණේය. ඔහු කොයිඑකටත් කියා වටපිට බැලුවේ දන්නා කියන කවුරුන් හෝ ඉන්නවාදැයි බලන්නටය.

**"මනුස්සකමට හිනාවෙන්න කතා කරන්න මං ඔයා කවුද කියලා දන්නෙ නෑ. දැක්කෙත් අදමයි. අනික මේ මනුස්සකමට එක එක්කෙනා එක්ක කතා කරලා ඉන්න පුළුවන් කාලයක් නෙවෙයි. අපේ අම්මා කියලා තියෙන්නේ නොදන්නා කිසි කෙනෙක් එක්ක හිනාවෙන්නවත් එපා කියලා."**

ඇය කිව්වේ පෙර මුහුණින්මය.

**"අම්මා නෝනව කොළඹ එවලා තියෙන්නේ බය කරලා..."**

**"බය කළා නෙවේ... අම්මලා දන්නවා අද එහෙම හිනාවුණොත් හෙට ඒ හිනාව පස්සෙන් එනවා කියලා..."**

**"අම්මා ගමේ හිටියට මාර දේවල්නෙ දන්නේ..."**

මේනක බණ්ඩාර ඒ වෙනකොට අංජනා ඇහැලේපොල ගමෙන් ආ යුවතියක් බවට හඳුනාගෙන අවසන්ය. ඒ ඇගේ කතාබහෙන් හැසිරීමෙන් හා තමා දැක ඇගේ කිසිඳු විශේෂත්වයක් නොපෙන්වීම නිසාය. ඇය කාගේ කවුදැයි සොයාගත යුතු බව ඔහු තීරණය කළේ ඇගේ ඒ ආගන්තුක ආඩම්බරකාර හැසිරීම නිසාමය.

**"ඔයා මාව දන්නෙ නෑ කිව්වනෙ නෝනා. ඕන නම් මං ගැන කියන්නම්..."**

මේනක එතැනින් යන්නට පෙර තවත් උත්සාහයක් දැරුවේය. එවරනම් යන්තම් සිනාපොදක් ඈ දෙතොලේ ඇඳී නොපෙනී ගියේය. ඈ ඔහු දෙස කෙළින් බැලුවේය.

**"එපා අයියේ... එක එක්කෙනා ගැන දැනගත්තම ඔලුවට බර වැඩියි. ඒ හින්දා ඕන නෑ... ඔයා ගවුමක් ගන්න ආවේ නෝනටද, ගර්ල්ෆ්‍රෙන්ඩ්ටද... ලස්සන ගවුම් තියෙනවා. ගන්න..."**

ඇය විශ්වවිද්‍යාලයේදී මෙන් හිත නොරිදෙන්නට එසේ කියා තෝරාගත් ගවුමද ගෙන එතැනින් ගියත් මේනකගේ හිත රිදුණේය.

**"මහ ආඩම්බරකාර කෙල්ලෙක්. හිටපංකෝ මං උඹව යාළුකරගෙනම ඔය ඔලුව බස්සවන්න..."**

ඔහුට පිටුපා යමින් සිටි අංජනා දෙස බලා සිටියදී මේනකගේ හිත කෑගැහුවේය. ඔහු චතුම්ණීට ගවුමක් ගැනීම පසෙක තබා ඇයට නොපෙනෙන්නට ඇය පසුපසින් ගියේය. මේනක බණ්ඩාර තෙන්නකෝන්ගේ හිතට මහා මදිකමක් දැනෙන්නට විය. කිසි දවසකත් තරුණියකගෙන් මෙලෙස ප්‍රතික්ෂේප වී නැත. ඊටද තරුණියන් ගැවසෙන තැනකට ගියොත් ඔවුන් තම අවධානය ගන්නට හැසිරෙන හැටිද ඔහුට මතක් වුණේය. අංජනා පඩිපෙළවල් නැග ගොස් ඇතුළුවූයේ පිරිමින්ගේ ටීෂර්ට් කොටසටය.

ඇගේ දුරකතනය නාද වූයෙන් ඇය ඇමතුම දෙස බැලුවාය. කතා කරන්නේ අම්මාය. ඒ නිසා ඇය එහි වූ ටීෂර්ට් අතගා බලමින් ඒ ඇමතුම ගත්තාය.

**"කොහොමද දරුවො... කතා කරයි කියලා බලන් ඉඳලයි කතාකළේ..."**

අම්මාගේ හඬේ වූයේ වෙහෙසකි. උදේ අම්මාට කතා නොකළ බව මතක් වූයේ එවරය.

**"අනේ අම්මා. අමතක වුණානේ..."**

අංජනා කීවේ දුකෙනි.

**"මේ දවස් ටිකේ මට හරියට අප්පච්චි මතක් වුණා. දානෙ දීලා අපි ඉක්මනට එකතැනකට වෙමු පුතේ... මං හිත හයිය කරන් හිටියට මට වෙලාවකට මේ ජීවිතේ හරි බරයි... මේ දරුවො කසාද බඳිනකල්වත් නොඉඳ මට මෙච්චර ලොකු වගකීමක් දීලා එයා ඉක්මනට ගියේ ඇයි කියලා හැමදාම මං නිදාගන්න කලින් අහනවා..."**

වත්සලා ඇල්ලේපොල කතා කරන්නේ හිතේ කිසියම් කරදරයකින් කියා අංජනාට තේරුම් ගියේය. වෙනදා මොන තනියක් බරක් හිතට දැනුණත් අම්මා එය ඇඟවූයේවත් නැත. මොකක් හෝ ලොකු දෙයකට අම්මාගේ හිත රිදී ඇති හැඩක් ඇයට දැනෙයි.

**"අම්මා... මොකද වුණේ...?"**

අංජනා ඇල්ලේපොලගේ ප්‍රශ්නය ළඟ වත්සලා මොහොතක් නිහඬවම සිටියාය.

**"අම්මා... කවුරුහරි මොනවත් කිව්වද?"**

ඇය නැවතත් ඇසුවේ ඒ නිහඬබව දරන්නට බැරිවය. අම්මා ඉන්නේ ප්‍රශ්නයක බව සිතෙද්දී ඇගේ දෙනෙත් තෙත් වුණේය.

**"ඔයා කොහෙද ඉන්නේ..?"**

**"මං එයත් එක්ක සාප්පුවට ආවා අම්මා."**

ඇඳුම් ගන්නට ආ බව නොකියා ඇය කීවාය. ඊළඟට ගෙදර යද්දී අම්මාටත් නංගීට හා මල්ලීටත් ඇඳුම ගාණේ ගෙන ගොස් දෙන්නට ඇයට මතක් වූයේ එවිටය. අප්පච්චිට ඇඳුම් ගන්නට තේරෙන්නේ නෑ කියා කට්ටියම රෙදි සාප්පුවකට එක්කාන ගොස් ගත්තාට පසු බලා සිට බිල ගෙවීම ඔහුගේ සිරිතය. අප්පච්චීට ඇඳුම් තෝරාගන්නේද අම්මා විසිනි.

**"දැන් ඔයා සාප්පුවෙනෙ ඉන්නේ... මං රෑ වෙලා ගන්නම්. මට බයක් නැතුව ඉන්නේ තේනුක පුතත් අප්පච්චි වගෙයි. ඔයාට හරි ආදරෙයි. ඒ ආදරේ කවදාවත් නැති කරගන්න එපා..."**

අම්මාගේ පසින් දුරකතනය විසන්ධි වූයෙන් එය යළි කුඩා අත්බෑගයට දමාගත් අංජනා තෙත් වූ දෑසින් ගලන්නට ඔන්න මෙන්න පොර කෑ කඳුළක් දබරැඟිල්ලෙන් පිසදැ ගනිද්දී මේනක ඒ දෙස බලා සිටියේ කුතුහලයෙනි. ඒ ඇමතුම අතරේ ඈ හැඬුවේ ඇයිදැයි දැනගන්නට ඇත්නම් කියා ඔහුට සිතුණි.

අංජනා ටීෂර්ට් දෙස බලමින් වටපිට බැලුවාය.

එහිම පසෙක කොට කලිසම්ද තිබුණේය. ඈ අලුත් මෝස්තරේ ටීෂර්ට් දෙකක්ම වැඩිය තෝරන්නට නොයාම ගත්තේය. ඒ පාට තේනුකට ලස්සනට තියෙයි කියා ඇයට සිතුණි. ඒ දෙකට හරි යන්නට තරුණයන් අඳින අලුත්ම වර්ගයෙන් දණහිසට තරම් දිග කොට කලිසම් දෙකක්ද ඈ තෝරා ගනිද්දී අහේතුකව මේනකගේ හිත රිදුණේය. ඒ ඇය ඒවා ගන්නට ඇත්තේ ඇගේ පෙම්වතා වෙනුවෙන් කියා හිත කියද්දී ඒ හිතම ආයේ කිව්වේ සමහරවිට සහෝදරයෙකුට වන්නට ඇති බවයි.

ඇය ඇඳුම් වැටවල් පසුකර යද්දී ඔහුද මුවාවෙවී ඇය පස්සෙන් ගියේය. එක්වරම මේනකගේ දුරකතනය නාද වුණේය. ඔහු සැනින් ඇමතුම ගත්තේ ඒ සද්දයට ඇය පසුපස බලයි කියාය. ඇමතුම අම්මාගෙනි.

**"ලොකු පුතා කොහෙද ඉන්නේ..?"**

අම්මාගේ හඬ සන්සුන්ය. ඒත් ඇගේ ප්‍රශ්නය ඔහුව කලබල කළේය.

**"මං කොළඹ ඉන්නෙ අම්මා... ඇයි..?"**

**"බලන්න ළඟ පර්ස් එක තියෙනවද කියලා?"**

බලන්න කලින් ඔහුට පර්ස් එක මතක් වුණේය. එය උදේ මේසය මත තිබ්බා ඔහුට මතකය. උදේ යන්නට සූදානම් වී කලබලයෙන් ගෙදරින් පිටවූවා මිස එය නොගත් බවත් ඔහුට මතක් වුණේය.

**"අම්මා ඒක මේසෙ උඩ. මට ගන්න අමතක වුණා."**

**"ඒක තමයි කොහෙටහරි ගිහින් සල්ලි දෙන්න පර්ස් අදියි කියලා තමයි මතක් කළේ."**

මේනක අම්මාට සිතින් පින් දුන්නේ තව මොහොතකින් වෙන්නට තිබූ අපහසුතාවයෙන් තමන් මුදාගත්තාටය. ඔහු අත තිබූ ගීත්මාට දෙන්නට තෝරාගත් අත්බෑගයද හෙමිහිට ඇඳුම් වැටක එල්ලුවේය. ඒ වනවිට අංජනා මුදල් ගෙවීම් කවුන්ටරයට ගොස් සිටියාය. පහලට ගොස් වාහනය ගෙනැවිත් පාරෙන් තබාගන්නවාද කියා ඔහු සිතුවත් ඊට කාලයක් නැති බව හැඟුනේ ඒ වනවිටත් අංජනා ඇඳුම්වලට මුදල් ගෙවමින් සිටි නිසාය. ඔහු ඇයට කලින් එළියට ගොස් ඈ සාප්පුවෙන් පිටවන තුරු බලා සිටියේ ඇය වාහනයක කවුරුන් හා ආවානම් වාහන නැවතුම්පොළට යනු ඇති බව සිතමිනි.

සාප්පුවෙන් එළියට ආ අංජනා නාදවන දුරකතනය දෙස බැලුවාය. කතා කරන්නේ තේනුක තෙන්නකෝන් ය. ඔහු කීවේ ඇඳුම් අරගත්තාට පසු එක්ක යන්නට එන්නම් කියාය. එක්කෝ ඔහු ඇවිත්ය. නැත්නම් කතා කරන්නේ ඇඳුම් අරන් ඉවර දැයි අසන්නට බව දන්නා අංජනා ඇමතුම ගෙන දුරකතනය කන තබාගත්තේ සාප්පුවේ පඩිපෙළ බැස පාරට එමිනි.

ලබන සතියට

# අපේ ගෙවත්තේ එළවලු වවන්නේ කෑමට නෙවෙයි

**"අපි ගෙවත්තෙන් ගන්න පලදාව කෑමට ගන්නේ නැහැ. ඒවා බීජ වෙනුවෙන්ම වෙන් කරලයි තියෙන්නේ."**

තම ගෙවත්තේ පලදාව, තවත් ගෙවත්තක සිනා මලක් වෙනුවෙන් වෙන් කරන්නට කැපවෙන පිරිස් අතරේ ගාල්ල වංචාවල, බඩරගොඩ පදිංචි ප්‍රියන්ත කුමාර මහතා විශේෂය.

හරියටම කිවහොත්, මීට අවුරුදු දෙකකට පමණ පෙර උදාවුණේ වගාවට ලැදි පිරිස් වැඩි වැඩියෙන් කළුවිළි බහින්නට වූ සමයයි. කොරෝනා කාලයේ ආහාර හිඟයක් ගැන සැවොම කතා කරන්නට පටන්ගැනීමත් සමඟ බොහෝදෙනා වගාවට යොමුවිය. ඒ කාලයේ එළියට පහලියට බහින එකටත් තහංචි වැටී තිබූ නිසා ගෙවතු වගාවට වැඩි ඉඩක් වෙන් කරන්නට බොහෝ දෙනෙකුට කාලය තිබිණි.

**"ඒ කාලේ තමයි අපිත් වගාවක් කරන්න හිතුවේ. මහත්තයයි, මමයි, දරුවෝ දෙන්නයි, තාත්තා, අම්මා මේ හැමෝම එකතුවෙලා තමයි වගාව ආරම්භ කළේ. ගේත් එක්ක අපේ මුළු ඉඩම පර්චස් දොළහක් වගේ තියෙනවා. ඒ තියෙන ඉඩේ බණ්ඩක්කා, මෑ, වම්බටු, රතුපෙති දඹල ඇතුළු දඹල වර්ග, නියං වැටකොළු, මිරිස් වර්ග, කොච්චි වගේ දේවල් හිටෙව්වා. මේ ලැබෙන අස්වැන්න ගෙදර පරිභෝජනය වෙනුවෙන් වෙන් නොකර 'ගෙවතු වගාවයි ඔබයි' සමූහයේ බීජ අවශ්‍යතා වෙනුවෙන් වෙන් කරමු කියලා මීට අවුරුද්දකට කලින් මහත්තයා කියද්දි මමත් ඒකට කැමති වුණා.**





**ඉතින් එදා ඉඳන් අද දක්වාම ඒ කටයුතු කරගෙන යනවා. අපිට උයන්න අවශ්‍ය එළවලු ගන්නේ ගෙදර කොරටුවෙන්. ඒ කොරටුව ඉස්සර ඉඳන්ම කරන්නේ මහත්තයගේ තාත්තා. මහත්තයත් ඒ වැඩවලට උදව් කරනවා."**

ඒ 'ගෙවතු වගාවයි ඔබයි' සමූහයේ ප්‍රධාන සම්බන්ධීකාරක, ප්‍රියන්ත කුමාර මහතාගේ ආදරණීය බිරිඳ ඉෂාරා දිල්රුක්ෂි විජේනායකයි. දහතුන් හැවිරිදි දහරා සනුති දියණියත්, වයස අවුරුදු තුනහමාරක් වන යුවෙන් රිත්මික පුංචි පුතණුවනුත් දැනටම වගා කටයුතුවලට සහයෝගය දෙන්නේ, ඒ පුංචි හිත්වලටද වගාවේ වටිනාකම් තේරුම් ගියාක් මෙනි.

"අපි දෙන්නා වගාවට සාත්තු කරද්දි දරුවෝ දෙන්නත්, අපි එක්ක ඒ වැඩවලට උදව් වෙනවා. වගා මලුවලට පස් පුරවන එක, වතුර දන එක අක්කයි මල්ලියි තරඟෙට වගේ කරන්නේ. ඉතින් ගෙවත්තක හිටවන්න පතෝල, දඹල, බණ්ඩක්කා වගේ ගුණ ආහාර ගැන අපි එයාලටත් කියලා දෙනවා.



**අපේ ගෙට පහලින් තියෙන්නේ වෙල්යායක්. ඒ වෙල්යාය ආසන්නයේ තමයි ගෙදර කොරටුව තියෙන්නේ. ඒ කොරටුවේ මුකුණුවැන්න, ගොටුකොළ, නිවිති, සාරණ වගේ කොළ වර්ග වගා කරලා තියෙනවා. කෑමට ගන්න අනිත් එළවලු වර්ග බොහොමයකුත් මේ කොරටුවේ තියෙනවා. ගෙදර කෑමට අරන් කොරටුවෙන් ගන්න එළවලු කඩේටත් දානවා. අපි වගාවට දාන්නේ කාබනික පොහොර විතරයි."**

**අද වෙද්දි අපේ සමූහයේ සාමාජිකයින් එක්ලක්ෂ තිස්දහස ඉක්මවා ඉන්නවා**

එම පොහොර වර්ග ඔවුන් තනාගන්නේ ගිනිසීරියා කොළ, ගොම හා පල්වෙන්නට දැමීමෙනි. පාසල් කාලයේ ගෙවතු වගාවට හිත නොගියද උපන්ගම වන දෙණියායේදී වගාවේ ලස්සන දසුන් ඈ නෙත ගැටී තිබිණි.

"තේ තමයි දෙණියායේ නම් වැඩිපුරම තියෙන්නේ. ඒත් අපිට වී ගොවිතැන් තිබුණා. එළවලු, පලතුරු වගා කරන අත්දැකීමනම් ලැබුණේ විවාහ වෙලා ගාල්ලේ පදිංචියට ආවට පස්සෙයි. ඒ අත්දැකීම හිතට පුදුමාකාර සහනයක් ගෙනෙන කාරණයක්. උදේ නැගිට්ටම, එළවලු පාත්තියක මලක් පිපිලා තිබුණාම දැනෙන සතුට දවසම අපිව සතුටින් තියනවා. ඒ වගේම හදිස්සියේ ඔය කැරට්, බීට් වගේ එළවලුවක් තමයි අපි කඩෙන් ගන්නේ. මේ හැමදේම මැද්දේ මහත්තයා එයාගේ ෆේස්බුක්

**කොරෝනා කාලේ බීජ බෙදද්දි සමහරු බය වුණා**



සමූහය හරහා ගෙවතු වගාවට උනන්දු අය වෙනුවෙන් කරන කැපවීම මම දවස තිස්සේ දකිනවා."

ඇය එසේ කියද්දී එද එම සමූහය ගෙවතු වගාවට හිතැති දෙතුන් දෙනෙකු සමඟ එක්ව ආරම්භ කළ අයුරු ඔහු සිහිපත් කළේ මෙලෙසිනි.

**"සමාජ මාධ්‍ය භාවිතා කරලා හොඳ දෙයක් කරන්න ඕන කියලා මීට අවුරුදු දෙකකට විතර කලින් තමයි මගේ හිතට ආවේ. ඔය කාලේ අහඹු විදියට දවසක් මම දැක්කා බීජ වර්ග මුදලට ලබාදෙනවා කියලා තිබුණු පෝස්ට් එකක්. මට හිතුණා මුදල් අය නොකර, නොමිලේ බීජ වර්ග ලබාදෙන්න පුළුවන්නම් හොඳයි නේද කියලා. ඒ අරමුණින් 2020 ජූලි මාසේ පටන්ගත්තු ෆේස්බුක් ගෲප් එක තමයි 'ගෙවතු වගාවයි ඔබයි' කියන්නේ. ඇත්තටම මේ සමූහය ආරම්භ කරද්දි ගෙවතු වගාව ගැන ලොකු දැනුමක් මට තිබුණේ නැහැ. හැබැයි ගෙවතු වගාව කරන්න හිතෙන කෙනෙකුට පලදායී විදියට උදව් කරන්න ඕනෑ කියන හැඟීම මගේ හිතේ තිබුණා. ඒ නිසාමදෝ සමූහය වටා සෑහෙන පිරිසක් එක්වෙන්න ගත්තා.**

ඒ වගේම පහුගිය කොරෝනා කාලේ ගොඩක් අය තමන්ගේ ළඟම ඉන්න කෙනෙක් අල්ලන දෙයක්වත් අල්ලන්න බයවුණා. ඒත් ඒ අවධානමත් අරගෙන අපි මේ සමූහය හරහා රට පුරාම නොමිලේ බීජ බෙදන්න කටයුතු කළා. ඒ කාලේ ගොඩදෙනෙක් ගෙදරට ඇවිල්ලත් බීජ අරන් ගියා. එතකොට මිනිස්සු මට කිව්වා මේ තරම් ලොකු ලෙඩක් පැතිරෙද්දි ඔය බීජ බෙදිල්ල නතර කරන්න කියලා. හැබැයි මට හිතුණේ ඒකේ අනෙක් පැත්ත. මේ වෙලාවේ තමයි මිනිස්සුන්ට උදව්වක් කරන්න ඕන කියලා මගේ හිත කිව්වා. සමූහයට සාමාජිකයෝ පනස්දහක් වෙනකල් එයාලට අවශ්‍ය බීජ ලබාදෙන්න මට පුළුවන් වුණා."

ඒ තනිවම නොව ඔහුගේ ආදරණීය බිරිඳ ඇතුළු පවුලේ සාමාජිකයින්ගේ සහායෙනි. ඇතැම් දිනවල ඔවුන් නින්දට ගියේ මධ්‍යම රාත්‍රියද පසුවීය. භෝග වර්ග සිටවද්දිත් ඉන් පසුවත් මතුවන ගැටලුවලට පිළිතුරු සොයන්නටද සිදුවූයෙන් ප්‍රියන්ත මහතාට ඒ ආශ්‍රිත පතපොත ඇසුරු කරන්නටද සිදුවිය.

**"ඇත්තටම පතපොත පරිශීලනය කරලා වගා ක්‍රම ගැන දැනුම ලබාගත්තා වගේම ප්‍රායෝගිකව ඒවා සාර්ථකද කියලා බලන්නත් මට ඕන වුණා. ඒ අනුව ගෙවත්තේ වගා කරන්න පටන්ගත්තා. ඒ පලදාව අපි සම්පූර්ණයෙන්ම යොදවන්නේ බීජ නිෂ්පාදනය වෙනුවෙන්. සමූහයේ සාමාජිකයින් අතරත් බීජ හුවමාරු වැඩසටහන් තියෙනවා. මුලදි අපි බීජ වර්ග බෙදාදීම සිදුකළේ සාමාජිකයින් අතර පමණක් වුනත්, මේ වෙනකොට එය පාසල්, පෙරපාසල්, විහාරස්ථාන සහ වෙනත් ආගමික ස්ථාන දක්වා ගෙන යන්න කටයුතු කර තිබෙනවා."**

එපමණක් ද නොවේ. ගාල්ල හා අම්බලන්ගොඩ ප්‍රදේශ ආවරණය වන පරිදි බීජ වර්ග නොමිලේ බෙදාදීමේ කටයුතුවලට ඔවුන් දායක වී තිබේ. එහිදී මතකයෙන් ඈතට ගොස් තිබුණු ඇතැම් දේශීය බීජ වර්ගවලට යළි පණ දෙන්නට හැකිවීම ගැනද ඇත්තේ සතුටකි.

**"ඉතින් අද වෙද්දි අපේ සමූහයේ සාමාජිකයින් එක්ලක්ෂ තිස්දහස ඉක්මවා ඉන්නවා. ඒ අයට අවශ්‍ය බීජ, දැනුම වගේම මග පෙන්වීම කරන කාර්ය මණ්ඩලයකුත් අපිට ඉන්නවා."**

ඔහු මේ සියලු කටයුතුවලට දායකත්වය දෙන්නේ කතලුව ජාතික පාසලේ පුස්තකාල සේවා සහායක තනතුරේද වගකීම් දරමිනි.

ඒ කුමන වගකීම් අතරේ වුවත් ඔබේ දෑතින් හැඩවෙන ගෙවත්තකට අවශ්‍ය උපදෙස් ලබාදෙන්නටත්, ගෙවතු වගාවේ අගය රට පුරා ගෙනයමින් බොහෝදෙනෙකු දිරිමත් කරන්නටත් ඔහු හෙට දවසේත් සූදානම්ය.

**දීපා වසන්ති එදිරිසිංහ**



# නෝනලා 39ක් එක්ක දීග කෑ චානා



**"මගේ පවුල තවත් ලොකු කරගන්න මං කැමතියි. මට වගකීම් ගොඩාක් දරන්න තියෙනවා. එහෙමයි කියලා කිසිම වෙලාවක මං බිරින්දෑවරුන්ගේත්, දරුවන්ගේත්, මුණුපුරු මිණිපිරියන්ගේත් ඕනෑ එපාකම් පැහැර හරින්නේ නෑ. කවදාවත්ම වගකීම්වලින් පැනලා ගිහිල්ලත් නෑ. ඇත්තටම මට හිතෙනවා මං හරි වාසනාවන්ත මනුස්සයෙක් කියලා."**

මේ මීට ටික කාලෙකට කලින් 'සියෝනා චානා' කියන පුද්ගලයා ලෝක ප්‍රසිද්ධ 'රොයිටර්' පුවත් සේවය සමඟ කළ සාකච්ඡාවකදි කියපු කතාවක්. ඔහු තමයි ලෝකයේ තියන විශාලතම පවුලේ ප්‍රධානියා විදියට සැලකෙන්නේ. පසුගිය දවසක මේ පුද්ගලයා මෙලොවින් සමුගත්තා. නමුත් ඔහුගේ කතාවටනම් එහෙම ලේසියෙන් මියැදෙන්න බෑ.

**"මගේ ගෙදර එක් වේලකට සහල් කිලෝ 25ක් උයනවා. අල කිලෝ 40ක් වගේම හතු කිලෝ 5ක් උයනවා. ඇයි ඉතින් දෙසීයකට කිට්ටු පිරිසක් ඒ ගෙදර දැනට ඉන්නවනේ..."**

චානාගේ කතාව ඇත්ත. ඔහුගේ 'පර්පල් පැලස්' නමින් හඳුන්වන මහල් නිවාසයේ එක්වේලක් උයන්න ලංකා මුදලින් රුපියල් 30,000ක් පමණ යන බවයි සඳහන් වෙන්නේ.

**එක් වේලකට ගෙදර සහල් කිලෝ 25ක්, අල කිලෝ 40ක් වගේම හතු කිලෝ 5ක් උයනවා**

**දරුවන් 89යි මුණුපුරු මිණිපිරියන් 36යි**

ලොව විශාලතම පවුලේ ප්‍රධානියා ලෙස සැලකෙන චානා ඉපදිලා තියෙන්නේ ඉන්දියාවේ. වයස අවුරුදු 79දී ඔහු මියයද්දි ඔහු විවාහ වී සිටි බිරින්දෑවරුන් ගණන 39ක්. තම පවුල විශාල කිරීමේ අරමුණෙන් ඔහු වරින් වර විවාහ සිදුකරගෙන ඇති අතර එක් අවස්ථාවකදී ඔහු වසරක් තුළ කාන්තාවන් 10ක් විවාහකර ගත් බව සඳහන්.



ඔහු තමන්ගේ පළමු විවාහය සිදුකරගෙන ඇත්තේ වයස අවුරුදු 17දී. එතකොට 39 වැනි විවාහය සිදුකරගෙන ඇත්තේ 2004 වසරෙදි. ඒ 25 හැවිරිදි සුරූපී තරුණියක්ව. දෙසීයකට කිට්ටු ඔහුගේ පවුලේ සාමාජිකයින්ගෙන් බිරින්දෑවරුන් හැරුණුවිට අනෙක් සියල්ලෝම චානාගේ දරුවන් සහ දරු මුණුපුරන්. දරුවන් 89ක් වගේම මුණුපුරු මිණිපිරියන් 36ක් හැටියටයි පවුලේ සාමාජිකයින් ගණන සැලකෙන්නේ.

සිය පවුලේ සාමාජිකයන් වැඩිවීමත් එක්ක චානාට දැවැන්ත මහල් නිවාසයක් ඉදිකරන්නත් සිද්ධවුණා. ඔහු එය ඉදිකළේ ඊසානදිග ඉන්දියාවේ මිසෝරාම් ප්‍රදේශයේ. ඔහුගේ පියා සතුව පැවති දේපළ භාවිත කරමින් ඉදිකළ එහි කාමර 100ක් ඇති බවයි සඳහන්. චානා අද ජීවතුන් අතර නොසිටියත් ඔහුගේ නිවාසයට අදටත් සංචාරක ආකර්ෂණය නොඅඩුව හිමිවෙන බව නම් රහසක් නෙවෙයි.

ඉන්දියාව බහු විවාහ අනුමත නොකරන රටක් වුණත් සියෝනා චානාට ඒ අවස්ථාව ලැබුණේ ඔහුගේ නිකාය නිසා. ඉන්දීය මාධ්‍ය සඳහන් කරන ආකාරයට ඔහු 'මොමොන්' නමින් හඳුන්වන ක්‍රිස්තියානි නිකායට අයත් පුද්ගලයෙක්. ඒ නිකාය බහු විවාහ අනුමත කරන නිකායක්වීම නිසයි චානාට බිරින්දෑවරු 39ක් එක්ක දීගකන්න ලැබුණේ. කෙසේ වුවත් අධිරුධිර පීඩනයෙන් සහ දියවැඩියාවෙන් දිගින් දිගටම පීඩා විඳි චානා මියයන විට ඔහුගේ පවුලේ සමස්ත සාමාජිකයින් ගණන 164ක්.

**"චානා තමන්ගේ බිරින්දෑවරුන් එක්ක හරි සතුටින් එකමුතුවෙන් හිටියා. එච්චර බිරින්දෑවරු ගොඩාක් එක්ක හිටියේ කොහොමද කියන එකත් ප්‍රශ්නයක්. හැබැයි කොහොම හරි චානා ඒක කළා."**

සියෝනා චානා මියගියාට පස්සේ ඉන්දීය මාධ්‍ය කිව්වේ එහෙම කතාවක්. ඒ විතරක් නෙවෙයි ඔහුගේ මරණයෙන් පස්සේ ඉන්දියාවේ ප්‍රසිද්ධ චරිත පවා ඔහුව අගයන්න කටයුතු කරලා තිබුණා.

**රැවන් එස්. සෙනවිරත්න**

**රු. 35000/- කට වැඩි ආදායමක්**

විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.

- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.

070-6128955



කලාත්මක හැකියාවන් ඇති තරුණ දැරියන් සොයයි.

වයස 20 - 30, O/L සමත් විය යුතුය.

සේවා ස්ථානය - කොළඹ 03/කොළඹ 08

Kent

0712735078

**මූල්‍ය බැංකු ඇබෑර්තු**

★ කුඩා හා මධ්‍ය පරිමාණ බැංකු ශාඛා සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)

0712 564 715 | 0774 024 155
0702 725 731 | 0715 947 191
0703 346 072 | 0761 125 624

**සංයෝගා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය**

විශේෂ ප්‍රතිකාර
- සුෂුම්නා හා කශේරුකා ආබාධ
- ග්‍රීව කශේරුකා ආබාධ
- ආම වාතය
- අංශභාගය
- අවබාහු
- සන්ධිගත වාත රෝග
- අම්ල පිත්තය සහ සර්වාංග රෝග
- සිහිමද ගතිය (Coma)
- පාකින්සන් (Parkinsons)
- ශීර්ෂ රෝග

Special treatments for
- Spine Injures & Slip disc
- Spondylosis
- Arthritis
- Paralysis
- Frozen Shoulder
- Osteoarthritis
- Gastritis & for All Ailments
- Ceylona Care Ayurvedic Products



Reg: 12466

DA (SL),SNA (INDIA)
Panchakarma Special (Kerala)
AYU.Beauty Culture Special (India-Kerala)
BA(MC)/MA/B. Counselor

අධ්‍යාපන දැනුමෙන් හා පාරම්පරික දැනුමෙන් රෝග තත්වය නාඩි පරීක්ෂා කර හඳුනාගෙන නිසි ප්‍රතිකාර ලබා ගැනීමට රණවිරු සෙවන (රාගම) ආයු.වෛද්‍ය නිලධාරිනි විද්‍යාරත්න පණ්ඩිත, දේශීය වෛද්‍ය නිපුණ, කීර්ති ශ්‍රී ලංකාභිමානී, දේශශක්ති වෛද්‍ය ශිරෝමණී

**Dr. L.D. Anoma Damayanthi Soloman**

Fb : facebook.com/solomanamc
Email : dranoma@live.com

To Get Appointments
Hot Line : 0774277110 / 0775039269

**උකස් රන් භාණ්ඩ**
**බේරාදී වැඩිම මිලට**
**මිලදී ගනු ලැබේ.**
**කැරට් 20, 18,14, 09.**
රජයේ ලියාපදිංචි ආයතනයකි.
**074 375 10 20**

# දැන්වීම් සඳහා අමතන්න
# 0112 672 601, 0112 672 603

## අධ්‍යාපන

**English for all** ඉංග්‍රීසි ග්‍රන්ථය

ඇතුළු ග්‍රන්ථ රාශියක් ලියූ ප්‍රවීන දේශකයා හා ජනප්‍රිය මාධ්‍යවේදියා මෙහෙයවන Visiting English Classes
වැඩිහිටි / පාසල් සිසුන්/ උසස් අධ්‍යාපන හදාරණ සැමට

- නිවසට/ කාර්යාලයට/ නවාතැනට/ පැමිණ උගන්වයි.
- සතිය තුළ/ සති අන්ත/ රාත්‍රී පංති (නවාතැන් පහසුකම් ඇති ස්ථානවල)
- භාෂා දැනුම දියුණු කර ගනිමින් කථා කිරීමේ හැකියාව (Spoken English) ස්ථිරව වර්ධනය කරයි ඒ සඳහා ප්‍රායෝගික ක්‍රම වේද භාවිතා කරයි.
- On Line ක්‍රම වේද ඉංග්‍රීසි ඉගෙනීමට සුදුසු මාධ්‍ය නොවේ.
- English for all ග්‍රන්ථය රාජ්‍ය සම්මාන දිනූ මරදානේ එස්. ගොඩගේ සමාගම මඟින් මිලදී ගත හැක.
- Group Classes සංවිධානය කළ හැකි අයට 25% ක් කොමිස් මුදල් අවම සිසුන් 10-20

**ධර්මසේන ඔරුතොට**
**0777-507672**



**පුහුණුවෙන් පසු රැකියාගත කිරීම සඳහා නවක හෙද සිසුවියන් බඳවා ගැනේ.**

හෙද වෘත්තියට ඇලුම් කරන අ.පො.ස. සා/පෙළ පෙනී සිටි තරුණ ඔබට අප ආයතනයේ පුහුණුවෙන් පසු රැකියා අවස්ථා සඳහා යොමු කෙරේ.

**25%** පාඨමාලා ගාස්තු අඩුවෙන්

නවක බඳවා ගැනීම් සඳහා අයඳුම් කිරීමට NT ලෙස Type කර 0775230017 ට ඔබගේ නම සහ ලිපිනය SMS කරන්න.

නේවාසික පහසුකම් සහිතයි (Online ලියාපදිංචි විය හැක)

**EMIT CAMPUS** කුරුණෑගල | හලාවත | දඹුල්ල | මීගමුව

**දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.**

ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්, දරුවන් බලාගැනීමට හා මහළු හෝ රෝගී වූ අය බලාගැනීමට කැමති අය අමතන්න.



වැටුප රුපියල් **35,000 - 40,000**

ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ

**072 945 9247**

# රත්තරං

**සින්න වෙන්න දෙන්න එපා**
ඕනෑම තැනකට පැමිණ මිලදී ගනු ලැබේ.
**රු 250 000**
හදිසියකට මුදල් ලබාගත හැකිය (ණයක්)
**D.P Gem & Jewllery**
**076 5746042**
රජයේ ලියාපදිංචි සහතිකලත් සිංහල ව්‍යාපාරිකයකි

## ඉසුරු ගෝල්ඩ් හවුස්

උකස් කර ඇති ඔබේ වටිනා
රන්භාණ්ඩ උකසින් බේරා
වෙළඳපොල වටිනාකම
එවලේම ලබාදෙන ලංකාවේ
එකම ලියාපදිංචි ආයතනය
(දිවයින පුරා සේවය)

**077 404 5093 - ඉසුරු**

අපගේ සේවය

**වැඩිහිටියන් සහ රෝගීන්ට උපස්ථාන කිරීම**

නේවාසික පහසුකම් සහිතව සියලු උපස්ථාන සේවය පැය 24 පුරාම නිට්ටඹුව නගරයේ දී සාධාරණ මිල ගණන්...



(පළපුරුදු සේවකයින් බඳවා ගනු ලැබේ.)

**077 0311736**

**මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්**
**විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.**
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

**ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?**
**ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?**
**අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?**

# මෙන්න!

එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම

* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට

*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

**ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යයකට**
**ඇබ්බැහි වූ අයෙක් ද?**
**එසේ නම් ඉන් මිදීමට අමතන්න.**
**වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න**
**අමතන්න 077 362 77 14**

**හමුවීම**
**බදාදා, සෙනසුරාදා**
**පෙ.ව. 8.00 සිට**
**ප.ව. 3.00 දක්වා**

**කුරුණෑගල, පොතුහැර වන්දුසේල පිරිවෙන් පුරාණ විහාරයේදී**

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, වන්දුසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර වන්දුසේල පිරිවෙන් පුරාණ විහාරයේදී



## පාඩම් අංක 42

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

ස්වයං රැකියා

# පුංචි ළිඳේ වතුරෙන් වයින්





**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**

හොඳවැයින් වයින් එකක් හදලා ගොඩයන විදියක් ගැනයි මේ කතාව.

පෘතුගීසි කොළොම්තොටට ගොඩබැස්සේ 1505 නොවැම්බර් 15 වැනිදා. ඔය කාලේ ලංකාවේ රජකම් කළේ අටවැනි වීර පරාක්‍රමබාහු රජතුමා. ඉතින් මේ අමුතු පිරිස දැකපු රාජපුරුෂයෝ කොළොම්තොටට තිරිවානා ගල් හප හපා ලේ බොන පිරිසක් ඇවිල්ලය කියලා රජතුමාට ගිහින් කිව්වලු. ඔවුන් එදා ඒ කිව්වේ වයින් ගැනයි.

වයින් කියන්නේ ලෝකේ පරණම පානයක්. අවුරුදු 6000කට කලින් හිටි මිනිස්සුත් වයින් බීව් බවට සාක්ෂි තියෙනවා. ඒ කාලේ වයින් කර්මාන්තශාලා පවා තිබ්බලු.

වයින් ගැන කතා කරද්දි තව කතාවක් මතක් වුණා. ඔන්න දවසක් ජේසුතුමාට විවාහ මංගල්‍යයකට ආරාධනාවක් ලැබුණාලු. ජයටම පැවැත්තුණු මංගල්ලෙට මහවිශාල සෙනඟක් සහභාගී වෙලා.

ටික වෙලාවක් යනකොට මඟුල් ගෙදර සංග්‍රහයට ගෙනාපු වයින් ඉවර වෙලා. ජුදෙව් ජාතිකයන්ගේ ප්‍රධානම පානය තමයි වයින්. ඉතින් මඟුල් ගෙදරක වයින් ඉවර වෙනවා කියන්නේ මුළු ජීවිත කාලෙම අවමන් විඳින්න වෙන තරමේ බරපතළ සන්තෑසියක්ලු. ඉතින් මොකද කරන්නේ කියලා මනමාලිගේ තාත්තා බිත්තියේ හිස තියාගෙන කල්පනා කළාලු.

ජේසුතුමා මේක දැක්කා. පවිත්‍රවීමේ පිළිවෙත්වලට ගෙනාපු වතුර ලීටර 100ක් අල්ලන භාජන හයක් මඟුල් ගෙදර තිබුණාලු.

**"මේ භාජනවලට වතුර පුරවන්න."**

ඔන්න ඒ පාර සේවකයෝ භාජනවලට වතුර පිරෙව්වා. පස්සේ ජේසුතුමා ප්‍රාතිහාර්යය පාලා වතුර වයින් බවට පත්කළාලු.

ඒ කාලෙ විතරක් නෙමේ වයින් කියන්නේ අදටත් ලෝකේ ප්‍රසිද්ධම පානයක්. මත්පැන් ගණයට වැටුණත් මදුවිත කටේ තියන්නේ නැති උදවිය පවා භාවිතේට ගන්න අහිංසක මත්පැන් වර්ගයක් විදියට තමයි වයින් සලකන්නේ.

ලෝකයේ හැම රටක්ම පාහේ තමන්ගේ රටවලට ආවේණික දේශීය පලතුරුවලින් වයින් හදනවා. ලොවි, රඹුටන්, වරකා වගේ පලතුරුවලින් ව්‍යාපාරික වශයෙන් වයින් නිෂ්පාදනය කරන උදවිය අපේ රටෙත් ඉන්නවා.



ඒත් අද අපි කියලා දෙන්නේ තැඹිලි වයින් හදන හැටි. බොන්න විතරක් නෙමෙයි වෙඩින් කේක්, පුඩින් වර්ගවලට වගේම සමහර කෑමවලටත් තැඹිලි වයින් යොදගන්නවා. උත්සව අවස්ථා සඳහාත් භාවිතා කරනවා. ඒ නිසා තැඹිලි වයින්වලට හොඳ ඉල්ලුමකුත් තියෙනවා.

වයින් කියන්නේ මධ්‍යසාර පානයක් නිසා ස්වයං රැකියාවක් විදියට වයින් හදනවා නම් සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා බලපත්‍ර ලබාගන්න ඕනේ කියන එක මතක් කරන්න ඕනේ.

මුලින්ම අපි තැඹිලි ලීටර 2යි 500mlකින් වයින් හදමු. වයින් හදන්න තැඹිලි ගන්නකොට තැඹිලි වල්ලේ එක ගෙඩියක් කපලා බීලා බලන්න. හොඳ පැණි රහට තියෙන තැඹිලි තමා වැඩේට හොඳ. තැඹිලිවලට අමතරව සීනි 1kg 125g, යීස්ට් තේ හැඳි 2යි, කරදමුංගු කරාබුනැටි 6 බැගින්, කුරුඳු පොත්තක්, දෙහි ගෙඩි දෙකක යුෂ, මඳ රස්නේ වතුර කෝප්ප 1/4ක් අවශ්‍යයි. ඒ වගේම ලොකු වීදුරු බෝතලයක්, උණුවතුරෙන් තම්බාගත්තු පුනීලයක්, පිරිසුදු කපු රෙදිකඩක්, ලෙවල් බටයක් එහෙමත් අවශ්‍යයි.

මේ හැම පියවරකදිම පිරිසුදුකම ආරක්ෂාව ගැන හිතන්න. ඒ වගේම කියන්න ඕනේ කල්යද්දි වයින් එකේ සැර වැඩිවෙනවා. ඒ නිසා අවුරුද්දක් පරණ වයින් එකකට වඩා අවුරුදු දෙකක් පරණ වයින් එකක ගාණ වැඩියි. පරණ නැති වයින් එකක් 1500-2000 වගේ මිලකට අලෙවි කරන්න පුළුවන්. කල්යද්දි ගණන් වැඩි කරන්න පුළුවන්. වයින් හදන හැටි ගැන තව විස්තර දැනගන්න ඕනේ නම් 0714766819 වෙනදා වගේම මේ අංකයට කතා කරන්න.



### පියවර 1

උණුවතුර කෝප්ප 1/4ට, යීස්ට් තේ හැඳි 2යි, සීනි තේ හැඳි 2යි එකතු කරලා පිපෙන්න තියන්න.

හොඳට පෙරාගත්තු තැඹිලිවලට සීනි 1kgයි, තලාගත්තු කරදමුංගු, කරාබුනැටි, කුරුඳුපොතු, දෙහි සහ හදාගත්තු යීස්ට් මිශ්‍රණය එකතු කරන්න.



### පියවර 2

හදාගත්තු තැඹිලි මිශ්‍රණය රෙදි කඩකින් වහලා තියන්න. බෝතල් මූඩියෙන්ම වහනවා නම් මූඩිය තදින් වහන්න එපා. පැසීමේ ක්‍රියාවලියෙදි පීඩනය වැඩිවෙලා බෝතලය පුපුරන්න පුළුවන්.

වහලා තිබ්බ මිශ්‍රණය දවස ගාණේ දවස් තුනක් යන්තමින් හැඳිගාන්න. පස්සේ සතියක් නොසොල්වා තියන්න. එතකොට මණ්ඩි ටික අඩියට බැහැලා පැහැදිලි ද්‍රාවණයක් ලැබෙනවා.



### පියවර 3

සතියකට පස්සේ මණ්ඩි කලවම් නොවෙන්න අර පැහැදිලි ද්‍රාවණය වෙන් කරගන්න. ඒ වැඩේට ලෙවල් බටය යොදාගන්න පුළුවන්. බටය නැතිව පෙරාගත්තත් කමක් නැහැ. හැබැයි සීරුවට.

ඉතිරි සීනි 125g ලිපේ තියලා සීනි කැරමල් හදාගන්න. 750ml වීදුරු බොතල් තුනක් අරගෙන කැරමල් ටික පංගු තුනට බෙදලා බෝතල්වලට දාන්න. පස්සේ පෙරගත්තු මිශ්‍රණය බෝතල්වලට දාලා මූඩිය වහලා සොලවන්න. වයින් ලෑස්තියි.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.